# නියමුවා

ISSN 1391 - 1031 | 2021 සැප්තැම්බර් - විද්‍යුත් මුද්‍රණය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

*"එබඳු අලුත්, දුෂ්කර සහ ශ්‍රේෂ්ඨ කටයුත්තකදී අඩුපාඩුකම්, දුර්වලකම්, වැරදීම් සිදුවීම වැළැක්විය හැකි නොවේ. සමාජවාදය ගොඩනැගීමේ දුෂ්කරතාවයන්ට බිය වන අය, ඒවායින් තමන් බිය වැදීමට ඉඩ තබන අය, බලාපොරොත්තු සුන් කර ගන්නා සහ බියගුළු ලෙස විමති වන අය, සමාජවාදීහු නොවෙති."*

*ලෙනින්*
*තෝරාගත් කෘති,*
*10වැනි වෙළුම,*
*129 පිටුව*


## 03
### රටම පීඩාවට...



වසර 40ක් පමණ තිස්සේ ණයට ගත්, විශේෂයෙන් 2005 කාලයේ සිට විදේශ වාණිජ බැංකුවලින් වැඩි පොලියට කෙටිකාලීනව ණයට ගත් ඩොලර් බිලියන දහස් ගණනක් වූ ණය කන්දරාවකට සිදුකළේ කුමක්ද? ඉන් කිසිදු නිෂ්පාදන මාර්ගයක් ආරම්භ කළේ නැත. ඉන් විශාල ප්‍රමාණයක් කොමිස් කුට්ටි ලෙස ආණ්ඩුවල නායකයෝ යටිමඩි ගසා ගත්තෝය. අවසානයේ දැන් ණය කන්දේ බර......

## 05
### කොවිඩ් නැති ජීවිතය...



මේ වනවිට යටත් පිරිසෙයින් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබා ගත් පිරිස ජනගහනයෙන් 58% වන නමුත් මාත්‍රා දෙකම සම්පූර්ණ කර ඇත්තේ ජනගහනයෙන් 20% ක් පමණකි. ජනගහනයෙන් 80% ක් අදටත් ප්‍රතිශක්තිකරණයට ලක්ව නැති බව....

## 07
### වසංගත ධනවාදය...



අන්දරෙ සීනි කෑවේ රජතුමා රවටන්නටය. අද රජතුමා සමග එකතුවී සිටින කපටි අන්දරේලා ජනතාව රවටා මංකොල්ලකෑමට සීනිවලින් ගසා කමින් සිටිති. වසංගතයේ හිරවී ලොක්ඩවුන් නිසා දෛනිකව ආදායමක් අහිමි වී ජනතාවට...

තරුණ .................................. 04
ජාත්‍යන්තර........................ 06
විශේෂාංග.......................... 08
වේදිකාව............................ 09
ඉතිරි.................................... 10


# ආණ්ඩුව මාෆියාව සතුටු කරනු වෙනුවට ජනතාවට සහන දිය යුතුයි



**වසංගත තත්වය තුළද ආණ්ඩුවේ විසින් තමන්ගේ ගජ මිතුරන්ට ජාවාරම් කිරීම සඳහා සියලු ඉඩකඩ නිර්මාණය කර දී ඇති බවත් ආණ්ඩුව තවදුරටත් ජනතාව වෙනුවෙන් කටයුතු නොකරන බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණ ජනතාව පිළිබඳ වගකීම අත් නොහැර භාණ්ඩ මිල පාලනය කර සහන ලබා දීමට කටයුතු කළ යුතුව ඇතැයි ආණ්ඩුවට බලකර සිටියේය.**

ජනතාව එදිනෙදා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාම දරාගැනීමට නොහැකි වී සිටින මොහොතක තමන්ගේ ගජමිතුරන් සතුටු කිරීම සඳහා ආණ්ඩුව විසින් ගෙන යන සූදුව ජනතාව විසින්ද තේරුම් ගත යුතුව ඇති බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණ ඊට එරෙහිව පෙළගැසෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 29වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද ඔන්ලයින් මාධ්‍ය සාකච්ඡාවකට එක්වෙමිනි. එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

"අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාමට ඩොලරයේ අගය වැඩිවීම, රුපියල බාල්දු වීම සහ ආනයනය සීමා පැනවීම වගේම ආර්ථිකයේ පසුබෑම වැනි කරුණු ආණ්ඩුව විසින් දක්වනවා. පොදුවේ දකින්න ලැබෙන කරුණු මේ තත්වයේ තිබුණත් එදිනෙදා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහල යාම දරාගන්න බැරිවී තිබෙන්නේ මේ හේතු නිසාම නෙවෙයි. ජනතාව පවතින තත්වයන් බාරගන්න ඕනෑ බව ආණ්ඩුව පවසනවා. පාරිභෝගික කටයුතු ඇමතිවරයා ප්‍රකාශ කරන්නේ මේ මොහොතේදී උත්තරයක් නැහැ කියලා. මෙතරම් පීඩනයක් ජනතාවට තිබියදී වගකිව යුතු අමාත්‍යවරුන් කරන ප්‍රකාශ දිහා බැලුවාම ආණ්ඩුවේ ක්‍රියාමාර්ගය පැහැදිලියි.

සීනි සම්බන්ධයෙන් විශේෂයෙන්ම 2020 නොවැම්බර් 16 ගැසට් නිවේදනයක් නිකුත් කළා. තොග මිල රු. 80ක් සහ උපරිම සිල්ලර මිල රු. 85ක් නියම කළා. නමුත් මේ අතර සීනි ආනයනය කිරීමේ කිලෝවක බද්ද රු. 50 සිට ශත 25 දක්වා අඩු කළා. මෙතැන රු. කෝටි 1,500කට වැඩි බදු වංචාවක් සිදුවුණා. මැයි මාසයෙන් පස්සේ සීනි මිල වේගයෙන් වැඩිවී අද රු. 240ක් ඉක්මවා තිබෙනවා. වෙළඳ ඇමතිවරයා කීවේ සීනි හිඟයක් නැති නිසා ප්‍රශ්නය ඉවරයි කියලා. දැන් පාරිභෝගික කටයුතු ඇමතිවරයා කියන්නේ රු. 100කින් මිල වැඩිවුණත් කරන්න දෙයක් නැහැ කියලා. මේ රටේ ජනතාව වෙනුවෙන් සහන දෙන්න තිබියදී බදු වංචා කරලා කිහිප දෙනෙක් අතර ඒකාධිකාරයක් පිහිටුවන්න ආණ්ඩුව ඉඩ දී තිබෙනවා.

සහල් වෙළඳපොළේ තියෙන්නේත් ආණ්ඩුවේ ගජ මිතුරන්ගේ ඒකාධිකාරයේ ප්‍රතිඵලයි. ගොවි ජනතාවත් පාරිභෝගිකයත් අසරණ කරලා තියෙන්නේ. සාමාන්‍ය ජනතාව පරිභෝජනය කරන රතු කැකුළු සහල් කිලෝ එකක් රු. 115ක විතර ඉඳලා විවිධ වර්ගවල සහල් රු. 200 දක්වා මිල වැඩිවෙලා. සැමන් සහ පරිප්පු සහනාධාර මිලට දෙන බව කිවුවත් මේ වන විට දිනපතාම සියලු අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යමින් තිබෙනවා. අද ආදායම් මාර්ග අහිමි වී, නිරෝධායනයට ලක්වී, නිරෝධායන ඇඳිරි නීතියට ලක්වී ඉන්න ජනතාව බරපතළ ජීවන වියදම් ගැටලුවකට මුහුණ දෙනවා. රු. ලංකා අල කිලෝව 250 දක්වා ඉහළ ගොස් තිබෙනවා. ලොකු ළූණු කිලෝ එක රු 130යි. රු. 340ට තිබුණු හාල්මැස්සෝ කිලෝව රු. 1100 දක්වා වැඩිවෙලා. වියළි මිරිස් 650යි. රු. 380ට තිබුණු පොල් තෙල් ලීටරය අද 750යි. අද කිරිපිටි හිඟයක් ඇතිවෙලා තියෙනවා. ඒ වගේම සියලුම එළවළු වර්ගවල මිල ගණන් දිනපතා ඉහළ යනවා. ගෑස් මිල, ඉන්ධන මිල, බේකරි නිෂ්පාදන මිල ගණන් ඇතුළු අත්‍යවශ්‍ය හැම දේකම වේගයෙන් වැඩිවෙලා. ආදායම් මාර්ග නැතිවීම, පඩි වැඩිවීම් නැතිවීම, පවතින පසුබිමක පුංචි බිස්කට් පැකට් එකක පවා මිල රු. 10කින් විතර සතිපතා වැඩිවෙමින් තිබෙනවා.

මේ අතර පසුගිය අගෝස්තු 19වැනිදා ඖෂධවල උපරිම මිල තීරණය කර ගැසට් පත්‍රයක් නිකුත් කළා. ගැසට් නිකුත් කරන්න ඕනෑ පවතින මිලට වඩා අඩු මිලකට ලබාදෙන්නයි. නමුත් සිදුවී තිබෙන්නේ කොවිඩ් වසංගත තත්වය තුළ පවා අනෙකුත් ලෙඩ රෝගවලට ඖෂධ ගන්න බැරි තත්වයක් ඇතිවී තිබීමයි. ඖෂධ නාමයෙන් මිල තීරණය කර තිබෙන අතර වෙළඳපොළේ වෙළඳ නාමයන් යටතේ විශාල වැඩි මිලකට ඖෂධ විකුණනවා. නමුත් ගැසට් නිවේදනයෙන්ම ඖෂධ නාමයේ මිල ගණන් වැඩි කරලා තියෙන්නේ. මේ බෙහෙත් වර්ග බොහොමයක් ජනතාව දිගු කාලීන වශයෙන් පාවිච්චි කරන ඒවායි. ඒ නිසා ඔවුන්ට දරන්නට සිදු වන වැය බර විශාල ලෙස වැඩි වෙලා. අධි රුධිර පීඩනයට ගන්නා ලොසාටන් පොටෑසියම් මිලි ග්‍රෑම් 25 රු. 4 සිට 9.62 දක්වා වැඩි කරලා. ඒවගේම මිලිග්‍රෑම් 50 රු. 7 සිට 13.49 දක්වා වැඩි කරලා. ඒ වගේම කොලොස්ටරෝල්වලට ගන්නා ඇටෝවාන්ටැටින් මිලි ග්‍රෑම් 10 රු. 4.50 සිට 14.60 දක්වා වැඩි කරලා. ඒ වගේම මිලි ග්‍රෑම් 20 රු 7.50 සිට 23 දක්වා වැඩි කරලා. දියවැඩියාවට ලබාගන්නා මෙට්ෆෝමින් මිලි ග්‍රෑම් 500 රු. 3.20 සිට 5.17 දක්වා වැඩි කරලා. ඒ වගේම ග්ලික්ලසයිඩ් මිලි ග්‍රෑම් 80 රු. 5 සිට 14.80 දක්වා වැඩි කරලා. ගැස්ට්‍රයිටිස්වලට ලබාගන්නා ඔමෙප්‍රසොල් මිලිග්‍රෑම් 20 රු. 4.80 ඉඳලා 5.89 දක්වා වැඩි කරලා. ඒ වගේම පැන්ටොප්‍රසෝල් මිලි ග්‍රෑම් 30 රු. 3.50 සිට 22.25 දක්වාත් එම මිලි ග්‍රෑම් 40 රු. 4.50 ඉඳලා 36.65 දක්වාත් වැඩි කරලා. ආණ්ඩුව ගජ මිතුරන් සතුටු කරන්න වැඩ කරලා තියෙන්නේ මේ ආකාරයටයි. අත්‍යවශ්‍ය භාණ්ඩ වගේම අත්‍යවශ්‍ය ඖෂධ මිල වැඩිකර ආණ්ඩුව ජනතාවගෙන් පළි ගන්නා බවයි අපිට දකින්න තියෙන්නේ.

කොවිඩ් තත්වය වර්ධනය වෙද්දී රට වහන්න කියලා විශේෂඥයින් කියද්දී ආණ්ඩුව කීවේ පුංචි මිනිහා ගැන බලන්න ඕනෑ කියලා. නමුත් මිල වැඩි කිරීමේදී ආණ්ඩුවට පුංචි මිනිහා මතක් වෙන්නේ නැහැ. මාධ්‍ය සංදර්ශන හැටියට දේශීය කර්මාන්ත, දේශීය ගොවියා ගැන කතා කරනවා. නමුත් පොහොර ප්‍රශ්නය එනකොට කෘෂිකර්ම ඇමතිවරයාට කොවිඩ් හැදුණා කියනවා. තෙල් මිල වැඩිවෙනකොට ඛනිජ තෙල් ඇමති විවිධ තර්ක ඉදිරිපත් කරලා පස්සේ කොවිඩ් හැදුණා කියලා පැත්තකට වෙනවා. බඩු මිල ගැන විවිධ තර්ක ඉදිරිපත් කරලා සතොසෙන් ඕනෑ කෙනෙකුට බඩු ගන්න පුළුවන් කියලා තර්ක කරලා අන්තිමේ කොවිඩ් හැදුණා කියලා පැත්තකට වෙනවා. ඊට පස්සේ වගකියන්න කෙනෙක් නැහැ. නමුත් හැම පැත්තෙන්ම හොරු ටිකයි ඒකාධිකාරයන් පිහිටුවාගත් හතර පස් දෙනෙක් මුළු රටේම වෙළඳපොළ හසුරුවමින් ඉන්නවා.

මේ දක්වා නිරෝධායනයට ලක්කර සිටින පවුල්වලට රු. 10,000ක වියළි ආහාර ද්‍රව්‍ය මල්ලක් ලබාදුන්නා. ජනතාවගෙන් අයකළ බදු මුදල්වලින් මේ වැනි සහනයක් කොවිඩ් වැළඳී අසරණව සිටින **10 වැනි පිටුවට**

# පොලීසිය ක්‍රියාත්මක විය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් නීතියටත් අනුගතවයි



**පොලිස් දෙපාර්තමේන්තුව හෝ නීතිපති දෙපාර්තමේන්තුව ඇත්තේ ආණ්ඩුව කියා සිටින ඕනෑම වැඩක් කිරීම සඳහා නොවන බවත් ආණ්ඩුව, පොලිසිය පාවිච්චි කරගනිමින් ගෙනයන මර්දනය අභියෝග කිරීමට නීතිඥවරුන් ලෙස තමන් සූදානම් බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරකසභික නීතිඥ සුනිල් වටගල සහෝදරයා, පොලීසිය ක්‍රියාත්මක විය යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් නීතියටත් අනුගතව බව කියා සිටියේය.**

සුනිල් වටගල සහෝදරයා මේ බව පෙන්වා දුන්නේ පසුගිය 07වැනි දින ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානය විසින් ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවේදීය. එහිදී පොලීසිය හා නීතිපතිවරයා විසින් කරන ලද අනීතික මැදිහත්වීම් පිළිබඳව වැඩිදුරටත් කරුණු දක්වමින් ඔහු මෙසේද කීය.

### ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික නීතිඥ සුනිල් වටගල සහෝදරයා

"තමන්ගේ වැටුප් ඉල්ලා උද්ඝෝෂණය කළ ගුරුවරුන්ව දින 14ක් රක්ෂිත බන්ධනාගාර ගත කරන්න කියලා, නීතිපතිවරයා කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේදී පැයක විතර දේශනයක් කළා. ඒ කාගේ වුවමනාවටද කියලා අපිට පැහැදිලියි. අනෙක් අතට පොලිසිය ආණ්ඩුවේ බළල් අතක් වෙලා තිබෙනවා. නීති විරෝධී ලෙස පොලිසිය දිගින් දිගටම ක්‍රියාකරමින් තිබෙනවා.

මෙවැනි ආකාරයේ අත්අඩංගුවට ගැනීම්, පැහැර ගැනීම් කියලා අපිට විග්‍රහ කරන්නත් සිදුවෙනවා. මෙය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ තර්ජනයක්. සාමකාමී උද්ඝෝෂණ මැඩපවත්වන්න ආණ්ඩුව විවිධ ක්‍රියාමාර්ග ගන්නවා. නමුත් ඒ උද්ඝෝෂණ කිසිසේත්ම නීති විරෝධී වෙන්නේ නැහැ. ගොවියාට වෙලේ ඉඳලා විරෝධය පාන්න සිද්ධ වෙනවා නම් ගොවියා ඒ වැඩේ කරනවා. ගුරුවරුන්ට මහපාරට ඇවිත් විරෝධය පාන්න සිදුවෙලා නම් ඔවුන් මහපාරේ විරෝධය පානවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර තිබෙන අයිතීන් අනුව ඔවුන් ක්‍රියා කරනවා. එහෙම නම් ආණ්ඩුවට තිබෙන්නේ උද්ඝෝෂකයන්ගේ සාධාරණ අයිතීන් ලබාදෙන්න. ගොවියාට පොහොර ලබාදෙන්න. කම්කරුවාට වැටුප් වැඩිකිරීම් ලබාදෙන්න මැදිහත් වෙනවා වෙනුවට ආණ්ඩුව, පොලිසිය පාවිච්චි කර ගෙනයන මර්දනය නීතිඥවරුන් ලෙස අපි අභියෝගයට ලක්කරනවා."

***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# සටන් බිම

## ගුරු විදුහල්පති සටනට විසඳුම් නැහැ සටන ඉදිරියටම...



වසර 24 ක් තිස්සේ නොවිසඳා පවතින ගුරු විදුහල්පති වැටුප් ප්‍රශ්නය විසඳීමට බලකරමින් පසුගිය කාලයේ ආරම්භ කරන ලද සටන සඳහා තවමත් විසඳුමක් ලබාදී නොමැත. කොළඹ ඇතුළු රට පුරා සෑම නගරයකම පාහේ ආරම්භ කරන ලද ගුරු විදුහල්පති උද්ඝෝෂණ නිසා මෙම ගැටලුව සම්බන්ධව සමාජයේ කතාබහක් මතු වූ අතර ඒ නිසාම ආණ්ඩුව විසින් යම් යම් සාකච්ඡාවන් සඳහා ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය සමග සාකච්ඡා කිරීමට ආරම්භ කරන ලදී. ඒ අනුව පසුගියදා නව අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන ඇමතිවරයා සමග මෙම සාකච්ඡාව පැවැත්වූ අතර මේ සඳහා වෘත්තීය සමිති වෙනුවෙන් මහින්ද ජයසිංහ, ජෝසප් ස්ටාලින්, යල්වෙල පඤ්ඤාසේකර හිමි ඇතුළු වෘත්තීය සමිති නායකයෝ සහභාගි වූහ.

ගුරු විදුහල්පති වැටුප් විෂමතාවය විසඳීමට අදාළව කැබිනට් අනු කමිටුව විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳව ඊළඟ අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් ගැනීමට පෙර අධ්‍යාපන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා වෙත ගුරු විදුහල්පති වෘත්තීය සමිති සන්ධානය විසින් සිය අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන ලදී .

මේ වන විට වෘත්තීය සමිති විසින් ආරම්භ කරන ලද උද්ඝෝෂණ ව්‍යාපාරය හා වැඩ වර්ජනය ඉදිරියටත් ක්‍රියාත්මක වන බවද මෙම වෘත්තීය ක්‍රියාමාර්ගයට සහායක් ලෙස වෙනත් වෘත්තීය සමිති ව්‍යාපාර දැනුවත් කිරීම්, දේශපාලන පක්ෂ දැනුවත් කිරීම ආදියද ක්‍රියාමාර්ග ලෙස ගනිමින් ඇති බවද මහින්ද ජයසිංහ සහෝදරයා නියමුවා වෙත පැවසීය.

## විද්‍යාත්මක ලොක්ඩවුන් කිරීමක් නොවේනම් පලක් නැහැ වෘත්තීය සමිති එකහඬින් කියයි




වෘත්තීය සමිති, මහා නායක හිමියන්, ආදීන්ගේ ඉල්ලීම පිට මෙම ලොක්ඩවුන් කිරීම සිදුකළේයැයි ජනාධිපතිවරයා පැවසීමෙන් පමණක් මෙය විද්‍යාත්මක ලොක්ඩවුන් කිරීමක් සිදුනොවන බවත් සෞඛ්‍ය විශේෂඥයින්ගේ උපදෙස් අනුව ජනාධිපතිවරයා තීරණ ගත යුතු බවත් වෘත්තීය සමිති සම්බන්ධීකරණ කමිටුව වෙනුවෙන් වෘත්තීය සමිති නියෝජිතයෝ පවසති.

දිගින් දිගටම සෞඛ්‍ය අංශ විද්‍යාත්මක ලොක්ඩවුන් කිරීමට යාමට ආණ්ඩුවට බලකර සිටි නමුත් තවමත් සිදුවන්නේ තවත් එක් වසා දැමීමක් පමණක් බවද ඔවුහු වැඩිදුරටත් පවසති. මෙලෙස තීරණ නොගැනීම නිසා රට වැසීමෙන් පසු නැවත විවෘත වන්නේ දැන් තිබෙන මට්ටමින්ම බවද එය කොරෝනා වසංගත ව්‍යාප්තිය පාලනයක් නොවන බවද එහිදී වෘත්තීය සමිති නියෝජිතයෝ පවසති. වසංගතය පාලනය වෙනුවෙන් මෙම විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය සමිති සම්බන්ධීකරණ කමිටුව ආණ්ඩුවට බලකිරීමේ ක්‍රියාමාර්ගවලට පැමිණියහ.

ඒ අනුව කොවිඩ් වසංගතයෙන් වැඩකරන ජනතාව ඇතුළු රටේ මහජනතාව ආරක්ෂා කරගනිමින් පැතිරීම පාලනය කරමින්, මිනිස් ජීවිත අහිමි වීම වළක්වාලීම සඳහා විද්‍යාත්මක වැඩපිළිවෙළක අවශ්‍යතාවය පිළිබඳව කරුණු සහිතව පසුගිය දින සෞඛ්‍ය අමාත්‍යවරයා ඇතුළු බලධාරීන් සමග සාකච්ඡාවක් පවත්වන ලදී. එම සාකච්ඡාව සඳහා වෘත්තීය සමිති සම්බන්ධීකරණය මධ්‍යස්ථානය නියෝජනය කරමින් වෘත්තීය සමිති සම්බන්ධීකරණ කමිටුවේ සහෝදර සහෝදරියෝ රැසක් එක්ව සිටියහ.

## වරාය ඉඩම් හා සේවාවන් චීනයට පැවරීම නවත්තන්න වරාය වෘත්තීය සමිති ජනපතිට ලියයි



අක්කර 13 ක වරාය ඉඩම හා වරාය අධිකාරිය යටතේ ලබාදෙන සේවාවන් චීනයේ CICT සමාගමට පැවරීමට ගෙන ඇති තීරණය වහා අහෝසි කරන ලෙස ඉල්ලා සිටිමින් සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකානගේ සහෝදරයා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් මගින් දැනුම්දී ඇත.

වරාය සතු ඉඩම්, ව්‍යාපාර, සේවා, පර්යන්ත, වරායවල් බොහෝ ප්‍රමාණයක් පසුගිය අවුරුදු 42ක කාලය තුළ වරායට සහ රටට අහිමි වී ඇති බවද පැවති හා පවතින සෑම රජයක් ම සංවර්ධනය මුවාවෙන් ජාතිය සතු සම්පත් දේශීය හා විදේශීය සමාගම් වෙත පවරා ඇතත් එමගින් වරායට හෝ රට අත්ව ඇති ආර්ථික වාසියක් නැති බවද සිදුව ඇත්තේ රටට ලැබිය යුතු ධනය දෙස් විදෙස් සමාගම් හිමිකරුවන් හා දේශීය තැරැව්කරුවන් වෙත ගලා යාම පමණක් බවද මෙම ලිපිය මගින් ජනාධිපතිවරයා වෙත පෙන්වා දී ඇත.

කෙසේ වෙතත් පසුගිය රජයන් විසින් විකුණා දමන ලද ජාතික සම්පත් නැවත පවරා ගැනීමට කටයුතු කරන බවට රටට පොරොන්දු දී බලයට පැමිණි වර්තමාන ජනාධිපතිවරයා පෙර පැවති රජයන් මෙන්ම ජාතිය සතුව ඉතිරිව පවතින සම්පත් ප්‍රමාණය ද එකින් එක විකිණීමට කටයුතු කිරීම ඉතාමත් කණගාටුදායක බවද මෙම ලිපිය මගින් ඔහු පෙන්වා දෙයි.

## සංචාරක ව්‍යාපාරයේ අර්බුදයට වහා පිළියම් යොදනු! දැවැන්ත සංවිධානයක් ගොඩනැගෙයි



සංචාරක ව්‍යාපාරයේ නියැලෙන ලක්ෂ ගණනක් වන පිරිස මේ වනවිට සියදිවි නසාගනිමින්, ශරීර අවයව විකුණන තැනට පත්වෙමින් සිටින බවත් රටේ වැඩිම විදේශ විනිමයක් සපයන සංචාරක ව්‍යාපාරයේ අර්බුදය පියවීම සඳහා ආණ්ඩුව තවමත් කිසිදු පියවරක් ගෙන නොමැති බවත් අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පවසයි.

ඔහු මේ බව පැවසුවේ පසුගියදා ලංකාව තුළ මේ වන විට සංචාරක ව්‍යාපාරය තුළ සිදුව ඇති විශාල අර්බුදයට පිළියම් යොදන ලෙස බලකරමින් සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ ක්ෂේත්‍ර 80ක පමණ වන නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් සමස්ත ලංකා සංචාරක සේවා නියුක්තිකයින්ගේ සංගමය පිහිටුවා ගැනීමේ අවස්ථාවේදීය.

සංචාරක හෝටල් හිමියන්, මඟපෙන්වන්නන්, සංචාරක නියෝජිත ආයතන නියෝජිතයින්, සංචාරකයින් සඳහා පාරිභෝගික භාණ්ඩ හා සේවා සපයන්නන් ආදී විවිධ ක්ෂේත්‍ර මෙම සංවිධානයට ඇතුලත්ව ඇති බව වසන්ත සමරසිංහ සහෝදරයා මෙහිදී පැවසීය.

සංචාරක ව්‍යාපාරයේ අර්බුදය විසඳීම හා සංචාරක ව්‍යාපාරය නැවත ගොඩනැගීම සඳහා වන යෝජනා මාලාවක් සමස්ත ලංකා සංචාරක සේවා නියුක්තිකයින්ගේ සංගමය මගින් ආණ්ඩුවට ඉදිරිපත් කරනු ලැබ ඇත.

කඩා වැටී ඇති සංචාරක ව්‍යාපාරය ගොඩනැගීමට ආණ්ඩුව මෙම යෝජනා ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව වහා පියවර ගත යුතු බවත් එසේ නොවන්නේ නම් සියලු සංචාරක සේවාවන්වල නියුතුවූවන් සමග දැවැන්ත ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද මෙහිදී වසන්ත සමරසිංහ සහෝදරයා අවධාරණය කළේය.

# එතෙරින්...

පසුගිය 18වැනි දින එතෙර අපි සංවිධානය විසින් බත්තරමුල්ල, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී විදේශ රැකියා නියුක්තිකයින්ට අදාළ ගැටලු පිළිබඳව ඔන්ලයින් මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්විය. මේ එහිදී පළ වූ අදහස්වල ලිඛිත සටනකි.

## ආණ්ඩුව විදේශ රැකියා නියුක්තිකයන් ආරක්ෂා නොකරන්නේ නම්, ඔවුන් රටට ඩොලර් එවීම ගැන තීරණයක් ගනීවි

**එතෙර අපි සංවිධානයේ සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**




රට තුළ වගේම ලෝකයෙත් කොවිඩ් වසංගත තත්වය වේගයෙන් පැතිර යමින් තිබෙනවා. ඒ අතර අපේ රටේ ආණ්ඩුව මිනිස්සුන්ගේ ජීවිත ගණන් බලමින් ඉන්නේ ඩොලර්වලින්. ජනතාවගේ ජීවිත බිලිදීලා හරි ඩොලර් සොයන ක්‍රම අනුගමනය කරමින් ඉන්නවා. ලංකාවට වැඩිම විදේශ විනිමය ගේන්නේ විදේශ ගතවී ඉන්න ශ්‍රී ලාංකික සහෝදර ජනතාව. විදේශ විනිමය හිඟා කමින් ලෝකය වටේ ගියත් අවුරුද්දකට ඩොලර් මිලියන 7,000කට වැඩිය ගෙනත් දෙන විදේශගත ශ්‍රමිකයින් පිළිබඳව කටයුතු කර නැහැ. රටේ සම්පත් විකුණන්න තියෙන වුවමනාව විදේශ විනිමය වැඩිම ප්‍රමාණයක් ගේන ලාංකිකයන් සම්බන්ධයෙන් නැහැ.

ශ්‍රී ලාංකේය විදේශගත ශ්‍රමිකයෝ කොරෝනා වසංගත තත්වය තුළ පවා ඩොලර් මිලියන 3324ක් මේ අවුරුද්දේ මුල් මාස හයේදී රටට උපයා දී තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් මාසයකට ඩොලර් කෝටි 55ක් එවා තිබෙනවා. එයින් 50%කට වැඩි ප්‍රමාණයක් මැදපෙරදිග ගෘහ සේවයේ ඉන්න අපේ දයාබර අම්මලා අක්කලා එවන්නේ. නිල වශයෙන් සංඛ්‍යා දත්ත නැතත් දළ වශයෙන් ලක්ෂ 15ක් විතර විදේශ රැකියා කරන ඉතාමත්ම වගකීම්සහගත පිරිසක් ඉන්නවා. ඔවුන්ගේ දරු පවුල් පවා මේ රට තුළ කොරෝනා වසංගතයේ ගොදුරු බවට පත්වී ඉන්නවා. ඒ පවුල් පිළිබඳව විදේශ සේවා නියුක්ති කාර්යාංශයවත් ආණ්ඩුවවත් බලන්නේ නැහැ. කොරෝනා වසංගතය ආරම්භයේදී විදේශ රැකියා කරන ලාංකිකයන් වදයක් හැටියට ආණ්ඩුව සැලකුවා. ආණ්ඩුවේ ඇමතිවරුන් කුවේට්වල ඉඳලා ආව ලාංකිකයන් මිනිස් බෝම්බ හැටියට හැඳින්වූවා. යුක්‍රේන සංචාරකයන්ව මගුල් බෙර ගහලා පිළිගත්තාට විදේශ විනිමය උපයා දෙන ලාංකිකයන් ඔවුන්ට මිනිස් බෝම්බ වුණා.

කොරෝනා ලෝකයේ ව්‍යාප්තියත් සමග රටවල ඉන්න විදේශ රැකියා කරන්නන්ගේ ගැටලු ගැන දැන්වීමට කම්කරු සුභසාධන නිලධාරීන් නැහැ. ඔවුන් ලංකාවට ගෙනත් නිරෝධායනයට අපට බාරදෙන්න කියා අපි ඉල්ලා සිටියා. නමුත් එහෙම කිසිම සුභසාධනයකට ඉඩ ලබාදුන්නේ නැහැ. මේ නිසා අද වෙනකොට ඔවුන්ට වීසා, තාවකාලික හැඳුනුම්පත් හෝ නිල ලියවිල්ලක් නැතිව කොවිඩ් වැක්සීන් ලබා ගැනීමට නොහැකිවී තිබෙනවා. මේ නිසා ලංකාවට ඇවිත් මැරෙන්න හරි ඉඩ දෙන්න කියලා අසරණව ඉල්ලීම් කරන තත්වයට ඔවුන් පත්වී තිබෙනවා. අපේ රටට ඩොලර් එවූ සහෝදර ජනතාව ඒ තරම්ම අසරණ කර තිබෙනවා. අද වනවිට විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ කොවිඩ් සම්බන්ධ නිල වෙබ් අඩවිය පවා අක්‍රිය කර තිබෙනවා. මේ නිසා විදේශ රැකියාවලට සහ අධ්‍යාපන කටයුතුවලට යන්න සිටින අයගේ කටයුතු පවා අඩපණ වී තිබෙනවා. ආණ්ඩුව ඩොලර් දිහා බලාගෙන විදේශ රැකියා කරන අය කොවිඩ් මාරයට බිලි දී තිබෙනවා. සෞඛ්‍ය අංශ නිර්දේශවලට ඇහුම්කන් නොදී විදේශ රැකියා කරන්නන්ගේ මෙරට පවුල්වල අයගේ ජීවිත බිලි දීලා තියෙන්නේ. මේ තත්වය තුළ අපි ආණ්ඩුවට අනතුරු ඇඟවීමක් කරනවා. මේ තත්වය තුළ විදේශ රැකියා කරන ශ්‍රී ලාංකිකයන් මේ හිතුවක්කාරී ආණ්ඩුවට විරෝධය පළ කිරීම සඳහා මේ රටට එවන විදේශ විනිමය එවීම නතර කිරීමේ තීරණයක් ගන්න ඉඩ තියෙනවා.

ආණ්ඩුවේ ඔලමොට්ටල තීරණ නිසා මිනිස්සු ජීවිත දන් දිය යුතු නැහැ. ලංකාව ඇතුළෙ ඉන්න සමස්ත ජනතාවගේ ඥාතීන් සහ දරුවන් විදේශ රැකියාවල නියැලී ඩොලර් එවීම නතර කර ආණ්ඩුවට පණිවුඩයක් දෙන්න පුළුවන්. මේ විපත්තියෙන් රට මුදවා නොගැනීම ගැන ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා සහ ඔහුගේ ආණ්ඩුව සම්පූර්ණයෙන් වගකියන්න ඕනෑ. විදේශගතවී ලංකාවට එන්න බලාගෙන ඉන්න ලාංකිකයන් වෙනුවෙන් පහසුකම් සලසන්න ආණ්ඩුව ක්‍රියාකරන්න ඕනෑ.

## රුසියානුවන්ට නොමිලේ ටිකට්පත් දී ගෙන්වා ගන්නවා විදේශ රැකියා කරන අයට දුන්නේ මොන සහනයද?

**එතෙර අපි සංවිධානයේ භාණ්ඩාගාරික, නීතිඥ ජානක අධිකාරි සහෝදරයා**



විදෙස්ගත ශ්‍රමිකයා එවන මුදල් දිහා කෑදර විදිහට බලාගෙන ඉන්න ජනාධිපතිවරයා සහ ආණ්ඩුව ඔවුන්ගේ සරල ගැටලුවක්වත් විසඳා දෙන්නේ නැහැ. ලංකාවට ඇවිත් ආපහු යන රැකියා කරන්නන්ගේ පී.සී.ආර්. පරීක්ෂණවලටත් රු. 7,500ක් අය කරනවා. කිසිම ආකාරයක සහනයක් සලසා දී නැහැ. රැකියාවක් සඳහා විදේශගත වන අයගෙන් රැකියා ගිවිසුම අත්සන් කිරීමේදී රු.17,500ක් අයකරනවා. ඒ අය වෙනත් රැකියාවකට මාරු වුණොත් තවත් රු.17,500ක් අයකරනවා. මේ වාගේ බරපතළ ආකාරයට සූරලා සල්ලි ගත්තත් විදෙස්ගත ශ්‍රමිකයන් සම්බන්ධයෙන් විශ්‍රාම වැටුපක් ලබාදීමටවත් උනන්දු වෙන්නේ නැහැ. කුවේට් වන්දි අරමුදල යොදාගෙන දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ගොඩනැගීමට සැලසුමක් අපි ලබාදුන්නා. එවැනි විශ්‍රාම වැටුපක් තිබුණා නම් කොවිඩ් වසංගතය හමුවේ ඔවුන්ට විශාල සහනයක් ලැබෙනවා. මෙවැනි අර්බුදකාරී අවස්ථාවක විශ්‍රාම වැටුපක වැදගත්කම විදෙස්ගත ශ්‍රමිකයන්ට වැඩියෙන් දැනෙනවා.

විදේශ රැකියා කර ලංකාවට පැමිණෙන්න සිටි අය වෙනුවෙන් ගුවන්යානා නිසි පරිදි සැලසුම් කර දුන්නේ නැහැ. අබුඩාබිවල ඉඳලා එක වාරයකදී ලංකාවට පැමිණෙන්න රු. 60,000ක පමණ මුදලක් ටිකට් එකට වියදම් කරන්න සිදුවුණා. නමුත් ආණ්ඩුවේ ගජමිතුරු ව්‍යාපාරිකයන්ට විශාල සහන ලබාදෙනවා. රුසියානු සංචාරකයන් එක ටිකට්පතක් ගන්නකොට තව ටිකට් පතක් නොමිලේ ලබාදෙනවා. රුසියානු සංචාරකයන්ට කඩිනමින් මෙවැනි පහසුකම් ලබාදෙන නමුත් විදෙස්ගත ශ්‍රමිකයන් ලංකාවට එද්දී ගුවන් ටිකට්පත සම්බන්ධයෙන් ලබාදුන් සහනය මොකක්ද කියලා අපි ආණ්ඩුවෙන් ප්‍රශ්න කරනවා. කිසිම සහනයක් දීලා නැහැ.

නමුත් දේශපාලන වැඩසටහනකට විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ නිලධාරිනියක් රූපවාහිනී නාලිකාවට ඇවිත් විශාල බොරු ප්‍රමාණයක් කීවා. විදේශගත ශ්‍රමිකයන් 64,000කට වැඩිය ලංකාවට ගෙන එන්න කටයුතු කර තිබෙන බව ප්‍රකාශ කළා. නමුත් ඔවුන් තමන්ගේ මුදලින් ටිකට්පත් ලබාගෙන පැමිණි අයයි. ඒ අය නිරෝධායනය කරන්න කාර්යාංශයෙන් කිසිම මුදලක් වැය කළේ නැහැ. දවසකට රු 7,000 බැගින් නිරෝධායනයට අය කළා. ඒ අය සති දෙකක් නිරෝධායනය කඳවුරුවල රඳවාගෙන සිටියා. ඔවුන්ට සහන දෙන බව පෙන්වලා ජනාධිපතිවරයා සහ ආණ්ඩුව තවත් මගඩියක් කළාද කියලා අපි ප්‍රශ්න කරනවා.

රැකියා අහිමි වී එළියට වැටුණු අයට ආහාර සැපයීම ඇතුළු සියලු අවශ්‍යතා සපයා දුන්නේ රැකියාවල නියුක්තව සිටි ඒ ඒ රටවල ලාංකිකයින් විතරයි. තානාපති කාර්යාලවල මැදිහත්වීම ඉතාම අල්ප වුණා. නමුත් කාර්යාංශය රු. ලක්ෂ 130-150ත් අතර ප්‍රමාණයක් මේ අයගේ ආහාරපානවලට වැය කළ බව ඒ නිලධාරිනිය කීවා. මේ මුදල වියදම් කළේ කුමන රටේ කුමන තැන්වල සිටි අයටද කියලා අපි ප්‍රශ්න කරනවා. ආණ්ඩුව තමන්ගේ වගකීමෙන් මිදිලා සල්ලි ටික එකතු කරගන්න විතරක් බලාගෙන ඉන්න එපා. ආණ්ඩුව තීරණ ගන්නේ නැත්නම් මිනිස්සුන්ට තීරණ ගන්න සිද්ධ වෙනවා. විදෙස් මුදල් එක මාසයක් සම්ප්‍රේෂණය නොකර හිටියොත් මොකද වෙන්නේ? විදෙස්ගත ශ්‍රමිකයන් එවැනි තීරණයකට ගියොත් ආණ්ඩුව මොකද කරන්නේ? ඒ නිසා විදෙස්ගත ශ්‍රමිකයන්ව තවත් දුෂ්කරතාවයට පත් නොකර ඔවුන්ට ලැබිය යුතු සහන ලබාදෙන්න කියලා බල කරනවා.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# තමන්ගේ වළ තමන්ම හාරා ගැනීම

නන්දසේන ගෝඨාභය රාජපක්ෂගේ ජනාධිපතිකමට තවම වසර දෙකක් පිරුණේද නැත. රාජපක්ෂ ආණ්ඩුවට යන්තම් වසරක් පිරුණා පමණි. මේ කෙටි කාලය තුළ ලංකාවේ මෙතරම් ජනතා විරෝධයකට හා හාස්‍යයකට, හැල්ලුවකට, අසමත්කමට ලක්වූ ආණ්ඩුවක් නැති තරම්ය.

පාස්කු ප්‍රහාරය යොදාගනිමින් ජනතාව බියවද්දා, ජාතිවාදය හා ආගමික අන්තවාදය අවුළුවා බලයට පැමිණි වත්මන් පාලනය තමන්ට ඡන්දය දුන් ජනතාව තුළින්ම ප්‍රතික්ෂේප වීමට පටන්ගෙන තිබේ. අර්බුදයට පත්ව තිබූ ලංකාවේ පසුගාමී, ධනපති ක්‍රමය තුළ ගෝඨාභය රාජපක්ෂලාට කළ හැක්කේ එය තව තවත් අර්බුදයට යැවීම මිස ඊට විසඳුම් ලබාදීම නොවන බව දැන් හොඳින් පැහැදිලි වී තිබේ.

ආණ්ඩුවට ඡන්දය දුන් ජනයා අපේක්ෂාභංගත්වයට පත්ව තිබෙන අතර ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුවට කළ හැකි කිසිවක් නැතිව වික්ෂිප්තභාවටයත් කෝපයටත් පත්ව සිටියි. එහි ප්‍රතිඵලය වී තිබෙන්නේ ආණ්ඩුව තමන්ට බලය ලබාදුන් ජනයාට එරෙහිව මර්දනයේ හා මඩ ගැසීමේ 'අවි' අමෝරා ගැනීමය.

ජනාධිපතිවරයා යනු රාජ්‍ය පාලනය පිළිබඳ කිසිවක් නොදන්නා, තමන් නොදන්නා බවවත් නොදන්නා, උද්දච්ච පාලකයෙක් බව දැන් ඔප්පු කරනු ලැබ තිබේ. එයට අනුව දැන් ආණ්ඩුව පොදු ජනතාවගේ සාධාරණ ප්‍රශ්නවලට ඇහුම්කන් දෙනවා වෙනුවට, එම ප්‍රශ්න විසඳනවා වෙනුවට, ඒ සඳහා 'දන්නා අයගෙන්' සහාය ලබාගන්නවා වෙනුවට තමන්ට ආවඩන 'රජ වාසලට' ගැතිකම්කරන පිරිසක් වටකරගෙන රටම විනාශය කරා ගෙන යමින් සිටී.

එය එසේ වෙද්දී ජනතාවගේ සාධාරණ ඉල්ලීම් හමුවේ විරෝධය හමුවේ ඒවා දේශපාලනිකව විසඳනවා වෙනුවට සටන් කරන බලවේගයන්ට, ආණ්ඩුව විවේචනය කරන අයට එරෙහිව මර්දනයේ හස්තය දිගු කිරීම එක් අතකින්ද මඩ අවලාද නැගීම අනෙක් අතින්ද කරමින් සිටී.

පසුගිය කාලයේ මුහුණු පොතේ ආණ්ඩුව විවේචනය කළ තරුණයන් කිහිප දෙනෙක් කිහිප සැරයක් අත්අඩංගුවට ගැනීමෙන්, රහස් පොලීසිය ලවා ප්‍රශ්න කිරීමෙන්, බියවැද්දීමට උත්සාහ කරනු අපි දුටුවෙමු. සමහරුන් අත්අඩංගුවට ගෙන රඳවා ගැනීමද කෙරිණි. උද්ඝෝෂණවලදී උද්ඝෝෂකයින්ට එරෙහිව බොරු චෝදනා ඉදිරිපත් කර ඔවුන් රක්ෂිත බන්ධනාගාරගත කිරීමටද කටයුතු කෙරිණි. දැනටත් එසේ කිහිප දෙනෙක් බන්ධනාගාරගත කරනු ලැබ සිටිති. මෑතකදී අවිස්සාවේල්ල රෝහලේ තරුණ වෛද්‍යවරයෙක් කොවිඩ් රෝගීන් මියයමින් සිටින බව ප්‍රකාශ කළ විට ඔහු හමුවට රහස් පොලීසිය යවා තිබුණි. එසේම පසුගියදා පාස්කු ප්‍රහාරය පිළිබඳ ආණ්ඩුවේ හැසිරීම විවේචනය කරමින් මාධ්‍ය හමුවක් පැවැත්වූ තරුණයෙක්ද රහස් පොලීසියට කැඳවා තිබුණි. මෙවැනි තව තවත් උදාහරණවලින් පෙන්වන්නේ ආණ්ඩුව තම විවේචකයින්ට ඇහුම්කන් දෙනවා වෙනුවට ඔවුන් බියවද්දා නිහඬ කිරීමට උත්සාහ කරන බවයි.

ගුරු උද්ඝෝෂණයේදීද ගුරුවරු-ගුරුවරියන් අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර කිරීමට ගත් ආණ්ඩුවේ උත්සාහය අසාර්ථක වූයේ අධිකරණය රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කළ නිසාය.

අනෙක් අතට ආණ්ඩුව දිගටම තම 'මඩ බලකාය' උපයෝගී කරගෙන විරුද්ධවාදින්ට එරෙහිව මුහුණු පොත යොදාගෙන මඩ ගැසීමේ, බොරු ප්‍රවෘත්ති නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක්ද පවත්වාගෙන යමින් සිටී. මෙහිදී ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය වූයේ ජ.වි.පෙ. හා එහි නායකයන්ය. මේ පිළිබඳ රහස් පොලිසියට කොතරම් පැමිණිලි කළත් ඒ සියල්ල 'හොරාගේ අම්මගෙන් පේන ඇසීමට සමාන විය.

ඉන් නොනැවතුණු ආණ්ඩුව තම මඩ බලකාය යොදා දැන් තම සාධාරණ ඉල්ලීම් වෙනුවෙන් අරගල කරන ගුරුවන්ටද පහර දීමට පටන්ගෙන තිබේ. 'කොවිඩ් ගුරු පොකුරක්' අපේක්ෂා කළ ඔවුන්ට එවැන්නක් සත්‍ය ලෙස නිර්මාණය නොවූ නිසා දැන් විවිධ කාන්තා, පිරිමි පින්තූර යොදාගනිමින් 'කොවිඩ් ගුරු මරණ' නිර්මාණය කර පළකිරීමට පටන්ගෙන තිබේ. ආණ්ඩුවේ දේශපාලන බංකොලොත්කම පිළිබඳ වෙනත් උදාහරණ අවශ්‍ය නැත. මෙයම ප්‍රමාණවත්ය. ආණ්ඩුව මේ කරන්නේ කුමක්ද? සිහිබුද්ධියෙන් බලන විට පෙනෙන එකම දෙය වන්නේ ආණ්ඩුව අසාර්ථකත්වයෙන් 'වියරු වී' තමන් බලයට පත්කරන ලද ජනයාටම පහර දෙමින් ඔවුන් තමන්ට අහිමි කරගනිමින් සිටීමය.

ගුරු අරගලය පිළිබඳව ආණ්ඩුව අනුගමනය කරන බියවැද්දීමේ හා මඩ ගැසීමේ ක්‍රියාවලිය පමණක් ගෙන බැලුවත් ආණ්ඩුව කරගනිමින් සිටින්නේ යළි නිවැරදි කරගත නොහැකි වැරැද්දක් බව පෙනේ. ලංකාවේ විදුහල්පතිවරු, ගුරුවරු හා පිරිවෙන් ගුරුවරු ලක්ෂ 2කට වැඩි පිරිසක් සිටිති. ඔවුනට සමාජයට කළ හැකි මතවාදී බලපෑමද විශාලය. අනෙක් අතට මේ ගුරුවරුන්ගෙන් සාතිශය බහුතරය පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්දය දී ඇත්තේ ගෝඨාභය රාජපක්ෂටය. මහ මැතිවරණයේදීද එසේමය. දැන් ආණ්ඩුව සදාචාරය පසෙකලා පහර දෙන්නේ බහුතරයක් වූ එම ගුරුවර ගුරුවරියන්ටමය; විදුහල්පතිවරුන්ටය. බේදවාචකය එයයි.

ඉන් පෙන්නුම් කරන්නේ කුමක්ද? අර්බුදය හමුවේ විසඳුම් නැති එහෙත් උඩඟුකමින් උද්දච්චකමින් පිරුණු ජනාධිපති ඇතුළු ආණ්ඩුව දැන් හැසිරෙන්නේ මිතුරන් දිනා ගන්නා ආකාරයෙන් නොව මිතුරන් අහිමිකරගන්නා ආකාරයෙන් බවය. රාජපක්ෂලාගේ මෙම උඩඟු උද්දච්ච හැසිරීම නිසා 20වැනි සංශෝධනයට අත උස්සා ජනාධිපතිට උපරිම බලතල ලබාදුන් ආණ්ඩුවේ කැබිනට් ඇමති, ඇමතිනියන්ට පවා කලකිරීමට ලක්ව රාජපක්ෂලාට යටි හිතින් බණිමින් සිටීමට සිදුව ඇත. එපමණක් නොව ජනාධිපතිවරයා වෙනුවෙන් විරුද්ධවාදීන්ට මඩ ගැසීම වෘත්තියක් කරගත් සමහර පුද්ගලයන්ටද යස පාඩම් රාජපක්ෂලා විසින් උගන්වනු ලැබ ඇති බව මේ දිනවල කරන ප්‍රකාශවලින් පෙනේ.

"ලුණු හැදෙන්නෙත් වතුරෙන් ලුණු නැති වෙන්නෙත් වතුරෙන්" යයි කියමනක් අපේ ජනවහරේ තිබේ. මේ සිදුවෙමින් තිබෙන්නේද එය බව පෙනේ. දැන් ආණ්ඩුව කරමින් සිටින්නේ තමන්ගේ වළ තමන්ම හාර ගැනීමය. ආණ්ඩුව දැන් මඩ හා මර්දනයේ 'අවි අමෝරා' ඇත්තේ තමන්ගේ විරුද්ධ දේශපාලන සංවිධානවලට පමණක් නොවේ. තමන් බලයට ගෙන ඒමට විශාල ලෙස දායක වූ අයට එරෙහිවද ආණ්ඩුව 'අවි අමෝරා' තිබේ. ඉන් පෙනී යන්නේ ආණ්ඩුව ගොඩනැගූ ජනයා හා සමාජ කණ්ඩායම නුදුරු අනාගතයේදී ආණ්ඩුව ගෙදර යැවීමේ සටනේද පෙරමුණ ගන්නා බවය. දේශපාලනයේ අවබෝධය ඇති අය කළ යුත්තේ එම සටන යළි පාවාදීමකට හසු වීමට, රැවටීමේ උගුලකට හසුවීමට ඉඩ නොතබා සැබෑ ජනතා ජයග්‍රහණයක් වෙත මෙහෙයවීමය.


# රටම පීඩාවට පත්වන ආර්ථිකයේ බේදවාචකය

කොවිඩ් 19 වසංතය උග්‍ර වී දිනකට මියයන සංඛ්‍යාව 200 සීමාව ඉක්මවා යන ව්‍යසනයකට ලංකාව දැන් මුහුණ දී සිටී. එහෙත් රෝගය පාලනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ආණ්ඩුව සූදානම් නැත. ඒ රටේ ආර්ථිකය කඩාවැටී ඇති බව කියමිනි. මේ ව්‍යසනය පාලනය කිරීම සඳහා වහාම රට වසා තැබීමකට යා යුතු යැයි, සියලුම දෙනා කියද්දී ආණ්ඩුවේ ප්‍රතිචාරය වූයේ ආර්ථිකය අවදානමක තිබෙන නිසා 'පූර්ණ වසා තැබීමක්' කළ නොහැකි බවය. රට වැසීම නිසා ආදායම් අහිමි වන අයට සහන දීමට ආණ්ඩුවට නොහැකි බවය.

අපේ රටේ ආර්ථිකයට සිදුවී තිබෙන විනාශයේ තරම අයෙකුට ඉන් හොඳින්ම වටහා ගත හැක. සති දෙකක් රටක් වසා තැබා එරට ජනයාගේ මූලික අවශ්‍යතා ඉටුකිරීමට නොහැකි ආර්ථිකයක් අපට කුමකටද? මේ ප්‍රශ්නය මෙතෙක් රට පාලන කළ පාලකයින්ගෙන් ඇසිය යුතුව තිබේ.

එපමණක් නොවේ. තම වැටුප් විෂමතාවය ඉවත් කරන ලෙස ඉල්ලා පසුගිය දිනවල ගුරුවරු හා විදුහල්පතිවරු විශාල උද්ඝෝෂණයක් කරන ලදී. වසර කිහිපයත් තිස්සේ නොවිසඳී තිබෙන එම ඉතාම සාධාරණ ඉල්ලීම ඉටුකිරීමට ආණ්ඩුව සූදානම් නැත. ගරු-විදුහල්පති ඉල්ලීම සාධාරණ බව පවසන ආණ්ඩුව කියන්නේ එය ඉටුකිරීමට මේ මොහොතේ මුදල් නොමැති බවය. ගුරු-විදුහල්පතිවරුන්ගේ එම සාධාරණ ඉල්ලීම ඉටුකිරීමට නොහැකි තරමට රටේ ආර්ථිකය බිඳවැටී තිබේනම් එය අපේ රටේ මෙතෙක් අනුගමනය කළ ආර්ථික ප්‍රතිපත්තියේ වරදක් මිස ගුරුවරුන්ගේ හෝ විදුහල්පතිවරුන්ගේ වරදක් නොවේ. ඊට වගකිව යුත්තේ මේ විනාශකාරී වැරදි ආර්ථිකය පවත්වාගෙන ආ සියලුම ධනපති ආණ්ඩුය.

මේ වනවිට බඩු මිල වේගයෙන් ඉහළ යන්නට පටන්ගෙන තිබේ. එය පාලනය කිරීමට ආණ්ඩුව අසමත්ව තිබේ. ආණ්ඩුවේ තුනෙන් දෙකේ බලයත් ගෝඨාභයගේ සුපිරි විධායක බලයත් ඉහළ යන බඩු මිල හමුවේ 'අසරණ' වී තිබේ. දැන් බඩු මිල අඩු කිරීමේ ගැසට් නිකුත් වන්නේ නැත. ජනාධිපතිගේ විධායක 'චණ්ඩි පාට්' දැන් පෙනෙන්නට නැත. මිල පාලනය බාර ඇමතිවරුම කියන්නේ තමන්ට කළ හැකි කිසිවක් නොමැති බවය. ඒ ඇයි? ආණ්ඩුවේ වැරදි ආර්ථික ක්‍රියාමාර්ග ඊට හේතුවී තිබේ. මේ, රටේ භාණ්ඩ හා සේවා වැඩි වී නොතිබියෙදී මුදල් අච්චු ගැසීමේ ප්‍රතිඵලයය. විදෙස් සංචිත බිඳවැටීම නිසා රුපියල අවප්‍රමාණය වීමද බඩු මිල වැඩිවීමට හේතුවී තිබේ.



වත්කම් උපයනවා වෙනුවට ණයට කෑමට පුරුදු වූ පාලකයන් කලක් උදම් ඇනුවේ තමන්ට ඕනෑතරම් ණය ගැනීමට හැකි බව පවසමිනි. දැන් ණය ගෙවීමේ කාලය පැමිණ තිබේ. ණය ගැනීමේ පුරාජේරු කතා දැන් අවසන්ය. දැන් ඇසෙන්නේ ණය ගෙවීමට නොහැකියාවේ අඳෝනාය. විදෙස් මුදල් නොමැතිකමින් භාණ්ඩ ගෙන්වීම සීමා කිරීමට සිදුවී තිබේ. ණයට තෙල් ගත හැකිදැයි උදය ගම්මන්පිල ඇමතිවරයා තෙල් රටවල් ඉදිරියේ යදින තත්වයට පත්ව තිබේ. "අපට සල්ලි තියෙනවා සල්ලි හොයන්න අපි දන්නවා" ආදී පුරසාරම් දෙසූ ඇමතිවරු දැන් සද්ද නැත. වැරදි ආර්ථික ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල අවසානයේ භුක්ති විඳීමට සිදුව ඇත්තේ පොදු ජනතාවටය.

මුදල් අච්චු ගැසීම ප්‍රශ්නයක් නොවන බවත් ඉන් උද්ධමනය ඇති නොවන බවත් පැවසූ ආර්ථික ඔස්තාර්ලා දැන් නිහඬය. වැඩිවන බඩු මිල දරාගැනීමට සිදුව ඇත්තේ පොදු ජනතාවටය. බොරු කතාවලින්, පම්පෝරිවලින්. අර්බුදයෙන් මිදීමටද නොහැක. සිදුවන්නේ අර්බුදය තව තවත් උග්‍රවී පැමිණීම පමණි. මෙරට ජනතාව දැන් මුහුණ දෙමින් සිටින්නේ එම බේදවාචකයටය. ගෙවුණු 73 වසරක් තුළ, විශේෂයෙන් ගෙවුණු වසර 40 වසරක් තුළ මෙරට පාලනය කළ සියලුම අණ්ඩු ලංකාවේ ආර්ථිකය ගොඩනැගුවේ නැත; ඊනියා විවෘත ආර්ථිකයේ 'හාස්කම්' පිළිබඳ විශ්වාස කරමින් එම වැරදි ආර්ථික මඟේම රට ඇදගෙන ගියේය. රට සතුව තිබූ නිෂ්පාදන මාර්ග, කර්මාන්ත, එක්කෝ විකුණා දමමින්, නැත්නම් බිඳවැටීමට ඉඩ හරිමින් විදෙස් ණය මත පමණක් විශ්වාසය තබා කටයුතු කළේය.

වසර 40ක් පමණ තිස්සේ ණයට ගත්, විශේෂයෙන් 2005 කාලයේ සිට විදේශ වාණිජ බැංකුවලින් වැඩි පොලියට කෙටිකාලීනව ණයට ගත් ඩොලර් බිලියන දහස් ගණනක් වූ ණය කන්දරාවකට සිදුකළේ කුමක්ද? ඉන් කිසිදු නිෂ්පාදන මාර්ග යක් ආරම්භ කළේ නැත. ඒ වෙනුවට එම ණය විවිධ ඉදිකිරීම්වලට යොදවමින්. ඒවායේ කොන්ත්‍රාත්තු පවා විදෙස් සමාගම්වලට ලබා දෙමින් එම ණය කන්දරාව නාස්ති කළේය. ඉන් විශාල ප්‍රමාණක් කොමිස් කුට්ටි ලෙස ආණ්ඩුවල නායකයෝ යටිමඩි ගසා ගත්තෝය. අවසානයේ දැන් ණය කන්දේ බර ජනතාව මත පැටවී තිබේ. මෙරට ආර්ථිකයේ බේදවාචකය එය වේ.

ජනතාව මේ මොහාතේ මුහුණ පාන සියලු ආර්ථික ගැටලුවලට මුල මෙම වැරදි ආර්ථික ක්‍රමයත් බලයේ සිටි අයෙගේ මුග්ධ පාලන ක්‍රමයත්ය. අධ්‍යාපනය සඳහා සෞඛ්‍ය සේවය සඳහා, ප්‍රවාහනය හා ගමනාගමනය සඳහා ජනතාවට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩ සාධාරණ මිලකට සැපයීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන්කළ නොහැකි ආර්ථිකයක් පවත්වාගෙන යාම සාධාරණ වන්නේ කෙසේද? එහෙත් කණගාටුවට කරුණ නම් මෙරට සියලු ධනපති පක්ෂවල නායකයෝ මේ ආර්ථික මඟ හැර වෙනත් මඟක් නොදැකීමය.

සැබෑ ලෙසම රාජපක්ෂ පාලනය ඇතුළු මෙරට පාලනය කළ සියලු දෙනාට ආර්ථික දැක්මක් තිබුණේ නැත. රටේ තිබෙන ස්වභාවික සම්පත් හා මානව සම්පත කළමනාකරණය කොට නිෂ්පාදන ආර්ථිකයක්, වත්කම් උපයන ආර්ථිකයක් නිර්මාණය කිරීමට දැක්මක් හෝ වුවමනාවක් ඔවුන්ට නොවීය. ඔවුන්ගේ පංති වුවමනාව සමග ආර්ථිකයේ සාධාරණත්වය ගැලපෙන්නේ නැත. ඔවුන් මෙතෙක් කටයතු කළේත් දැන් කටයුතු කරමින් සිටින්නේත් කොමිස් කුට්ටි මත යැපෙන කොන්ත්‍රාත්කරුවන් ලෙස හා රටේ සම්පත් විකුණා ඉන් තම කොටස ලබාගන්නා බ්‍රෝකර්වරුන් ලෙසය. රට දිළිඳුභාවයට පත්වෙද්දී ඔවුන් ධන කුවේරයන් වී ඇත්තේ මේ නිසාය.

මෙරට ජනයා වර්තමානයේ මුහුණදෙන සියලුම ගැටලුවලට එනම් අධ්‍යාපන, සෞඛ්‍ය, ප්‍රවාහන, නිවාස, වැටුප්, ආදායම්, රැකියා නැතිකම, පොහොර නැතිකම ආදී සියලු ප්‍රශ්නවල මූලික හා ප්‍රධාන හේතුව රට ආර්ථික වශයෙන් විනාශයට ලක්වීමය. මෙතරම් සම්පත් තිබෙන රටක් හිඟමනට වැටීම කිසිසේත් සාධාරණය කළ නොහැක. එයට මුළුමනින්ම පාලක පංතීන් වගකිව යුතුය. සත්‍යය එයයි.

පවතින විනාශකාරී අර්බුදයට හේතුව පුද්ගල කේන්ද්‍රීය සාධක මත පැටවීම හෝ මේ අර්බුදයෙන් ගොඩ ඒමට නැවත ඉන්ද්‍රජාලිකකයින් සෙවීම තවදුරටත් පලක් වන්නේ නැත; එය අවිද්‍යාත්මකය. දැන් මෙරට ජනයා ඉදිරියේ ඇති එකම විකල්පය වන්නේ මේ වැරදි කොල්ලකාරී ආර්ථික ප්‍රතිපත්තියත්, පාදඩකරණයට ලක්වූ දේශපාලන සංස්කෘතියත් වෙනස් කළ හැකි නව දේශපාලන මඟකි. ඒ ඔස්සේ ප්‍රතිපත්තිමය දේශපාලනයක රට හැරවීමය. ඒ සඳහා ජ.වි.පෙ. ප්‍රමුඛ මෙරට වමේ ප්‍රගතිශීලී බලවේගය පිළිබඳ විශ්වාසය තැබීම හැර අන් විකල්පයක් ජනතාවට නැත.

> වසර 40ක් පමණ තිස්සේ ණයට ගත්, විශේෂයෙන් 2005 කාලයේ සිට විදේශ වාණිජ බැංකුවලින් වැඩි පොලියට කෙටිකාලීනව ණයට ගත් ඩොලර් බිලියන දහස් ගණනක් වූ ණය කන්දරාවකට සිදුකළේ කුමක්ද? ඉන් කිසිදු නිෂ්පාදන මාර්ගයක් ආරම්භ කළේ නැත. ඒ වෙනුවට එම ණය විවිධ ඉදිකිරීම්වලට යොදවමින්. ඒවායේ කොන්ත්‍රාත්තු පවා විදෙස් සමාගම්වලට ලබා දෙමින් එම ණය කන්දරාව නාස්ති කළේය. ඉන් විශාල ප්‍රමාණක් කොමිස් කුට්ටි ලෙස ආණ්ඩුවල නායකයෝ යටිමඩි ගසා ගත්තෝය. අවසානයේ දැන් ණය කන්දේ බර ජනතාව මත පැටවී තිබේ.





Yes We Can

# ඉල්ලා අස්වීම...

බල්ලා මැරෙන්න ළංවන විට මැක්කෝ හෙමීට බැස යති. ඉල්ලා අස්වීම් බොහෝමයක යථාර්ථය එයයි. ගෝඨාභය පාලනයේ පිරිහීම පෙන්නුම් කරන ලක්ෂණ අතර මෙවැනි ඉල්ලා අස්වීම්ද කැපී පෙනේ.

ගෝඨාභය පාලනය දිනවීම වෙනුවෙන් බොහෝ කණ්ඩායම් වැඩ කළහ. බොහෝ දෙනා වැඩකළේ පටු පෞද්ගලික හා දේශපාලන අරමුණු පෙරදැරිවය. ඉතා සුළු පිරිසක් ගෝඨාභය ගැන යම් බලාපොරොත්තුවක් සහිතව වැඩ කළේ ඔහු මේ ධනේශ්වර සමාජයේම යම් ප්‍රගතිශීලී කර්තව්‍යයන් ප්‍රමාණයක් ඉටු කරාවිය යන බලාපොරොත්තුවෙනි. ඡන්දය දුන් බොහෝ පිරිසක් සිතුවේ තම ප්‍රශ්නවලට යම් හෝ සාධනීය පිළිසරණක් ලැබෙනු ඇතැයි කියාය.

නමුත් පළමුවෙන්ම ඉල්ලා අස්වූයේ එසේ අවංක චේතනාවෙන් ඡන්දය දුන් ඡන්දදායකයින්ය. මීළඟට ඉල්ලා අස්වූයේ ගෝඨාභයගේ දේශපාලන භාවිතාවට තවදුරටත් පැවැත්මක් නැති බව දන්නා දේශපාලනය හොඳටම කිරා මැන බලාගැනීමට හැකි, තිබුණු කොයි ආණ්ඩුවත් නියෝජනය කළ සටකපට මන්ත්‍රීවරයෙකි. ඉන්පසු ඉල්ලා අස්වූයේ ජාතිය බේරාගැනීම වෙනුවෙන් ලැබුණු අවසාන අවස්ථාව පාවිච්චි කරන ලෙස සිංහල ඡන්දවලට ඇප වූ සංඝයා වහන්සේලාය.

මෙසේ ක්‍රමානුකූලව මැක්කන් එකා දෙන්නා ඉල්ලා අස්වෙන්න පටන්ගත්තේ බල්ලා මැරෙන බව පසක් වූ නිසාය. නමුත් කූට ව්‍යාපාරිකයින් ලේ උරාබොන කිනිතුල්ලන් සේ තාම එල්ලී සිටින්නේ දුර්වල වීමද තම ලාභය සඳහා වාසිදායක කර ගත හැකි නිසාය. නමුත් ප්‍රචාරක කොන්ත්‍රාත් භාරගත් කූට ව්‍යාපාරිකයින්ගේ තත්වය වෙනස්ය. මන්දයත් ඔවුන්ට තිබෙන්නේ පාලකයා වෙනුවෙන් මතවාද හදා ඒවා අලෙවි කිරීමටය. යූ ටියුබ්, ෆෙස්බුක් ඒ සඳහා කදිම වෙළෙඳපොළවල් ලෙස ඔවුහු භාවිතා කරති; භාවිතා කළෝය; අතේ පැළවෙන බොරු, ඇත්ත මෙන් ප්‍රචාරය කළෝය; විරුද්ධ මත දරන්නන්ට එරෙහිව ඉතාම නිර්දය ලෙස මඩ ප්‍රචාර ගෙන ගියෝය; නිල් චිත්‍රපට පවා නිර්මාණය කර විරුද්ධ මත දරන්නන් දුර්මුඛ කිරීමට උත්සහ දැරුවෝය; දේශපාලන ව්‍යාපාර ඉලක්ක කරගෙන ඉතාම පහත් ගීත පවා නිර්මාණය කළෝය; ගෝඨාභය ආණ්ඩුවේ පැවැත්ම වෙනුවෙන් නාග ලෝකෙන් නයි ගෙනාවෝය; කොරෝනා පැණි පවා ප්‍රචලිත කළෝය; කොරෝනා ගුරු පොකුරු නිර්මාණය කිරීමටද අසාර්ථක උත්සාහයන් දැරුවෝය.

ඒ සියල්ල සිදුකළද ගෝඨාභය තවදුරටත් විකිණිය නොහැකි අලෙවි භාණ්ඩයක් බවට පත්ව තිබේ. මේ කූට ප්‍රචාරක මුදලාලිලා ඉල්ලා අස්වන්නේ මේ නිසාය. ගෝඨා උන්මාදය තවදුරටත් අලෙවි කිරීමට නොහැකි නිසාය. එම ප්‍රචාරණ ව්‍යාපාරයෙන් තවදුරටත් ලාභ ඉපයිය නොහැකි නිසාය. මන්දයත්, සුද්ද කිරීමට හෝ බලාපොරොත්තු තැබීමට කිසිවක් ඉතුරු නොකරම, විලිසංගයකින් තොරවම රාජපක්ෂවරු රට කොල්ලකෑම සිදුකරන නිසාය. ලේ උරාබීම වෙනුවෙන් දත කාගෙන අවසානය තෙක් සිටීමට උත්සාහ දැරූවද කිනිතුල්ලන් එකා දෙන්නාද දැන් බැසයන්නේ බල්ලාගේ මරණය ගැන අසුභ අනාවැකි පළකරමිනි.

දැන් ලාභ ලැබිය හැක්කේ ගෝඨා විරෝධය අලෙවි කිරීමෙන්ය. ගෝඨා විරෝධී බලවේග හා එක්වීමෙන්ය. එම නිසා මෙවැනි ඉල්ලා අස්වෙන්නන් (මැක්කන් හා කිනිතුල්ලන්) ගැන නිවැරදි දේශපාලන ස්ථාවරයන් මත සිට කිරා මැනගනිමින්, මෙවැනි කූට වුවමනාවන් මෙන්ම මේ කූට හා ව්‍යාජ සමාජ ක්‍රමය පැරදවීම අප කාගේත් වගකීම වන්නේය. අවදියෙන් සිටිමු! ශක්තිමත් වෙමු!

# පරාජය අවජාතක කළ ඇමති ජයග්‍රහණය සාක්කුවට දා ගනී!


දිනෙන් දින ඔත්පල කරන රටේ අනාගතය හමුවේ බලාපොරොත්තු බිඳවැටෙන, ජීවත්වීමේ අයිතිය පවා අවිනිශ්චිත වුණු, සියල්ලෙන් පරාජය වන ශ්‍රී ලාංකිකයන් පසුගිය30 වැනිදා නවමු හුස්මක් ලැබුවේ දිනේශ් ප්‍රියන්ත විසින් ජපානයේ ටෝකියෝ නුවරදී පැවැත්වුණ 2020 පැරාඔලිම්පික් උලෙළේ එෆ් 46 කාණ්ඩයේ පිරිමි හෙල්ල විසිකිරීමේ ඉසව්වේ රන් පදක්කම මෙරටට දිනාදීමත් සමඟය. ලංකා ඉතිහාසයේ ප්‍රථම පැරාඔලිම්පික් රන් පදක්කම මෙරටට දිනාදීමට අනුරාධපුර, කාගම පදිංචි දිනේෂ් ප්‍රියන්ත හේරත් එලෙස සමත් වූයේ නව ලෝක වාර්තාවක්ද තබමිනි. ජයලැබූ සැණින් නාමල් රාජපක්ෂ ක්‍රීඩා අමාත්‍යවරයා වීඩියෝ තාක්ෂණය ඔස්සේ ඔහුට සුබ පැතීය. දිනේෂ්ද අදහස් දක්වමින් විශේෂ ස්තූතියක් පළ කළේ ක්‍රීඩා අමාත්‍යවරයාටය. ඒ, ඔවුන්ට අවශ්‍ය සියලු පහසුකම් සැපයීම හා උපකාර කිරීම සම්බන්ධවය. ඒත් සමඟම මතකය විහිදුණේ පසුගිය ටෝකියෝ ඔලිම්පික් තරගයට සම්බන්ධ සිද්ධියක් වෙතය.




එම ඔලිම්පික් තරගාවලියට මෙරට නියෝජනය කරමින් දක්ෂ ක්‍රීඩා ක්‍රීඩිකාවන් 09දෙනෙකු සහභාගි වුවද මෙවර අපේක්ෂා කළ අන්දමින් ජයග්‍රහණ වාර්තා කිරීමට ඔවුහු අපොහොසත් වූහ. පවතින කෝවිඩ් වසංගතය අභිමුව අතිදුෂ්කර වටපිටාවක ඔවුන්ට මෙරට නියෝජනය කරන්නට වූයේ අවම පහසුකම් මධ්‍යයේය. නිමාලි ලියනාරච්චි අතිදක්ෂ ධාවන ක්‍රීඩිකාවට සුදුසු පාවහන් යුගලක් නොතිබීම, ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට රටේ අනන්‍යතාව නිරූපණය වන අයුරින් ක්‍රීඩා නිල ඇඳුමක් නොමැති වීම ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය මූලික පහසුකම් පවා සැපිරී නොමැතිව තිබීම සම්බන්ධයෙන් රට තුළ විශාල කතිකාවතක් ඇති විය. ඒත් සමඟ ක්‍රීඩා ඇමතිවරයා ඇතුළු ක්‍රීඩා අමාත්‍යාංශයට ජනතාවගෙන් පහර පිට පහර එල්ල වූයේ මෙලෙස නිල ඇඳුමක් පවා නොමැතිව අන්ත දුගී ලෙස රටක් නියෝජනය කරමින් එම ඔලිම්පික් තරඟාවලිය නැරඹීම සඳහා සියලු පහසුකම් ඇතිව 60කට අධික කාර්යමණ්ඩලයක් ටෝකියෝ යෑමය.

මෙම සිද්ධිය ඉදිරියේ කල්මරමින් සිටි ක්‍රීඩා ඇමතිවරයා ඊට පිළිතුරු සැපයීමට වේදිකාව කරගන්නේ පාර්ලිමේන්තුවය. ඒ, සියලු වරද එම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කරමත පටවමිනි. එසේම මුළු රටක් නියෝජනය කරමින්, 'ඔලිම්පික්' ධාවන තරගයකට" මුහුණදීමට යන ගමනට නිමාලි ලියනාරච්චි ක්‍රීඩිකාව තමන්ගේ පාවහන් ගෙදර තබා ගොස් ඇතැයිද ඇය ඇතුළු ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙම ටෝකියෝ ගමන විනෝද චාරිකාවක් කරගෙන තිබූ බවටද චෝදනා කරමිනි. තමාට පවා අනුග්‍රාහකත්වය දැක්වූයේ ඔවුන් සමඟ ගිය වෙනත් ඇමතිවරයෙක් බවත්, යටත් පිරිසෙන් බොහෝමයක් ටෝකියෝ ගියේ වෙනත් පෞද්ගලික වුවමනාවන්ට, ඔවුනොවුන්ගේ වියදමින් බවත් කියුවේ ඔහුය. ඔහු චෝදනා කළේ තමන්ගේ අමත්‍යංශය විසින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට සියලු පහසුකම් ලබාදුන් නමුත් ඔවුන් ඒවා භුක්තිවිඳ නැති බවටය. නමුත් ඇය තමන්ට හිමි සපත්තු දෙක තම ක්‍රීඩා දිවියේ මෞලි මංගල්‍යයට ගියේ හදවතට තුරුල් කරගනිමින්ය. ඈත දුෂ්කර සූරියවැව ගමේ සිට පැමිණ ජපානයේ ටෝකියෝහිදී මෙරට නියෝජනය කරන්නට තරම් දක්ෂයෙකු වූ ඇයව පරාජයන් ඉදිරියේ ශක්තිමත් කරනු වෙනුවට ක්‍රීඩා ඇමතිවරයා කළේ සිය විලි වසාගැනීමට උත්සාහ දැරීමය; රටක් ඉදිරියේ ඇය වරදකාරියක් කරවීමය; අපේක්ෂාභංගත්වයට පත්කරවීමය.

ජනතාවගේ ජීවිත සැහැල්ලු කරනවා වෙනුවට, ඔවුන්ට බදු පිට බදු පටවන, නාස්තිකාර, වංචාකාර ආණ්ඩුව සේම, විදේශිකයන් ගෙන්වමින්, මිථ්‍යාවන් වපුරමින්, කෝවිඩ් වෛරසයට පාර කැපූ එහෙත් වෛරසය ව්‍යාප්ත වීමේ සියලු වරද ජනතාව මත පටවමින් සිටින ආණ්ඩුව සේම, එහි ක්‍රීඩා ඇමතිවරයාද කළේ තම බැරිකම, ජනතා මුදල් නාස්තිය, පරාජයේ වරද ක්‍රීඩක ක්‍රීඩිකාවන් මත පටවා ජයග්‍රහණය පමණක් තම නම ඉදිරියේ ලියා ගැනීමය.



## අහෝ මෙදෙරණත

ඉතිහාස කතා
දොඩ දොඩ..
උරුමය කියා
නෙක පිළිවිස..
රජ දරු කෙරුම්
ලෝ පා
හෙළා මහ මග
නෙළූ දෑ..
වැව් දා කොත්
තබා උගසට..
ලක් මව්නි,
නුඹ හිණ බැඳි
දිස්නෙන් ලොව
මුසපත් කළ..
වී වියරු ඉහ,
කඩා දැම් යෙහෙන්
බැඳි අගන
මිණිමෙවුල..
සිරකොට සුසුම්
වළලන්ට නොදෙම්
හිවලුන්ට..




### මැසෙන්ජර් ඇප් විවෘත නොකර ඇමතීමේ පහසුව




Facebook සිය මැසෙන්ජර් ඇප් එක විවෘත නොකර ඇමතුම් ලබා ගැනීම සඳහා පහසු කිරීම අරමුණු කරගනිමින් සිය ප්‍රධාන යෙදුම තුළ හඬ සහ වීඩියෝ ඇමතුම් ලබා ගැනීම පහසුකම් සැලසීමට සූදානම් වෙයි.
ඒ අනුව ෆෙස්බුක් සිය ඇප් මාලාව තුළ පණිවුඩ හුවමාරු කර ගැනීමේ පහසුකම ලබාදීමට උත්සාහ කරමින් සිටින අතර පසුගිය සැප්තැම්බර් මස මාසයේදී instagram සහ මැසෙන්ජර් අතර ප්‍රථමයෙන් එය සක්‍රීය කළේය. මෙම පියවර නිසා එක් එක් සේවාවන් භාවිතා කරන්නන්ට ඇප් දෙකම ඩවුන්ලෝඩ් කිරීමෙන් තොරව වීඩියෝ ඇමතුම් ලබාගැනීමට සහ පණිවිඩ යැවීමට හැකියාව ලැබේ. ඔවුන් මෙම පහසුව තවත් වර්ධනය කරමින් වට්ස්ඇප් යෙදවුමද සිය ඇප් මාලාව සමග ඒකාබද්ධ කිරීමට සැලසුම් කර ඇත.

### චීන දෙවැනි අභ්‍යවකාශ මෙහෙයුම සාර්ථකයි



ෂෙන්සෝ 12 මිනිසුන් සහිත චීන අභ්‍යවකාශ ගමනේදී ගගනගාමීන් අභ්‍යවකාශයේ ඇවිදිමින් සිදු කළ සිය දෙවැනි බාහිර මෙහෙයුම සාර්ථකව ඉටුකර ඇති බව චීනයේ අභ්‍යවකාශ ඉංජිනේරු කාර්යාලය පවසයි.
චීනයේ අභ්‍යවකාශ මධ්‍යස්ථානය ඉදිකිරීමේදී ඔවුන් අභ්‍යවකාශයේ ඇවිදිමින් සිදුකළ දෙවැනි මෙහෙයුම මෙයයි. එහි පළමු වැනි ගමන ජූලි 04 සිදුවිය.

### අඩි 11,562ක උසකදී ජංගම ඩිජිටල් සිනමා ශාලාවක්




මුහුදු මට්ටමේ සිට අඩි 11,562ක උන්නතාංශයකින් පිහිටි ඉන්දියාවේ ලඩාන් පළාතේදී පසුගියදා ජංගම ඩිජිටල් සිනමා ශාලාවක් පිහිටු වන ලද බව එරට මාධ්‍ය පවසයි. ඒ අනුව ලොව ඉහළම ස්ථානයක පිටුවන ලද සිනමාශාලාව ලෙසින්ද එය වාර්තා අතරට එක් වී තිබේ. ඒ අනුව සෙල්සියස් අංශක ඍණ 28 පමණ උෂ්ණත්වයකදීද මෙහි සිනමා දර්ශන තිරගත කෙරෙන බව සඳහන් වෙයි.

### චීනයේ පළමු ජංගම වෙරළ බොරතෙල් වේදිකාව



චීනය තුළ තුළ නිපදවුණු පළමු ජංගම වෙරළ බොරතෙල් වේදිකාව පසුගියදා සිය යාත්‍රා කිරීම ආරම්භ කළේය. Hai yang shi you 163 ලෙස මේ වේදිකාව නම් කරනු ලැබ තිබේ. බොරතෙල් ඇති බව හඳුනා ගන්නා ඕනෑම ස්ථානයක් වෙත යාත්‍රා කර එම ස්ථානයේ සිට බොරතෙල් විදීමේ කටයුතු සිදුකිරීමේ හැකියාව මෙම වේදිකාව සතුය. චීනයේ නැගෙනහිර පළාතේ කින්ග්ඩාඕහි සිට එය මෙලෙස යාත්‍රා කර තිබේ. මෙම ජංගම වේදිකාවට ඕනෑම තැනකට යාමේ හැකියාව ඇති අතර යළි යළිත් භාවිතා කිරීමේ හැකියාවද සහිතව නිර්මාණය කරනු ලැබ ඇත.

# ජනතාවට අහිමි කෙරුණු කොවිඩ් නැති ජීවිතයක අයිතිය

2020 මාර්තු මාසයේ සිට මෙරට තුළ ව්‍යාප්තිය ආරම්භ වූ මාරාන්තික කොවිඩ්-19 රෝගය මේ වන විට සමස්ත ශ්‍රී ලංකාවම අකර්මණ්‍ය කරමින් ජනතාවගේ සමාජ ජීවිතය මෙන්ම ආර්ථික ජීවිතයද බිඳ වට්ටවමින් තිබේ. එදා සිට අද දක්වා රටක් ලෙස ගෙන ඇති සියලුම ක්‍රියාකාරකම්වල ලාභ අලාභ ගිණුම පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ අප සියලුම දෙනා විසින් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් ළඟා කරගෙන ඇත්තේ ලොව කිසිදු රටකට නොදෙවනි බරපතළ ලෙස සැලකිල්ලට භාජනය කළ යුතු විනාශකාරී තත්වයක් බවයි. 2021/08/27 වනවිට මෙරටින් වාර්තා පොත්වලට එක් කරනු ලැබ ඇති රෝගීන් සංඛ්‍යාව 365,683 ක් සහ මරණ 7371 කි. නමුත් රෝගයේ ව්‍යාප්තිය පිළිබඳව යම් සමාජ අවබෝධයක් සහිත සාමාන්‍ය ජනතාව අතර පවතින විශ්වාසය වන්නේ මේ වාර්තා කිසිසේත්ම නිවැරදි නොවන බවයි.

සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් මතුවන අනෙක් කාරණය වන්නේ මෙම සංඛ්‍යා පවා වාර්තා වන්නේ ඉතාමත් අවම පීසීආර් සහ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණ ප්‍රමාණයක් මත වීමයි. වාර්තා වන දත්තවලට අනුව පසුගිය සතිය තුළ කොවිඩ් පරීක්ෂණයන්හි සාමාන්‍යය වන්නේ දිනකට පරීක්ෂණ 20,000ක් පමණ ප්‍රමාණයකි. ඒ අනුව දෛනිකව 4000 ක් ඉක්මවූ ආසාදිතයන් ප්‍රමාණයක් වාර්තා වන්නේ මෙම පරීක්ෂණ ප්‍රමාණය තුළ වීම විශේෂත්වයකි. නමුත් සත්‍ය ලෙසම පරීක්ෂණ වැඩිකිරීමෙන් සහ ඒ මත සත්‍ය සංඛ්‍යා දත්ත මත පදනම් වන්නේ නම් මෙම අගය 40% ඉක්මවා යනු ඒකාන්තය. එය ඉතාමත් ඉහළ අගයක් වන අතර, මෙක්සිකෝ රාජ්‍යය වැනි රටක පමණක් අත්දැකිය හැකි විශේෂිත තත්වයක් බව වැටහෙනවා ඇතැයි සිතමු. මෙවැනි පවතින තත්වයට ඉතාමත් නොගැලපෙන අවම පරීක්ෂණ ප්‍රමාණයක් සිදුකරන්නේද, දැනට ගොඩනගා ඇති පරීක්ෂණාගාර පහසුකම්වලට සාපේක්ෂව කළහැකිව තිබෙන පරීක්ෂණ ප්‍රමාණය 40,000ක් පමණ තිබියෙදී වීමද විශේෂත්වයකි.

ලංකාවේ කොවිඩ් වසංගතය පිළිබඳව නිවැරදි චිත්‍රය දැකීමට නම් රෝගීන් සංඛ්‍යාවත්, රෝගීන්ගේ ව්‍යාප්තියත්, නිවැරදිව අධ්‍යයනය කළ යුතුය. එමගින් ලංකාව තුළ රෝගයේ ව්‍යාප්තිය මට්ටම තීරණය කිරීම පහසු වනු ඇත. මේ වන විට තවමත් "කොවිඩ් පොකුරු" යන නාමය භාවිතා කළද, එදිනෙදා හමුවන සියලුම රෝගීන්ගේ පාහේ ඔවුන්ට රෝගය ව්‍යාප්ත වූයේ කවරකුගෙන්ද යන්නත් ඔවුන්ගෙන් රෝගය ව්‍යාප්ත වී ඇත්තේ කවරකුටද යන්නත් කිසිසේත්ම හඳුනා ගත නොහැකි තත්වයක් මතුව තිබේ. මෙම තත්වය "පොකුරු" මට්ටමින් ඔබ්බට ගිය "සමාජ ව්‍යාප්ති මට්ටම" ලෙස විද්‍යාත්මකව නාමකරණය කරනු ලැබේ. එහිද ඉතා විශාල රෝගීන් ප්‍රමාණයක් වාර්තා වන මෙම තත්වය "සමාජ ව්‍යාප්ති මට්ටම- 4 ලෙස හඳුනාගත හැකිය. වසංගත රෝග මර්දනය පිළිබඳව ඇති මූලික නියාමයන්ට අනුව මෙය ඉතාමත් නරක ව්‍යාප්ති මට්ටමක් වන අතර මිනිස් ජීවිත ආරක්ෂා කර ගැනීම සඳහා විශාල කැපවීමක් කල යුතුය.






"කොවිඩ් සදාකල්හිම පැවති ගැටලු විශාල කර පෙන්වන්නා වූ පුදුමාකාර කණ්ණාඩියකි. මිනිසුන් මියයන්නේ කොවිඩ් හේතුවෙන් නොවේ. ඔවුන් මියයන්නේ වර්ගවාදයෙනි; ආර්ථික අසමානතාවය හේතුවෙනි. එසේම එය කොවිඩ් සමග නතර නොවනු ඇත."

**සහය මහාචාර්ය ශ්‍රෙයා කන්ගෝවි**
**පෙන්සැල්වේනියා විශ්වවිද්‍යාලය**

## සෞඛ්‍ය සේවයේ ධාරිතාවය සහ මානව සම්පත

"ශ්‍රී ලංකාවේ තත්වය" පිළිබඳව අවබෝධ කර ගැනීමේදී ලංකාවේ සෞඛ්‍ය පද්ධතියේ ශක්‍යතාවය පිළිබඳවද සැලකිල්ලට ගත යුතුය. මේ පිළිබඳව කරනු ලබන සාකච්ඡාවලදී බොහෝ අමාත්‍යවරුන් සහ නිලධාරීන් විසින් මතු කරනු ලබන කාරණයක් වන්නේ මේ වන විට ලංකාවේ සෞඛ්‍ය සේවයේ ධාරිතාවය ඉක්මවා යමින් තිබෙන බවයි. නමුත් ඇත්ත වශයෙන්ම තේරුම් ගත යුතු කාරණය වන්නේ ලංකාවේ සෞඛ්‍ය සේවයේ ධාරිතාවය ඉක්මවා ගොස් බොහෝ කල් වන බවයි. මෙම රෝග යේ මර්දන ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍ය වන මහජන සෞඛ්‍ය සේවයේ ධාරිතාවය එනම් දිනකට රෝගීන් පරීක්ෂණවලට ලක්කල හැකි ප්‍රමාණය, ආශ්‍රිතයන් හඹා යා හැකි ප්‍රමාණය, ඔවුන් නිරෝධායනයට ලක්කල හැකි ප්‍රමාණය, ඒ සඳහා භාවිතා කළ හැකි අවකාශයන් ඉක්මවා ගොස් බොහෝ කල්ය. ඉන් පසුව රෝහල්වල ප්‍රතිකාර සඳහා යොමුකරන රෝගීන් වෙනුවෙන් ඇති දැඩි සත්කාර ඒකකවල ධාරිතාවය ඉක්මවා ගොස් ඇත. අනෙකුත් සාමාන්‍ය රෝගීන් වෙනුවෙන් වෙන් කිරීමට ඇති දැඩි සත්කාර ඇඳන් පවා මේ වන විට කොවිඩ් රෝගීන් වෙනුවෙන් වෙන් කෙරෙමින් තිබේ. එයද ඉතාමත් ඉක්මනින් අවසන් වනු ඇත. ඉන් පසුව රෝහල් වල පවතින කොවිඩ් ආසාදිත නේවාසික රෝගීන් සඳහා වෙන් වූ ඇඳන් ප්‍රමාණයේ ධාරිතාවය ඉක්මවා ගොස් තිබේ. එම තත්වය ඉතාමත් අවාසනාවන්ත තත්වයක් බවට පත්කරමින්, කිසිදු ආකාරයක වෙන්කර තැබීමේ පහසුකමක් නැති නිවාස තුළ ආසාදිතයන් රඳවමින් රෝගයේ ව්‍යාප්තියට නව වේගයක් අත්පත් කර දෙමින් තිබේ. මේ අනුව රෝගයට "ප්‍රතිචාර දැක්වීමේ හැකියාව" අතින් ගත්කල සියලු අංශයන්ගෙන් 'සීමිත' තත්වයට පත්ව ඇත. එබැවින් දැන් අපි කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය අනුව සැලකීමේදී "භයානක 04 වැනි අවධියට" ළඟා වී සිටිමු.


සෞඛ්‍ය සේවයේ ධාරිතාවය පිළිබඳව සැලකීමේදී මේ වන විටත් වෛද්‍යවරුන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හෙද හෙදියන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවට සහ ඔවුන්ට රාජකාරී කළ හැකි ප්‍රමාණයට වඩා රටේ සෞඛ්‍ය අවශ්‍යතාවය ඉහළ ගොස් ඇති පසුබිමක වුවද වෙහෙස නොබලා දිවා රාත්‍රී කරනු ලබන කැපවීම හේතුවෙන්ම ජනතාවට සහ ආණ්ඩුවට ඒ පිළිබඳව සිතීමට හෝ අවශ්‍ය වී නැත. නමුත් මේ වන විටත් ධාරිතාවය ඉක්මවා රාජකාරී ඉටුකර ඇති දැඩි ලෙස වෙහෙසට පත්ව සිටින මෙම මානව සම්පත තවදුරටත් රෝග ව්‍යාප්තිය ඉහළ යත්ම කිසිවක් කරගත නොහැකි තත්වයකට පත්වනු නොඅනුමානය.

## එන්නත්කරණය

එන්නත්කරණය පිළිබඳව මහජන අවශ්‍යතාවය සහ විශ්වාසය විවිධ කණ්ඩායම් විසින් අවභාවිතා කරමින් තිබේ. රෝගය ව්‍යාප්ත වීම ඇරඹුණු මුල් වකවානුවේ සිටම ආණ්ඩුවේ ප්‍රධානීන්ගේ මඟ පෙන්වීම මත මුට්ටි ගඟට දැමීම, ධම්මික පැණිය, රිටිගල පැණිය, තරංගා පැණිය, කරාපිටියේ කරල, මෙන්ම දුම්හට්ටි ඇල්ලීම ආදී ප්‍රතිකාර පවතින බවත් රෝගය නිට්ටාවට සුව කිරීමට ඒවාට හැකියාවක් ඇති බවත් සෞඛ්‍ය ඇමතිනිය, දේශීය වෛද්‍ය අමාත්‍යවරයා, ඖෂධ සම්බන්ධ රාජ්‍ය ඇමතිවරයා මෙන්ම නොයෙක් විද්වතුන් පවා ජනප්‍රිය එහෙත් වගකීම් විරහිත මාධ්‍යද භාවිත කරමින් ගෙනගිය අවිද්‍යාත්මක ක්‍රියාමාර්ගයත්, ලෝකයේ සෑම රටක්ම එන්නත් මිලදී ගනිද්දී ඒ පිළිබඳව අවම උත්සාහයක් හෝ නොගැනීම මත එන්නත් ලැබීමේ ප්‍රමාදයත්, මිලදී ගත් සහ ප්‍රදානයන් ලෙස ලැබුණු එන්නත් තොග විද්‍යානුකූල ප්‍රමුඛතා පදනමක් මත ලබානොදී ආණ්ඩුවේ දේශපාලනඥයන්ගේ මැදිහත්වීමෙන් විවිධ කණ්ඩායම්වල පුද්ගලික අවශ්‍යතාවයන් වෙනුවෙන් සහ දේශපාලන ප්‍රවර්ධනයන් වෙනුවෙන් බෙදාගනිමින් සිදු කළ අවිචාරවත් ක්‍රියාකලාපයත් මෙයට හේතු වී තිබේ. ඒ හේතුවෙන් ලක්ෂ 20-22 ක් පමණ වන වයස අවුරුදු 65 ට වැඩි ජනගහනයද මේ දක්වාම සම්පූර්ණ ලෙස එන්නත්කරණය නොවූ කණ්ඩායමක් ලෙස ඉතිරිව සිටියි.

අප විසින් භාවිතා කර ඇති එන්නත් වර්ග සියල්ලම සම්බන්ධයෙන් ප්‍රතිශක්තිය ලැබූ ලෙස සැලකිය හැක්කේ එන්නත් මාත්‍රා දෙකම ලබා ගත් පිරිස පමණි. මේ වනවිට යටත් පිරිසෙයින් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබා ගත් පිරිස ජනගහනයෙන් 58% වන නමුත් මාත්‍රා දෙකම සම්පූර්ණ කර ඇත්තේ ජනගහනයෙන් 20% ක් පමණකි. ජනගහනයෙන් 80% ක් අදටත් ප්‍රතිශක්තිකරණයට ලක්ව නැති බව පැහැදිලිය. ජනගහනයෙන් 58% ක් සඳහා එන්නත් මාත්‍රා දෙකම ලබා දීම සඳහා අනිවාර්ය ලෙසම සැප්තැම්බර් මසයද ඉක්මවන බව ආණ්ඩුවම පවසයි. එනම් ජනගහනයෙන් 70%ක් සඳහා එන්නත් මාත්‍රා දෙකම මේ මොහොතේ ලංකාවට රැගෙන ආවද එය සම්පූර්ණ කිරීමට අවම වශයෙන් ඔක්තෝබර් දක්වා බලා සිටීමට සිදුවේ. ඒ දක්වා කාලය තුළ වෛරසය තම කාර්යය සම්පූර්ණ කරගනිමින් ජීවිත දහස් ගණනකට මරු කැඳවනු නොඅනුමානය. එන්නත් මාත්‍රා දෙකම ගත් නමුත් සෑම පුද්ගලයෙක්ම එක හා සමානව ප්‍රතිශක්තීකරණයට ලක් වී ඇතැයිද කිව නොහැකිය. ලංකාවේ බහුලව භාවිතා කළ සයිනොෆාම් එන්නතහි කාර්යක්ෂමතාවය 79% ක් පමණ වන අතර ඒ අනුව සැබෑ ප්‍රතිශක්තීකරණයකට ලක් වන්නේ එන්නත් කරන පුද්ගලයන් ප්‍රමාණයට වඩා අඩු සංඛ්‍යාවක් බව පැහැදිලිය. විද්‍යාත්මකව සැලකීමේදී සමාජීය ප්‍රතිශක්තිය ඇතිවීමට නම් සමස්ත ජනගහනයෙන් අවම වශයෙන් 70% ක් හෝ ප්‍රතිශක්තීකරණයට ලක්ව සිටිය යුතුය. තවමත් අප රටට එවැනි එන්නත් ප්‍රමාණයක් ලබා ගැනීමට ආණ්ඩුව සමත්ව නැත.

ඇත්ත තත්වය නම් මේ මොහොතේ එන්නත් මාත්‍රා දෙකම ලබා ගත් අය පවා එන්නත විශ්වාස කර සාමාන්‍ය ජන ජීවිතය පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය රීති අත්හැර කටයුතු කළහොත් එමගින්ද යළි විනාශයට ලක්වීම වැළැක්විය නොහැකිය. මතුව ඇති ප්‍රධානම ගැටලුව වන්නේ එන්නත් ප්‍රමාණවත් පරිදි නොමැති අවස්ථාවකදී වුවද මියයන්නේ එන්නත් ලබා නොගත්තවුන් බවත් එන්නත් කාඩ් පත් රහිත පිරිස පාරට බැස්සොත් අත්අඩංගුවට ගන්නා බවත් පවසමින් ජනතාවට තර්ජනය කිරීමයි. එමගින් "සාමකාමී ලෙස" පවත්වා ගත යුතු එන්නත්කරණ ක්‍රියාවලිය "අසහනකාරී" වුවමනාවක් බවට පත්වීම වැළැක්විය නොහැකිය.




## ලංකාවේ කොරෝනා නව ව්‍යාප්තිය

කොවිඩ්-19 වෛරසයේ ඩෙල්ටා ප්‍රභේදය මෙරටට ඇතුළු වූයේ අහම්බයකින් නොවේ. එය අත්වැරැද්දක්ද නොවේ. වෛද්‍ය විද්‍යා මූලධර්මවලට අනුව, එය ඇත්ත වශයෙන්ම රෝගය ආනයනය කර ගැනීමකි. ලෝකයේ මේ මොහොතේ සංචාරක කර්මාන්තය පිළිබඳව හෝ මෙම වෛරසයේ හැසිරීමේ ස්වභාවය පිළිබඳව කිසිදු ආකාරයක විමසීමකින් තොරව ආර්ථික වුවමනාවක් වෙනුවෙන් මෙරටට ගෙන්වූ යුක්රේන සංචාරකයන්ගෙන් මෙම නව ප්‍රභේදය රට තුළට එන්නට ඇතැයි යන මතය කිසිසේත්ම බැහැර කළ නොහැකිය. ඔවුන්ව ගෙන්වීමට අමතරව ඔවුන් මගින් රෝගය ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා නිසි අවස්ථාවේ නිසි තීරණ නොග ැනීමත් මෙරට තුළ වෛරස ව්‍යාප්තිය උපරිම මට්ටමකට ගෙන ඒමට සමත්ව තිබේ. මෙම ඩෙල්ටා ප්‍රභේදය මෙරට

10 වැනි පිටුවට

# ඇමරිකාවේ ඉවත්වීම හා තලේබාන් පාලනය මැද ඇෆ්ගනිස්ථාන ජනතාවගේ ඉරණම



සැප්තැම්බර් ප්‍රහාරයට සම්බන්ධ ත්‍රස්තවාදය විනාශ කිරීම සඳහා ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කළ එක්සත් ජනපද හමුදා තලේබාන් ත්‍රස්තවාදීන්ට ඇෆ්ගනිස්ථානය අත්පත් කරගැනීමට ඉඩදී එරටින් සිය හමුදා ඉවත් කර ගෙන තිබේ.

එක්සත් ජනපදයට ඇෆ්ගනිස්ථානය තුළින් තම හමුදා ඉවත් කර ගැනීමට සිදු වූයේ ඇෆ්ගන් ජනතාවගේ විරෝධය නිසා හෝ තලේබාන්වරු හෝ වෙනත් කණ්ඩායමක් විසින් එල්ල කරන ලද ප්‍රහාරයන් නිසා හෝ නොවේ. බැලූ බැල්මට පෙනී යන්නේ ඔවුන් ඇෆ්ගනිස්ථානය අත් හැර දමා යන ආකාරයකි. ඔවුන් ඇෆ්ගනිස්ථානය අත්හැර දමන්නේ එක්සත් ජනපද හමුදා ඇෆ්ගනිස්ථානයෙන් පිටවූ පසු යළි එහි බලය ලබා ගන්නේ තලේබාන්වරුන් බව නොදැන නොවේ. තලේබාන් ත්‍රස්තවාදය විනාශ කිරීමට පැමිණි එක්සත් ජනපදය තලේබාන්වරුන්ට ඇෆ්ග නිස්ථානය තුළ බලය ලබා ගැනීමට ඉඩ දී ඉන් ඉවත්ව යන අතරම තමන් ඇෆ්ගනිස්ථානයෙන් හමුදා ඉවත් කර ගන්නේ තම ඉලක්කයන් සපුරා ගැනීමෙන් පසුවයයි ප්‍රකාශ කරයි. එසේනම් එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීමේ අරමුණ කලින් ප්‍රකාශ කළ පරිදි ත්‍රස්තවාදය විනාශ කර දැමීම විය නොහැකිය. එසේනම් එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කිරීමේ අරමුණ වන්නට ඇත්තේ කුමක්ද?

අනෙක් අතට පැන නැගෙන ප්‍රශ්නය වන්නේ ඇෆ්ගනිස්ථානය තුළින් නැගෙන ප්‍රබල විරෝධයකින් තොරව එක්සත් ජනපදයට ඇෆ්ගනිස්ථානයෙන් තම හමුදා ඉවත් කර ගැනීමට සිදු වන්නේ මන්ද යන්නයි. තවද ඇෆ්ගනිස්ථානය තලේබාන්වරුන් අතට පත් වීමට ඉඩ හරිමින් එක්සත් ජනපදය ඉන් ඉවත්ව යන්නේ කිසියම් දෙවන සැලැස්මක් නොමැතිවමද? එය හුදු අහිංසක හමුදා ඉවත් කර ගැනීමක් පමණක්ද?

### සම්පත් පිරුණු රටක්

ඇෆ්ගනිස්ථානය බටහිරින් ඉරානයෙන්ද දකුණින් පකිස්ථානයෙන්ද උතුරින් තුර්ක්මෙනිස්තානය, උස්බෙකිස්ථානය හා තජිකිස්ථානයද ඊසාන දිගින් චීනයෙන්ද මායිම් වූ භූමියෙන් වටවූ රටකි. මධ්‍යම ආසියාව දකුණු ආසියාව හා සම්බන්ධ කරන එහි පිහිටීම විසින් එයට විශාල උපක්‍රමික වැදගත්කමක් ගෙන දී තිබේ. එපමණක් නොව ඇෆ්ගනිස්ථානය ඛනිජ තෙල් ඇතුළු ඛනිජ සම්පත්වලින්ද පොහොසත් රටකි. ඇෆ්ගනිස්ථාන භූමියේ රත්රන්, ප්ලැටිනම්, රිදී, තඹ, යපස්, ක්රෝමයිට්, ලිතියම්, යුරේනියම්, ඇළුමිනියම් ඇතුළු ඛනිජ නිධි විශාල ප්‍රමාණයක් පවතී. එක්සත් ජනපද භූ විද්‍යා සමීක්ෂණ ආයතනයට අනුව ඇෆ්ගනිස්ථානය තුළ තඹ මෙට්‍රික් ටොන් මිලියන 60ක් යපස් ටොන් බිලියන 2.2ක් දුර්ලභ මූල ද්‍රව්‍ය ටොන් මිලියන 1.4ක් ඇත. පිහිටීමේ උපක්‍රමික වැදගත්කමත් සම්පත් බහුලතාවත් ඇෆ්ගනිස්ථානය දියුණු රටක් බවට පත්කරනවා වෙනුවට ලෝක බලවතුන් විසින් එය යුද පිටියක් බවට පත් කරනු ලැබ තිබේ. ඇෆ්ගනිස්ථානු ජනතාවට සාමකාමී සෞභාග්‍යමත් රටක් වෙනුවට උරුම වී ඇත්තේ යුද්ධයත්, සාගතයත්, අපේක්ෂාභංගත්වයත් කැටුව යන ඛේදවාචකයක් පමණි.

ඇෆ්ගනිස්ථානය රාජ්‍යත්වය අහෝසි කරමින් ජනාධිපතිවරයෙකු යටතට පත් වන්නේ 1973දී දියත් කෙරුණ කුමන්ත්‍රණයක ප්‍රතිපලයක් ලෙසිනි. 1978 දී ඇෆ්ගනිස්ථාන් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකත්වයෙන් සිදු කෙරුණ අප්‍රේල් විප්ලවය මගින් එරට සමාජවාදී පාලනයක් පිහිටුවන ලදී. එහෙත් එකී පාලනයේ අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් 1979 වසරේදී සෝවියට් හමුදා මැදිහත් කිරීමට සිදුවිය. ඇෆ්ගන් සමාජවාදී පාලනයට එරෙහිව එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන් විසින් මුජාහිදීන් ත්‍රස්තවාදීන් බිහිකළ අතර සෝවියට් හමුදා ඉවත් වීමෙන් පසු හා 1992දී එරට සමාජවාදී පාලනය බිඳ වැටීමෙන් අනතුරුව බලය අත්පත් කර ගත්තේ එකී මුජාහිදීන් ත්‍රස්තවාදීන්ය. පසුව මුජාහිදීන් පාලනය පලවා හැර 1996 වසරේදී තලේබාන් සංවිධානය ඇෆ්ගනිස්ථානයේ බලය තහවුරු කර ගත්තේය. තලේබාන්වරුන් යටතේ ඇෆ්ගනිස්ථානය ෂරියා නීතිය ක්‍රියාත්මක වන ඉස්ලාම් රාජ්‍යයක් බවට පත් විය. එක්සත් ජනපදය 2001 වසරේදී ඇෆ්ගනිස්ථානය ආක්‍රමණය කරන්නේ 9/11 ප්‍රහාරයට වගකිව යුතුයැයි කියවෙන අල් කයිඩා ත්‍රස්තවාදීන් ඇතුළු මුස්ලිම් ත්‍රස්තවාදය විනාශ කිරීමටය.

එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානයෙන් පිටවීමෙන් පසු තලේබාන්වරු ඇෆ්ගනිස්ථානය තුළ යළිත් වරක් ඉස්ලාම් රාජ්‍යයක් පිහිටුවා ගෙන තිබේ. තලේබාන්වරුන්ගේ පාලනය පිළිබඳවත් ඉදිරියේදී වර්ධනය විය හැකි තත්වයන් පිළිබඳවත් අවසානාත්මක අදහසක් ඉදිරිපත් කිරීමට තවම ඉක්මන් වැඩි නමුත් ඉන් ඉදිරියේදී සිදු විය හැකි දේ පිළිබඳ කෙටි සාකච්ඡාවක් කර ගැනීමේ හැකියාව නැති නොවේ.

### ජාත්‍යන්තර හා කලාපිය බලපෑම

එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානයෙන් ඉවත්ව යාමට බලපෑ හේතු පිළිබඳ අදහස් පළ කරන දේශපාලන විචාරකයෝ ඊට හේතු විය හැකි ප්‍රධාන සාධක දෙකක් ඉදිරිපත් කරති. පළමුවැන්න නම් එකසත් ජනපදයට තිබූ යුද වියදම් අඩු කිරීමේ වුවමනාවයි. පසුගිය කාලය තුළදී වර්ධනය වූ ආර්ථික අර්බුදය හේතුවෙන් හා ධනපතියන්ට ලබා දුන් බදු සහන හේතුවෙන් ඔවුන්ගේ රාජ්‍ය ආදායම සැලකිය යුතු ලෙස අඩු වී තිබේ. එමෙන්ම ඇමරිකන් සොල්දාදුවන්ගේ මරණ ප්‍රමාණයද ඊටම අදාළ වේ. දෙවැනි සාධකය වන්නේ එක්සත් ජනපද යුද ප්‍රමුඛතාවන්ගේ වෙනස් වීමයි. මේ වනවිට එක්සත් ජනපදයේ යුද ප්‍රමුඛතාව දකුණු චීන මුහුදු ප්‍රදේශයටත් බෝල්ටික් ප්‍රදේශයටත් ලෙස වෙනස් වී තිබේ.

ඇෆ්ගනිස්ථානය තුළ තලේබාන් සංවිධානයේ නායකත්වයෙන් ඉස්ලාම් අන්තවාදී පාලනයක් ස්ථාපිත කෙරෙන්නේ ඉස්ලාම් අන්තවාදය ජාත්‍යන්තර දේශපාලනය තුළ පරාජයට පත් වෙමින් තිබෙන මොහොතකදීය. තලේබාන්වරුන්ගේ නව ඉස්ලාම් අන්තවාදී පාලනය ලොව පුරා පැතිරී සිටින ඉස්ලාම් අන්තවාදී කණ්ඩායම් වෙත නව බලාපොරොත්තු දල්වන්නක් වීමට ඉඩ තිබේ. ඒ අතරම ඔවුන්ට මතවාදීමය, සදාචාරමය හා ද්‍රව්‍යමය ආධාර සැපයෙන මධ්‍යස්ථානය ඇෆ්ගනිස්ථානය බවට පත් වීමට ද ඉඩ තිබේ.

ජාත්‍යන්තර දේශපාලනයේදී එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන්ගේ ප්‍රධාන ගැටුම මේ මොහොතේදී ගොඩනැගී ඇත්තේ චීනය හා රුසියාව සමගයි. චීනය හා රුසියාව තුළ ද ඉස්ලාම් අන්තවාදී සංවිධාන ක්‍රියාත්මක වී සිටින අතර විශේෂයෙන් චීනයේ උයිගර් ප්‍රදේශයේත් රුසියාවේ චෙච්නියාවේත් ගැටුම් ක්‍රියාත්මක වන්නේ එක්සත් ජනපද ආශිර්වාදයද ඇතිවය. මෙම ගැටුම් යළිත් උත්සන්න වීමට වර්ධනය වෙමින් පවතින තත්වය හේතු වීමට පුළුවන. මීට අමතරව බහුතර මුස්ලිම් ජනතාවක් ජීවත් වන තුර්ක්මෙනිස්තානය, උස්බෙකිස්ථානය, තජිකිස්ථානය, කසක්ස්ථානය, හා කිර්ගීසියාව වැනි මධ්‍යම ආසියානු රටවල ඉස්ලාම් අන්තවාදය වර්ධනය වීමට ඉඩ තිබේ. එපමණක් නොව දකුණු ආසියානු කලාපයේ ඉන්දියාව, බංගලිදේශය, මාලදිවයින වැනි රටවලට මුස්ලිම් අන්තවාදය විසින් ඇති කරන තර්ජනය තවත් ඉහළ යනු ඇත.

ඇෆ්ගනිස්ථානයෙන් එක්සත් ජනපද හමුදා ඉවත් වීමත් තලේබාන්වරුන් යළිත් බලයට පත් වීමත් සමග සරණාගතයන් පිළිබඳ ගැටලුවද යළිත් වටයකින් උග්‍රවී තිබේ. එය පළමුව අසල් වැසි රටවලටත් පසුව යුරෝපයටත් ප්‍රබල ගැටලු ඇති කරනු ඇති බවට දැනටමත් අනාවැකි පළවී තිබේ. මේ අනුව පෙනී යන්නේ ඇෆ්ගනිස්ථානය තුළින් එක්සත් ජනපද හමුදා ඉවත් වීමත් තලේබාන්වරුන් යළි බලයට පත් වීමත් විසින් ජාත්‍යන්තර දේශපාලනයේත් කලාපීය දේශපාලනයේත් සිවිල් යුද තත්වයන් වැනි සමාජයීය හා දේශපාලනික අර්බුදයන් ගණනාවකට ඉඩ විවර කර ඇති බවය.

### ඉරණම විසඳීම

ලෝක අධිරාජ්‍යවාදී බලවතුන්ගේ සහ ඔවුන් විසින්ම පෝෂණය කර ඇතිදැඩි කරන ලද අන්තවාදී සංවිධානයන්හි ක්‍රියාකාරිත්වයෙන් බරපතල ලෙස ම පීඩාවට පත්ව සිටින්නේ ඇෆ්ගන් ජනතාවයි. ඔවුහු එක් පැත්තකින්, දශක ගණනාවක් තිස්සේ යුදමය විනාශයකට ගොදුරු වී සිටිති. අනෙක් අතට තම මූලික අවශ්‍යතාවන් පවා සම්පූර්ණ කර ගත නොහැකිව, මූලික මිනිස් අයිතිවාසිකම් පවා අහිමිව ත්‍රස්තවාදී සංවිධානයක අණසකට යටත්ව දිවි ගෙවීමට සිදුවී තිබේ. ඔවුන්ට උරුම කර ඇති මෙම ඛේදවාචකයේ වගඋත්තරකරුවන් වන්නේ අන්තවාදී ත්‍රස්තවාදී සංවිධාන සහ එම සංවිධාන බිහිකර පෝෂණය කළ අධිරාජ්‍යවාදීන් වන නමුත් මෙම ඛේදවාචකය පරාජයට පත්කරමින් තම නිදහසත් ස්වාධීනත්වයත් දිනාගත හැක්කේ ඇෆ්ගන් ජනතාවටමය. එය වෙනත් රටවලට හෝ අන්තවාදී සංවිධානවලට ලබා දිය නොහැකි දෙයක් බව ඉතා පැහැදිලිය.

## ඩෙන්මාර්කය: හෙද හෙදි වැඩවැරුම දිග්ගැස්සී



ඩෙන්මාර්කයේ හෙද වැඩවර්ජනයට මේ වන විට මාස දෙකකට වැඩි කාලයක් ගත වී තිබේ. ඒ අනුව එය ඩෙන්මාර්ක් ඉතිහාසයේ දීර්ඝතම වැඩවර්ජනය බවට පත්ව තිබේ. හෙදියන් මෙලෙස වැඩවර්ජනයේ යෙදී සිටින්නේ වැටුප් වැඩි වීමක් සහ පවත්නා වැටුප් පරතරය අඩු කරන ලෙසත් ඉල්ලා සිටිමින්ය.

2021-2024 සාමූහික ගිවිසුම ප්‍රතික්ෂේප කළ හෙදියන් ගැටලුවට සාධාරණ විසඳුම් නොලැබුණහොත් වැඩවර්ජනයකට යන බව ප්‍රකාශ කර සිටියේ පසුගිය අප්‍රේල් මාසයේදීය. ඩෙන්මාර්කයේ හෙද හෙදියන් 5000ක් පමණ සිටින අතර ඔවුහු සියලු දෙනාම ඩෙන්මාර්ක් හෙද සභාව ලෙස එකම වෘත්තීය සමිතියක් තුළට සංවිධානය වී සිටිති. ඔවුන්ගේ ඉල්ලීම් අතරට කොවිඩ් 19 වසංගතය හමුවේ හෙද වෘත්තීය මත පැටවූ දුෂ්කර කාර්යභාරය පිළිගන්නා ලෙසත්, බඳවා ගැනීම් ඉහළ දමන ලෙසත් වන ඉල්ලීම් එක් කර තිබේ.

## ඉරානය: කොවිඩ් හා සම්බාධක පීඩාව මැද



අගෝස්තු මාසයේ දී ඉරානයේ කොවිඩ් 19 මරණ සංඛ්‍යාව 100 000 ඉක්මවා ගියේය. ඉරානය තුළ මේ දිනවල පැතිරී යන්නේ පස්වැනි කොවිඩ් රැල්ලයි. එය ජූනි මස අග භාගයේ සිට ඩෙල්ටා ප්‍රභේදයේ පැතිරීමත් සමග ආරම්භ විය. මැදපෙරදිග කලාපය තුළ වැඩිම කොවිඩ් 19 මරණ සංඛ්‍යාවක් සහ රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ ඉරනයෙනි. මේ වනවිට කොවිඩ් 19 රෝගය මිලියන 4.5කට වැළඳී ඇත. එක්සත් ජනපදය විසින් ඉරානය මත පනවා ඇති සම්බාධක හේතුවෙන් එරට ආර්ථිකය දැඩි ලෙස බිඳ වැටී ඇති අතර එන්නත්කරණය ඇතුළු කොවිඩ් 19 වසංගතය පාලන කටයුතු කරගෙන යාම බොහෝ සෙයින් අඩාල වී තිබේ.

## කියුබාව: ඔලිම්පික් උළෙලේ දස්කම් දක්වා



විශාල සහ දියුණු ධනපති රටවලට සාපේක්ෂව කියුබාව විසින් මෙවර ඔලිම්පික් තරගාවලියේදී කැපී පෙනෙන ජයග්‍රහණයක් අත්කර ගනු ලැබ තිබේ. එක්සත් ජනපද සම්බාධකවලින් පීඩා විඳිමින් සිටින මිලියන 11ක් වැනි කුඩා ජනගහනයක් ඇතුව සිටින කියුබාව රන් පදක්කම් 07ක් රිදී පදක්කම් 03ක් සහ ලෝකඩ පදක්කම් 05ක් දිනා ගනිමින් වැඩිම පදක්කම් ප්‍රමාණයක් ලබා ගත් 14 වැනි රට බවට පත් ව සිටී.

කියුබාව මෙවැනි ජයග්‍රහණයක් අත්කරගත් පළමු අවස්ථාව මෙය නොවේ. 2004 වසරේ ඇතන්ස්හි පැවති උළෙලේදී පදක්කම් 27ක් දිනා ගනිමින් 11වන ස්ථානයද 2008 වසරේදී පදක්කම් 30ක් දිනාගනිමින් 19 වන ස්ථානයටද 2012 වසරේදී පදක්කම් 15ක් දිනා ගනිමින් 16 වන ස්ථානයටද පත් වී තිබේ.

## බ්‍රිතාන්‍යය: පරිසරවේදීහු වීදි බැස



පසුගිය අගෝස්තු 24 වන දා ලන්ඩන් නුවර Trafalga චතුරශ්‍රය අවහිර කරමින් පරිසරවේදීන් විසින් පවත්වන ලද විරෝධතාවකදී උද්ඝෝෂකයන් 50ක් පමණ අත්අඩංගුවට ගනු ලැබිණි. Extinction Rebellion නම් වූ එකී පරිසර සංවිධානයේ ඉල්ලීම වී තිබුණේ ෆොසිල ඉන්ධන දහනය වහා නවතා දමන ලෙසය. මෙවර ග්‍රීෂ්ම ඍතුවේදී තුර්කිය, ග්‍රීසිය, ඉතාලිය, ස්පාඤ්ඤය, කැනඩාව වැනි රටවල ලැව් ගිනි විශාල වශයෙන් ඇති වී තිබුණි. ඊට හේතුව වී ඇත්තේ ගෝලීය උණුසුම ඉහළ යාමයි. ෆොසිල ඉන්ධන දහනය ගෝලීය උණුසුම ඉහළ යාම සඳහා ප්‍රබල හේතුවක් වී ඇතැයි පරිසරවේදීහු පවසති.

# ලංකාව ගිල දමන "වසංගත ධනවාදය"

ලෝකය පුරා පැතිරී යන කොරෝනා (කොවිඩ් 19) වසංගතය දැන් ධනවාදයට වසංගතයක් වී ඇති බව මෙන්ම කඩා වැටෙන ධනපති ක්‍රමය දැන් වසංගතය, තමන්ගේ පැවැත්මට නව ජාවාරමක්, නව වෙළඳපොළවල් හදා ගැනීමේ අලුත් ක්‍රමයක් බවටද පත්කරගෙන ඇත. ඒ නිසා අලුතින් සොයා ගන්නා නව එන්නත්වල සිට කාඩ්බෝඩ් මිනී පෙට්ටිය දක්වා හැම දෙයක්ම වසංගතය විසින් හඳුන්වා දුන් වෙළඳ භාණ්ඩ වී තිබේ. ඒ අතරේ මුඛ ආවරණ, අත් සෝදන සබන්, විෂබීජ නාශක, ඔක්සිජන් ලබාදීමේ උපකරණ, හුස්ම ගැනීම යන්ත්‍ර ඔක්සිජන් මානක ආදී මෙකී නොකී බොහෝ උපකරණ අද වෙළඳපොළේ විකිණෙන්නේ ව්‍යාපාරිකයාගේ හිතේ ඇඳෙන මිලටය; කේවල් කිරීමක් නැත. ධනපති ප්‍රබලයෝ වෙළඳපොළේද ප්‍රබලයෝය. මේ ධනපති සමාගම් තම වෙළඳපොළෙන් දුප්පත් රටවලට විකුණයි. දුප්පත් රටවල ප්‍රබලයෝ තවත් ලොකු ගාණක් ලාභ තබාගෙන තමන්ගේම රටේ දුබලයාට වැඩි මිලට විකුණයි. ලංකාවේද රු. 250ට පමණ ගෙනා ඇන්ටිජන් පරීක්ෂණ කට්ටලය රු. 2000ට විකිණෙන්නේ ඒ නිසාය.

ඇන්ටිජන් අද ලංකාවේ කඩා වැටෙමින් සිටි ධනපති පංතියේ ගජ මිතුරන්ගේ කොටස් වෙළඳපොළ ඉහළ නංවන ප්‍රතිකාරකයකි. හෝටල් නිරෝධායන මධ්‍යස්ථාන ලෙස පවත්වාගෙන යාමද එලෙසමය. සංචාරකයින් විදේශවලින් නොපැමිණියත් සල්ලි ටිකක් ඇති දේශීය කොවිඩ් රෝගීන් අද ඔවුන්ගේ "සංචාරක රෝගීන්"ය. "වසංගත ධනවාදය" පැතිරෙන්නේ ඒ ආකාරයටය. රටේ ජනතාවට සංචරණය සීමා කළත් සංචාරකයින් ජෛව බුබුලක් ලෙස හෝ පාවාඩ එලා කැඳවා ගත්තේය. ඒ " වසංගත සංචාරය" සඳහාය. ධනවාදය මිල කළ හැකි සියල්ල මිල කරන්නේය. දැන් වසංගතයද වෙළඳපොළේ ඇති නැති පරතරය අනුව බෙදාහරිනු ලැබෙන් තිබේ. වසංගත ධනවාදය ක්‍රියාත්මක වන්නේ එලෙසිනි. එන්නතේ සිට මිනී පෙට්ටිය දක්වා ඒ වෙළඳපොළට අදාළය.



"ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 'ස්ථාවරකරණ වැඩසටහන්' යනු රටවල් වෙළඳපොළ නැමති මුහුදේ උඩ විසිවෙමින් පවතින නැව්වලට සමාන කරමින් ක්‍රියාත්මක වන්නකි. ඒවා මගින් අවසාන වශයෙන් රටවල් ස්ථාවර කරනු ඇති නමුත් රාජ්‍ය සේවකයින්, කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්, සහන ලබන ගොවීන්, කම්කරුවන් ඇතුළු මිලියන සංඛ්‍යාත ජනතාවක් නැව මතුපිටින් තල්ලු කර හරිනු ඇත. මේ 'ස්ථාවරකරණයේ' තිත්ත ඇත්ත වනුයේ එයින් අති බහුතරයකට නැවත කිසිදා නැවට නැග ගත නොහැකි වනු ඇති බවයි."

**නයෝමි ක්ලේන්**

**කැනඩා ජාතික කතුවරියකි, වාමාංශික සමාජ ක්‍රියාකාරිනියකි**

## අඩු ආදායම්ලාභී නිරෝධායනය


වෛරසය කාටත් එකට සලකන්නේ යැයි කිව හැක්කේ වෛරයට ගොදුරු වන ඇමතිවරයාටද, මගියාටද, යාචකයාටද ලැබෙන ප්‍රතිඵලය මියයාම විය හැකි නිසාය. නමුත්, මියයන තෙක් ගමන හෝ රෝගී අයෙකු නිරෝගී වන තෙක් ගමන් මඟ සැකසී ඇත්තේ එක ලෙස නොවේ. එය ආර්ථික ශක්තිය, දේශපාලන බලය, වැනි බොහෝ සාධක මත රඳා පවතී. සමහරුන්ට පොසිටිව් වූ කල ගෙදර සිටියාටත් වඩා හොඳින් පහසුකම් සහිතය. බලය, ධනය නැති දුප්පතාට ඒ වෛරසයම පොසිටිව් වූ කල ඉන්න නිවසේම තදබල අමාරුවක් වන තුරු පවුලේ සැම සමග වෛරසය බෙදාහදා ගනිමින් සිටිය යුත්තේය. ආණ්ඩුව නිරෝධායනය වන සෑම පවුලකටම රු. 10,000ක වියළි ආහාර මල්ලක් ලබා දීමේ කටයුත්තක් ක්‍රියාත්මක කළේය. එහි පදනම වූයේ, ඔවුන් නිවසින් එළියට යාම වළක්වාලීමය. එය සෞඛ්‍යාරක්ෂිත අවශ්‍යතාවයක් විය. නමුත්, ආණ්ඩුව දැන් එය අඩු ආදායම්ලාභීන්ට පමණක් වන ලෙස කප්පාදු කර ඇත. දැන් අනෙකුත් අඩු ආදායම් ගණයට නොවැටෙන අය නිරෝධායනය වන අතරේම, තමන්ට අවශ්‍ය ආහාර ලබා ගැනීමට, වෛරසය සමග එළියට යා යුතුය. නැත්නම් සල්ලි තිබුණද බඩගින්නේ සිටිය යුතුය. ආණ්ඩුවේ නැතිබැරියාවට උත්තර සොයා ඇත්තේ එලෙසිනි.

## කොරෝනා ජීවන බර

කොරෝනාව විසින් ආර්ථිකයේ අර්බුදයට අලුත් එකතු කිරීම් කර ඇති බව නොරහසකි. ලංකාවට එයින් සෘජු ලෙසම බලපෑමක් කළේ සංචාරක කර්මාන්තයටය. සංචාරක ක්ෂේත්‍රයේ මහා හෝටල් මෙන්ම, කුඩා පරිමාණයේ හෝටල්ද සෆාරි වාහනයක් කුලියට ගෙන රැකියාව කළ අයටද එපමණක් නොව හික්කඩුවේ වෙරළේදී තනි තනිව සංචාරක මඟ පෙන්වීම් කළ අයටද එයින් බඩේ පහර වැදුණි. ආර්ථිකයට ලැබෙන ඩොලර් නතර වීම පමණක් නොව සෘජුව හා වක්‍රව ජීවන වෘත්තියේ යෙදුණු බොහෝ දෙනෙකුට කබලෙන් ලිපට වැටීමට සිදුවිය. ආණ්ඩුවක් ලෙස කළ යුතු වූයේ ඔවුන්ට අවශ්‍ය සහෝගයක් ලබා දී කොරෝනා වසංගතයෙන් බේරීමට ලොක්ඩවුන් කාලයේදී ජීවිත රැක ගැනීමට සහනයක් ලබා දීමය. ආණ්ඩුව ඒ වෙනුවට කරමින් ඉන්නේ ඔවුන් ලබාගෙන ඇති ණයට තව පොලියක් එකතු කර ණය කාලය දික් කරන අලුත් ණය හඳුන්වා දීමය. මහා පරිමාණ හෝටල් නිරෝධායන මධ්‍යස්ථාන ලෙස වෙන් කරදී, කාමරවලට දිනකට රු. 7,500 සිට සුඛෝපභෝගී කාණ්ඩය දක්වා විවිධ මිල ගණන් අයකර ගජමිතුරන්ගේ හෝටල් කර්මාන්තය රැක දුන්නද පුංචි ව්‍යාපාරිකයා සහ තනි තනි ලෙස සංචාරක වෘත්තියට දායක වූ මහ ජනතාවකට අද වනවිට කිසිදු හව් හරණක් නැත.

## අර්බුදයට ණය ගැනීම

73 වසරක අසාර්ථක පාලනයේ ප්‍රතිඵලවල බැටන් පොල්ල 2020දී මාරුකරගත් ගෝඨාභය රාජපක්ෂ පාලනය, පාලනය බාර ගැනීමේ තම ප්‍රීතිය ප්‍රකාශයට පත්කළේ රු.බිලියන 500කට වැඩි බදු ආදායම් ප්‍රමාණයක් කපා හැර තම ගජ මිතුරන් පිනවීමෙනි. ඒ එක් බදු කපා හැරීමක සහනයක් ඡන්දය දී ඔවුන් බලයට පත් කළ ජනතාවට නොලැබිණි. නමුත් ඒ අහිමි කළ ආදායම වෙනත් අලුත් ක්‍රම මගින් ආණ්ඩුව අයකර ගත්තේ සාමාන්‍ය ජනතාව මගිනි. එයින් ඇරඹී සෞභාග්‍යයේ නව ගමන මේ වනවිට ආර්ථිකයේ සෘජු 3.6%ක ප්‍රකාශිත කඩාවැටීමකට ලක්කර ඇත. (අප්‍රකාශිත ඇත්ත කඩා වැටීම මීට වැඩිය.) බලය ගන්නා විට පැවති ඩොලර් බිලියන 7.6ක පමණ විදේශ වත්කම් සංචිතය මේ වනවිට 2.7කට තරම් පහළ මට්ටමකට ඇද වැටී අවසන්ය. ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වලට අනුව ලංකාව තවදුරටත් ණය ගෙවීමට හැකියාව නැති රටවල් අතර ඉදිරියෙන්ම ඇති රටකි. ඒ නිසා පැන නැගි ඩොලර් අර්බුදය අද වනවිට ඉහළ සුපර් මාර්කට් සිට ගමේ සිල්ලර කඩේ භාණ්ඩ හිඟයක් දක්වාම පහළට දැනී අවසන්ය.




ආණ්ඩුව මුලින්ම කළේ ආනයනික වාහන හා වාහන අමතර කොටස් ගෙන්වීම සීමා කිරීමය. එයින් ඩොලර් ඉතිරි කර ගැනීමට උත්සාහ කළේය. නමුත් ගෙවිය යුතු ණය වාරික හා පොලියේ තරමට එයින් ඉතිරියක් නොවීය. 2020 වසරේදී, 2019ට වඩා ආනයන සඳහා දරන ලද ඩොලර් වියදම් ඩොලර් මිලියන 3882කින් අඩුකරගත හැකි වුවද, 2020දී අපනයන ආදායමද ඩොලර් මිලියන 1893කින් පහළ ගියේය. ආණ්ඩුවට ඒ නිසා අපේක්ෂා කළ තරමේ වාසියක් ලබා ගැනීමට නොහැකි විය.

2021දී තවත් ඩොලර් බිලියනයක ස්වෛරී බැඳුම්කර කල්පිරීම සමග ණය ගෙවා ගැනීමට සිදුවීමේ ඛේදවාචකය තවත් උත්සන්න විය. 2018 වසරේ අප්‍රේල් මාසයේදී ඩොලර් බිලියන 9.9ක පැවති විදේශ වත්කම් සංචිතය 2021 අප්‍රේල් වන විට 6.4ක් දක්වා කඩා වැටුණි. දැන් 2022 සිට 2025 දක්වා වසර 04ට තවත් ඩොලර් බිලියන 23ක් ණය වාරික හා පොලිය ගෙවිය යුතුය. එය වසරකට අසන්න ලෙස බිලියන 5.7කි. නමුත් දැනටමත් ඇත්තේ 2.7ක පමණ අගයකි. තවත් ඇති රත්‍රං සහ සියලු වත්කම් එකතු කළද එය ඩොලර් බිලියන 4ක් පමණ වනු ඇත.

කඩා වැටෙන ආර්ථිකයේ අර්බුදයේ තරම පිළිබඳ දළ චිත්‍රයක් ලබා ගැනීමට 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාස 4ක කාලයේදී තත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශය නිකුත් කළ රාජ්‍ය මූල්‍ය තත්වය 2021 වාර්තාව වුවද ප්‍රමාණවත්ය. එහි, 2021 මුල් මාස 04 සඳහා රජයේ ආදායම හා ප්‍රදානයන් රු. බිලියන 482ක් වන විට, වියදම රු. බිලියන 1002කි.

ණය ගැනීම පමණක් දේශීය මූල්‍යයන්ගෙන් පමණක් රු. බිලියන 1397කි. විදේශීය ණය රු. බිලියන 127කි. ආදායම් ජනිත නොවී වියදම් කිරීමට සිදුවීම පියවා ඇත්තේ බිලියන ගණන් මුදල් අච්චු ගසා ගැනීමෙන් බව මින් පැහැදිලිය. මේ දේශීය මූල්‍යයන්ගෙන් ණය ගැනීම යනු මහ බැංකුව විසින් සිදු කළ නව මුදල් මුද්‍රණය කිරීමය. එක් දිනකදී රු. බිලියන 20කට වඩා මුදල් මුද්‍රණය කළ බව පසුගියදා වාර්තා විය. රට ඉහත ඉදිරිපත් කර ඇත්තේ කොරෝනා වසංගතයේ 04වැනි රැල්ල ආරම්භ වන මොහොත දක්වාය. දැන් අප ගත කරන්නේ සැප්තැම්බරයේය. අප්‍රේල් සිට අගෝස්තු දක්වා ආර්ථික දත්ත තවම ප්‍රකාශයට පත්වී නැත. නමුත්, මේ වනවිට ආර්ථිකයේ වෙළඳපොළේ සිදුවන කඩා වැටීම කොරෝනා පැතිරෙන වේගයටත් වඩා වැඩි වේගයකින් අප වෙත ගලා එමින් තිබේ; දැනෙමින් තිබේ. වංසගතයේ හානියද ජීවන බරේ හානියද කිරා මැන බැලීමට බැරි තරම්ය.

## සීනි කෑ අන්දරේලා!

අන්දරේ සීනි කෑවේ රජතුමා රවටන්නටය. අද රජතුමා සමග එකතුවී සිටින කපටි අන්දරේලා ජනතාව රවටා මංකොල්ලකෑමට සීනිවලින් ගසා කමින් සිටිති. වසංගතයේ හිරවී ලොක්ඩවුන් නිසා දෛනිකව ආදායමක් අහිමි වී ජනතාවට දැන් සීනි මිල ඉහළ යන්නේ දිනකට ඉහළ යන කොරෝනා ආසාදිතයින්ගේ වේගයට වැඩි වේගයෙනි. කොරෝනා ආසාදිතයින් සෑම දිනකම මාධ්‍ය වාර්තා කරන්නේ එදිනට වාර්තා වන වැඩිම ආසාදිත ප්‍රමාණය ලෙසිනි. සීනි මිලද එසේමය. කිලෝවක් රු. 85 සිට දැන් රු. 230 දක්වාම ඉහළ ගොස් තිබේ; තවත් ඉහළ නගිමින් තිබේ.

ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව මුලින්ම පෙබරවාරි මාසයේදී සීනි සඳහා උපරිම සිල්ලර මිලක් නියම කළේ සීනි කිලෝවකට අයකළ රු. 50ක බද්ද ශත 25ට අඩු කරමිනි. ඒ නිසා සිදුවූ පාඩුව රු. කොටි 1,500කි. එම පාඩුව ආණ්ඩුවටය; ජනතාවටය. සතොසට සිදුවූයේ ඒ බදු වංචා කළ විල්මා ව්‍යාපාරිකයා ඇතුළු අයගෙන් වැඩි මිලට සීනි මිලදී ගෙන පාලන මිලට ජනතාවට විකිණීමටය. ඒ නිසා පාඩු වූයේ සතොසටය. එයටද රජයේ පාඩුවකි. එයද අවසානයේ ජනතාවම ගෙවිය යුතුය. පසුගිය සතියේ රු. 135ට ඉහළ ගොස් තිබූ සීනි කිලෝවක් මේ ලියන මොහොතේදී රු.230ක් වී ඇත. සතියක් තුළ රු. 55ක ඉහළ යාමකි. රු. 85ට පැවති පාලන මිල ඉවත් කළේ ඇයිදැයි එදා මාධ්‍යවේදීන් බන්දුල ගුණවර්ධනගෙන් ප්‍රශ්න කරන විට අප්‍රේල් මාසයේදී ආණ්ඩුවේ පිළිතුර වූයේ ආනයන කරන ලද සීනි මෙට්‍රික් ටොන් 90,000ක් ඇති බවත්, එම සීනි ප්‍රමාණයත් ලබන වසරේ මැයි මාසය දක්වා ප්‍රමාණවත් බැවින් යළි මිල ඉහළ යාමක් සිදු නොවන බවය. දැන් මේ ඉහළ යාමේ ප්‍රශ්නයට බන්දුල ගුණවර්ධන හෝ ආණ්ඩුවේ කිසිවෙකු පැහැදිලි කිරීම් කරන්නේ නැත. පැවති පාලන මිල ගැසට්ටුව ඉවත් කරගත් ආණ්ඩුව වෙනුවෙන් පාරිභෝගික කටයුතු භාර ඇමති දැන් කියන්නේ රු. 100කින් මිල ඉහළ ගියත් කරන්නට දෙයක් නැති

10 වැනි පිටුවට

# පොලිටිකල් පංතිය

දවසක උදේ ළමයි පංතියට එනකොටත් පොලිටික්ක හම් මල්ල මෙසෙ උඩ තියල දොර ගාවට වෙලා කොරිඩෝවට එබි එබී ඉන්නව.

"ගුඩ් මෝනිං සර්... අද මොකද සර් කුකුළත් අතේ තියන්?" අනුරුද්දියව ඉස්සර කරන ගමන් වසන්තිය එක දා ගත්ත.

"වෙරි ගුඩ් මෝනිං සර්" අනුරුද්දියත් ළඟ ළඟම ගේම් ෆිනිෂ් කළා.

"ආයුබෝවන් ළමයිනේ... මම ඔය ළමයි පරක්කු මොකද බැලුව" පරක්කුවක් නොතිබුණත් පොලිටික්කට හීන් ලැජ්ජාවකුත් ආව.

"ඇයි සර් පෙර මඟ බැලුවෙ. ලකුණු සුබයිද?" මංජුව ඇහුවෙ අහිංසකට ඇඳල වුණාට කින්ඩියට කියල හැමෝටම තේරුණා.

"පෙර මඟ සුබයි නේන්නම් දැන් බලන්න වැක්සින් එක හෝසෙට ගහගෙන යනව. බලකායෙ කට්ටිය දැන් තුන් වෙනි එකත් විදින්න ලෑස්තියි. මහ බැංකුව ණය වාරික ගෙවාගෙන යනව. කල් පිරිච්ච බැඳුම්කර බේරනව. සංවර්ධන වැඩ කෙරීගෙන යනව. නගර සීයක් ලස්සන කරන ප්‍රොජෙක්ට් එකක් යනව. පොළොන්නරුවෙ පරාක්‍රම..." පොලිටික්ක දිනමිණ පත්තරේ මුල පිටුව කියෝනව වගේ කියාගෙන ගිහින් අන්තිමට ගිල්ල.

"සර්ම කිවුව එක හොඳයි... අර මොකද්ද පරාක්‍රම සමුද්‍රය වැවට කරන්න හදන්නෙ?" මංජුව කටින් පැන්න කෑල්ල අල්ල ගත්ත.

"ඇයි මම එහෙම එකක් කිවුවද?" පොලිටික්ක ලේන්සුව අරන් කට පිහදා ගත්තෙ කටේ මොනව හරි ගෑවුණා වගෙ."මම කියන්න හැදුවෙ පොළොන්නරුවෙ පරාක්‍රම කියල මගෙ යාලුවෙක් කිවුව එහෙ වී හංගගෙන හිටපු ගබඩා බර ගාණකට පැනල ඒවා අල්ලගෙනලු. යන්තම් ඇති දැන් ඉතින් හාල් ගාණ අඩුවෙලා යයි" පොලිටක්ක වංගුව ගත්ත ගැනිල්ල තමයි ගැනිල්ල!

"නෑ සර්, මමත් දන්න කෙනෙක් ඉන්නව පොළොන්නරුවෙ පරාක්‍රම කියල. එයා කිවුව බැකෝ දාලා වැවේ රළ පනාව හාරනව කියල ජොගින් පාත් හදන්න" මංජුවත් හෙල්ල දැම්ම බිම ඇනෙන්නම.

"ඒ දන්න කෙනා මාත් අඳුරනවා. එයාගෙ නම මුලට කිං කියල කෑල්ලකුත් තියෙනව" කනියගෙ කතාවට හැමෝම හිනා පැන්න.

"ආ... කිං පරාක්‍රමබාහු... අපිත් දන්න කෙනෙක්නෙ" පොලිටික්ක වැවයි, රළ පනාවයි අතෑරල කිං අල්ල ගත්ත. "අවුරුදුම තිස් තුනක්ම රජකම් කළානෙ. අන්න ශ්‍රේෂ්ඨ රජවරු" පොලිටික්ක කිවුවෙ හරියට දැන් ඉන්න අයටත් ඉන්න පුළුවන්නම් හොඳයි වගේ.

"අන්න හරි සර්, ඒ ශ්‍රේෂ්ඨ රජවරු කරවපු වැව් බැම්වල දැන් ඉන්න දෙකයි පනහෙ රජවරු පහුරු ගානවා බළල්ලු ජරා කරන්න යනවා වගේ. එයාලගෙන්නෙ මේවා බේර ගන්න බැරි. ඇමරිකාවෙදි දැකපු ජොගින් පාත් රළ පනාවෙ ඔබන්න හදනව. සුද්දො එන්නෙ වැව බලන්න. මෙයා පෙන්නන්න හදන්නෙ ජොගින් පාත්" මංජුවත් අරින්නෙ නෑ දෙසනව.

"ළමයො සංවර්ධනේ කියන්නෙ එහෙම තමයි. අලුත් දේවල් හදන්න වෙනව. හැමදේම වෙනස් වෙනව. වෙනස් කරන්න වෙනව. එකම එනෙකුට එකම ගඟට දෙපාරක් බහින්න බෑ කියන්නෙ එකනෙ" පොලිටික්ක දකුණට කපල දර්ශනේ දැම්ම.

"සර් කියන එක හරි මංජු. ඒක තමයි හැමදාම බඩු ගන්න යනකොට මුදලාලි ගණන් වැඩි කර කර කියන්නෙ. එහෙම කරන්නෙ එකම කෙනෙකුට එකම මිලට එකම බඩුවක් දෙපාරක් ගන්න බැරිවෙන්න. සීනි කලින් ගෙනාවෙ 130ට. දැන් ගන්න යනකොට දෙසීය පැනලා. දවස ගාණෙ රුපියල් දහය ගාණෙ වැඩි වෙනව... හැම බඩුවක්ම කාටවත් කලින් ගත්ත ගාණට ගන්න බෑ... ඒක තමයි එහෙනම් හොරේ. අපි හිතුවා මේ මුදලාලි අපිට හොර කරනව කියල. බලනකොට සර්ගෙ වෙනස් වීමේ හා වෙනස් කිරීමේ ප්‍රතිපත්තිය තමයි එයා අපිට පෙන්නල තියෙන්නෙ" කනිය කියල දැම්මෙ ඇඟට පතට නොදැනි.

"අපිත් ඒකට තමයි කැමති. මිනිස්සුත් ඒක ආදර්ශෙට ගන්නවනම් හොඳයි. මිනිස්සුත් වෙනස් වෙන්න ඕනෙ. කලින් කරපු මෝඩකම් තේරුම් අරන්, හරි තැනක හිටගන්නවනම් මේක තමයි වෙලාව. එතකොට බලය දීල පත්කරපු ආණ්ඩුවත් වෙනස් වෙයි. පාලකයොත් වෙනස් වෙයි. හැම දේම වෙනස් වෙයි... වෙනස් නොවෙන්නෙ එයාලා ආපහු ඇමරිකාවට යන එක විතරයි" සමනා අන්තිම වාක්‍යය කිවුවෙ හිමින් වුණාට ගොරක කෑල්ලක් හැපුණා වගේ පොලිටික්කගෙ මූණ ඇඹුල් වෙනකොට තේරුණා, ඇහුණාම තමයි කියල.

කවුළුව හැර තබමි

# "වෙළඳපොළ සාහිත්‍යය"...





පාන් ගෙඩියේ සිට සංගීතය දක්වා සියලු මිනිස් සබඳතා අද වාණිජකරණය වී ඇත. ධනවාදය විසින් නොනවත්වාම සමාජීය වාණිජකරණය කරමින් සිටියි. 'සී' විටමින් පෙත්තේ සිට කොරෝනා රෝගියා දක්වාම අද ධනවාදයට වෙළඳ භාණ්ඩයකි. මෙම යථාර්ථය සාහිත්‍ය සහ කලා මාධ්‍යවලටත් අදාළ නොවේද? සාමාන්‍යයෙන් නිල සාහිත්‍ය කතිකාව තුළ සැප්තැම්බර් මාසය වරනගනු ලැබ ඇත්තේ සාහිත්‍ය මාසය ලෙසය. එහෙත් අද මේ කිසිවක් මිනිස් වර්ගයට අදාළ නැත. ඔවුන් අද මුහුණ දී සිටින්නේ කොරෝනා මාරයාගෙන් තම ජීවිත බේරා ගැනීමේ මාරාන්තික සටනටය.

අප දකින ආකාරයට ධනවාදයේ මේ අවධිය තුළ සාහිත්‍යය පමණක් නොව ඊට දායක වන නිෂ්පාදකයා (කර්තෘ) සහ නිෂ්පාදිතය (කෘතිය) සහ එය මිලට ගන්නා සමාජයද වාණිජකරණයට ලක්වෙයි. ඒ කියන්නේ නිදහස් වෙළඳාම සාහිත්‍ය ක්ෂේත්‍රයටද ඇතුල් වී ඇති බවය. අද බහුතරයක් සාහිත්‍යකරුවන්ගේ චින්තන සංඝටක පවා නිදහස් වෙළඳාම විසින් නැවත සංයෝජනය කළ නිර්මිතයකි.

දත් බෙහෙත්. සබන්වල සිට ඉලෙක්ට්‍රෝනික උපකරණ ආදී භාණ්ඩ පමණක් නිදහස් වෙළඳාම තුළ ප්‍රාර්ථනය කර කෙනෙකුට පැවතීමට නොහැකිය. උපත, අධ්‍යාපනය, විවාහය, ප්‍රේමය පමණක් නොව මරණය පවා අද වාණිජකරණය වී ඇත. කොරෝනා වසංගතය එය අද අපිට මනාව පසක්කර දෙමින් සිටී.

ලංකාව තුළ මේ වනවිට "සාහිත්‍යය" පාරිභෝගික භාණ්ඩයක් වීමට අවශ්‍ය සියලු කොන්දේසි සපුරමින් ඇත. ඒ අනුව ගත් කල අද ලාංකේය භූමිය තුළද සාහිත්‍යය මාසය වෙනුවෙන් පවත්වන උත්සව පොත් ප්‍රදර්ශන උසස් මානුෂීය බැඳීම් ඔප්නංවන දේ නොව වෙළඳ ගනුදෙනුවකට කොටු වූ දෙයක් යයි කීම කිසිවෙකුගේ කෝපයට හේතු නොවෙනු ඇත.

# අනේ අපි කවදාක හිනැහෙමුද ඒ රටේ...?...



ප්‍රසුගියදා මුදල් ඇමති බැසිල් රාජපක්ෂ ප්‍රකාශ කර තිබුණේ තමන්ට ලැබුණේ මුදල් නැති මුදල් අමාත්‍යාංශයක් බවයි. ඒ කියන්නේ හිස් භාණ්ඩාගාරයක් බවයි. ප්‍රශ්නය නම් හිස් භාණ්ඩාගාරය නොවේ. හිස් මිනිස්සුන්ට රට භාරදීමය. අනෙක් අතට බැසිල්ට කලින් මුදල් ඇමතිකම කළේ ඔහුගේ අයියා වන මහින්දය. එසේ නම් භාණ්ඩාගාරය අවසන් වරට හිස්කර ඇත්තේ ඔහුය.

රාජපක්ෂ ආණ්ඩුව යනු රටේ සියලුම ප්‍රධාන ආදායම් මාර්ග තම පවුලට ගලා එන සේ හරවා ගත් පවුල් පාලනයකි. එය අද ජාත්‍යන්තර තලයේ මාධ්‍යවල මෙන්ම ඇතැම් රටවල පාර්ලිමේන්තුවල පවා කතාබහ කරන මාතෘකාවක් බවට පත්වී තිබීමම මේ නරුම පාලන ක්‍රමයේ දුර්ගන්ධය පෘථිවි ගෝලය පුරාම පැතිරී යන බවට ප්‍රබල සාක්ෂියකි.

සමහර දූපත් රාජ්‍ය එම දූපත් පිටින්ම විකුණා පවුලේ ධනය ගොඩගසාගත් පාලකයන් රජකළ අවස්ථා අපි ඉතිහාසයේ කියවා ඇත්තෙමු. මේ යන ආකාරයට අපේ රටටද එයම සිදුවන බවට දැනටමත් සංඥා දැල්වෙමින් තිබේ.

අයියාගෙන් මල්ලීට, මල්ලීගෙන් පුතාට, පුතාගෙන් මුණුබුරාට ආදී ලෙස රජකම ගලායාම ඒකාධිපති රාජ්‍ය පාලනයක මූලික ප්‍රවණතාවයකි. අද අපේ සමාජය අත්විඳිමින් සිටින්නේද එයම නොවේද? මේ දම්වැල කඩන්නේ කවදාද, කවුරුන්ද, එයට සමත්වන්නේ කුමන ව්‍යාපාරයක්ද යන්න මත රටේ අනාගත ඉරණම රැඳී ඇත.

# සටනේ 'ගුරු' විය හැකිනම්...!



ගුරු සටන ආරම්භ වී දැන් මේ වනවිට මසකට ආසන්නය. එයි ප්‍රතිඵල ගැන කීමට අපි ඉක්මන් නොවෙමු. නමුත් ඒ තුළ අපි දකින සාධනීය සාධකය නම් සටන් කරන කණ්ඩායම්වල තවදුරටත් නොනැසී පවතින ඒකමතිය සහ සමගියයි.

80 ජූලි වර්ජනය පරාජයට ප්‍රධානම දේශපාලන හේතුව ලෙස ඉතිහාසය ගත වී ඇත්තේ සටන් කළ බලවේගවල අසමගිය, අසංවිධානාත්මකභාවය හා කණ්ඩායම්වාදයයි.

සතුරා විසින් කුමන අවාලද නැගුවද ගුරු-විදුහල්පති සටන තුළ තවමත් එවැන්නක් ඉස්මතු නොවීම සතුටට කරුණකි. එමෙන්ම සංවිධානාත්මක වැඩ කරන ජනතා බලයක් ඉදිරියේ ඕනෑම බලවත් පාලනයක් හා පාලකයකු පසුපසට තල්ලු කළ හැකි බව ගුරු සටන තුළ ගම්‍ය වන තවත් සාධනීය ලකුණකි.

ගුරුවරුන්ටද දරුවෝ සිටිති. ඒ අනුව ඔවුන්ද මව්පියන්ය. කිසිම මවක හෝ පියෙකු තම දරුවන්ගේ අධ්‍යාපනය පසෙකලා ගුරු අයිතීන් තම ඒකායන අරමුණ කොට සලකා සටන් වදිනු ඇත යන බොළඳ ස්වප්නයේ අපි ගිලී නොයමු. ගුරු අයිතීන් වෙනුවෙන් තම දරුවන්ගේ අධ්‍යාපනය බිලි දීමට කිසි විටෙකත් ඔවුන් සූදානම් නොවෙනු ඇත. සතුරා සමග කරන සටන රටේ දරුවන්ගෙන් පළිගැනීමක් ලෙස ලඝුවීම සහ අර්ථ ගැන්වීමට තිබෙන ඉඩකඩ අහුරා දැමීමට සටනේ නියැලෙන ගුරු සංගම් දරන උත්සාහයද පැසසිය යුතුය.

සටන් සියයක් ජයගෙන උගන්නා පාඩම්වලට වඩා පාඩම් එක සටනක පරාජය විසින් ලබා දෙනු ඇත.

# රට ආර්ථික උගුලෙන් බේරාගැනීමට රාජ්‍ය, පෞද්ගලික, ජනතා ඒකාබද්ධ වැඩපිළිවෙළක් අවශ්‍යයි

පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායම් නායක
අනුර දිසානායක සහෝදරයා

(ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව පිළිබඳ කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින්)

මහ බැංකු වාර්තාව මගින් රටේ ආර්ථිකයේ ඇති තිබෙන තත්වය පිළිබඳ දත්ත-තොරතුරු ඉදිරිපත් කරනවා. ඒ වාගේම ආණ්ඩුව සමහර දත්ත-තොරතුරු විකෘතියට භාජන කර තිබෙනවා. මහජනයාගේ එදිනෙදා ජීවිතය හරහා මේ ආර්ථිකයේ ඇති වී තිබෙන තත්වය පෙන්නුම් කරමින් තිබෙනවා. ඒ සියලු සාධකවලින් පෙන්නුම් කරන්නේ. මෑත කාලයේ දශක ගණනාවකට පසුව අපේ රට ගැඹුරු ආර්ථික අවදානමක් කරා ගමන් කරමින් තිබෙන බවයි. මුදල් ඇති පදම් තිබෙන බව කියමින් සමහර අමාත්‍යවරු පුරාජේරු දෙඩෙව්වාට, සැබැවින්ම අපේ රටේ ආර්ථිකයේ පතුල වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවා.

ක්ෂේත්‍ර හතරක් ඔස්සේ මේ ආර්ථික අර්බුදය ප්‍රකාශයට පත් වෙමින් තිබෙනවා එකක්, රාජ්‍ය ආදායම වේගයෙන් හීන වෙමින් තිබෙනවා. අනෙක් එක, නිෂ්පාදනය වේගයෙන් කඩා වැටෙමින් තිබෙනවා. අනෙක් එක, වෙළඳ හිඟය වේගයෙන් වර්ධනය වමින් තිබෙනවා. අනෙක් එක, අපේ රට විශාල ණය අර්බුදයක ගිලී තිබෙනවා. මේ කරුණු හතර වෙන් වෙන්ව කිවුවත්, මේවා එකිනෙකාට බලපෑම් කරමින්, එකිනෙකා සමඟ එකිනෙක කරුණු සමඟ වෙළෙමින් තිබීම නිසා අපේ රට ගැඹුරු ආර්ථික චණ්ඩ මාරුතයකට මුහුණ දී තිබෙනවා. දැන් ආණ්ඩුව මේ පිළිබඳ සැබෑ චිත්‍රය රටට ඉදිරිපත් කරමින්, ඒ සඳහා රාජ්‍ය කාර්යභාරය, පෞද්ගලික අංශයේ කාර්යභාරය, පුරවැසියාගේ කාර්යභාරය නිසි පරිදි ඉදිරිපත් කරමින් ජාතික සැලැස්මක් හැදුවේ නැත්නම් මේ අර්බුදය ඉතාම අවදානම්සහගත තත්වයට පත්වීම වළක්වන්න බැහැ.

## රාජ්‍ය ආදායම කඩා වැටීම

අපි දන්නවා රාජ්‍ය ආදායම විධිහට 2021 වසෙර්දී රුපියල් බිලියන 1961ක් උපයන්න ඇස්තමේන්තු කරලා තිබෙන බව. හැබැයි පසුගිය මාස හතරේ අප්‍රේල් 30 දක්වා උපයා තිබෙන්නේ රුපියල් බිලියන 482යි. ඒ කියන්නේ, ආණ්ඩුව මේ වර්ෂයේ රුපියල් බිලියන 1961ක් ආදායම හැටියට අපේක්ෂා කළත්, වසරේ තුනෙන් එකක කාලයක් ගතවෙනකොට උපයලා තිබෙන්නේ රුපියල් රුපියල් බිලියන 482යි. රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1500 සීමාවේ පවතින බව තමයි එයින් පෙන්නුම් කරන්නේ. මා තවත් පැහැදිලි කළොත් රාජ්‍ය ආදායම අප්‍රේල් මාසයේ 30 දක්වා මහා භාණ්ඩාගාරයට රුපියල් බිලියන 482ක ආදායමක් එනකොට ණය වාරිකය හැටියට රුපියල් බිලියන 310ක් සහ පොලී වාරිකය හැටියට රුපියල් බිලියන 366ක් ලෙස රුපියල් බිලියන 676ක් ගෙවන්න සිදුවී තිබෙනවා. එයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත් නොවෙයි, රුපියල් බිලියන 194ක් ණය පොලී වාරික ගෙවීම වෙනුවෙන් ණය ලබාගත යුතු බවයි. ඒ කියන්නේ ආණ්ඩුවේ ආදායම ණය පොලී වාරිකය ගෙවීමටවත් නොහැකි තැනකට පත්වී තිබෙනවා කියන එකයි.

ආසන්න වශයෙන් ගත්තොත්, ආණ්ඩුවේ ආදායම රුපියල් බිලියන 482ක් වෙනකාට ආණ්ඩුවේ මුළු වියදම රුපියල් බිලියන 1678ක් වෙනවා. ඒ කියන්නේ බිලියන 482ක් උපයා බිලියන 1,600 ගණනක් වියදම් කරන්න ආණ්ඩුවට සිදුවී තිබෙනවා. විශේෂයෙන්ම තමුන්නාන්සේලා පසුගිය අවුරුද්දේ ක්‍රියාත්මක කළ බදු ප්‍රතිසංස්කරණය රටේ ආර්ථිකය නැංවීමට හෝ ජනතාවගේ ජීවන බර සැහැල්ලු කිරීමට කිසිසේත්ම හේතුවෙලා නැහැ. රුපියල් බිලියන 600කට ආසන්න එම බදු සහන ඉතා කුඩා චෞර වළල්ලක් අතට ගලාගෙන ගියා. එම නිසා මේ රාජ්‍ය ආදායම තවත් වේගයෙන් කඩා වැටෙන තත්වයක් නිර්මාණය වී තිබෙනවා.

## ආනයන - අපනයන පරතරය

ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය තමයි, ආනයන සහ අපනයන අතර ඇතිවී තිබෙන ප්‍රශ්නය. භාණ්ඩ ආනයනය කිරීම වෙනුවෙන් පසුගිය මාස හතර තුළ ඩොලර් මිලියන 6448ක්ක් වැය වී තිබෙනවා. අපනයන ආදායම විධිහට ලැබී තිබෙන්නේ ඩොලර් මිලියන 3,800යි. ඒ කියන්නේ, ඩොලර් මිලියන 2948ක හිඟයක් තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත් පසුගිය මාස 04 ඇතුළත ඩොලර් බිලියන 03ක හිඟයක් නිර්මාණය කර තිබෙනවා. එය අවුරුද්දකට ගලපලා බලනකොට මේ අවුරුද්ද තුළ ආසන්න වශයෙන් ඩොලර් බිලියන 8ක්, 9ක් අතර වෙළෙඳ ශේෂ හිඟයක් මතුවීමේ අර්බුදයක් නිර්මාණය වී තිබෙනවා. විශේෂයෙන්ම අපනයන ආදායමින් සියයට 25ක් සම්පූර්ණ කරන්නේ කෘෂිකර්මාන්තයෙන් බව අපි දන්නවා. හැබැයි ගිය අවුරුද්දේ ජූනි මාසය හා සංසන්දනය කර බලනකොට මේ අවුරුද්දේ ජූනි මාසයේ අපේ රටේ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 1,400,000කින් අඩුවී තිබෙනවා. ඇයි අඩු වුණේ? ඒකට විශේෂ ස්වාභාවික හේතුවක් නොවෙයි සිදුවුණේ, වර්තමානයේ ඇති වී තිබෙන තත්වය පිළිබඳව නිසි කළමනාකරණයක්, සැලැස්මක් නැතිවීම සහ බොහොර සඳහා අවශ්‍ය වන යෙදවුම් තහනම් කිරීම හේතු කොටගෙන මේ ජූනි මාසයේ සිට තේ වගාවට බලපෑම් ඇතිකරමින් තිබෙනවා. අපේ රටට තේවලින් ඇමරිකානු ඩොලර් මිලියන 1.3ක ආදායමක් ලැබෙන බවත්, එය ඇමරිකානු ඩොලර් මිලියන 650 දක්වා දෙකෙන් පංගුවකින් අඩුවීමේ අවදානමකට අපි මුහුණ දී තිබෙන බවත් විශේෂඥයන් හඳුන්වා දෙනවා.



## රාජ්‍ය ණය අර්බුදය

අපි විශාල රාජ්‍ය ණය උගුලකට හිර වෙලා තිබෙන බව අපි දන්නවා. උදාහරණයක් හැටියට ගත්තොත් 2019 වසර අවසන් වෙනකොට අපේ රටේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 13,031යි. ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් ට්‍රිලියන 13යි. හැබැයි 2021 අප්‍රේල් මාසය වෙනකොට ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 16.3 දක්වා වැඩි වී තිබෙනවා. ඒ කියන්නේ මේ මාස 16 ඇතුළත රුපියල් ට්‍රිලියන 3.3කින් රුපියල් කෝටි 330,000කින් ණය ප්‍රමාණය වැඩිවී තිබෙනවා. ඒ අනුව ආසන්න වශයෙන් ගත්තොත්, එක පුරවැසියෙකුගේ ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 1/2කින් වැඩිවී තිබෙනවා. 1950දී අපේ ණය ප්‍රමාණය රුපියිල් කෝටි 100යි. 1950දී රුපියල් කෝටි 100ක ණය හිඟයක තිබුණු රටේ මාස 16ක් ඇතුළත ණය පංගුව විතරක් රුපියල් කෝටි 330,000කින් වැඩි වී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, භාණ්ඩාගාරය ඇප වෙමින් ඇපකර හරහා රාජ්‍ය ආයතන විසින් ණය ලබාගෙන තිබෙනවා. එම ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.4යි; රුපියල් කෝටි 140,000යි. ඔක්කොම ගත්තොත්, ඒවා රාජ්‍ය ණය. ආසන්න වශයෙන් ගත්තොත්, රාජ්‍ය ණය රුපියල් ට්‍රිලියන 17.7 දක්වා වර්ධනය වී තිබෙනවා. මේ රට විශාල ණය උගුලක හිරවී තිබෙනවා. ප්‍රධානම ගැටලුව දේශීය ණය නම්, තමුන්නාන්සේලා උදේ හවස වන්දනා කරන්න ඕනෑ තැනක් තියෙනවා. වෙන කිසි තැනක් නෙවෙයි. බියගම මුදල් අච්චු ගහන ෆැක්ටරි එක. බියගම මුදල් අච්චු ගහන ෆැක්ටරි එක මගින් දේශීය ණයවලට මොනවා හෝ කරගන්න පුළුවන්.

පසුගිය අප්‍රේල් මාසය වෙනකොට මාස 16ක් ඇතුළත රුපියල් ට්‍රිලියනයක මුදල් අච්චු ගහලා තිබෙනවා. රුපියල් කෝටි ලක්ෂයක මුදල් අච්චු ගහලා තිබෙනවා. තමුන්නාන්සේලා වඳින්න ඕනෑ කොතැනටද? බියගම මුදල් අච්චු ගහ ෆැක්ටරි එකට. ඒ විතරක් නෙවෙයි, පසුගියදා එක් දිනක් ඇතුළත රුපියල් බිලියන 221ක් ඒ කියන්නේ රුපියල් කෝටි 22,100ක මුදල් අච්චු ගහලා තිබෙනවා. ඒකෙන් පෙන්නුම් කරන්නේ කුමක්ද? දේශීය ණය පියවා ගැනීම සඳහා ඇති තරමට මුදල් අච්චු ගහන්න පුළුවන් වේවි. හැබැයි. ලංකාවේ පළමු වතාවට අපේ මුළු ණයවලින් සියයට 47කට ආසන්න ප්‍රමාණයක් විදේශීය ණය බවට පත්වී තිබෙනවා. අපේ විදේශීය ණය පංගුව ඇමරිකානු ඩොලර් බිලියන 5.1ක් බව අප්‍රේල් මස 30වැනිදාට වාර්තා වෙනවා. එම විදේශ ණයවලිනුත් විශාල ණය පංගුවක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මගින් ලබාගෙන තිබෙනවා. ආසන්න වශයෙන් ගත්තොත්, එතැන රුපියල් බිලියන 15ක් තිබෙනවා. ඒ කියන්නේ සියයට 40ක්. ස්වෛරී බැඳුම්කර හරහා ගන්නා ලද ණය විශාල පොලී අනුපාතිකවලට ලබාගන්න අපට සිදුවුණා. මේ ජූලි මාසයේ 27වැනිදා ඇමරිකානු ඩොලර් බිලියනයක ස්වෛරී බැඳුම්කරයක් ගෙවනු ලැබුවා. හැබැයි අපට ලබන ජනවාරි මාසයේ තව ඇමරිකානු ඩොලර් මිලියන 500ක් ගෙවන්න තිබෙනවා. ලබන අවුරුද්දේ ජූලි මාසයේ 18වැනිදා තව ඇමරිකානු ඩොලර් බිලියනයක් ගෙවන්න තිබෙනවා. ඒ කියන්නේ ලබන වසර සඳහා බැඳුම්කර ණය පියවීමට ඇමරිකානු ඩොලර් මිලියන 1,500ක් අපට අවශ්‍ය වෙනවා කියන එකයි.

## විදෙස් සංචිත හීනවීම

අද අප සතුව ඩොලර් බිලියන 2.5ත්, ඩොලර් බිලියන 03ත් අතර මුදල් ප්‍රමාණයක් තමයි විදේශ සංචිතවල ඇත්තේ කියලා මම උපකල්පනය කරනවා. ඒ විතරක් නොවෙයි, භාණ්ඩාගාරයේ ගිණුම බැංකු අයිරාවකින් -ඕඩී එකකින් දුවන්නේ. භාණ්ඩාගාරයේ බැංකු අයිරාව අද වනවිට රුපියල් බිලියන 620යි. ඒ කියන්නේ, භාණ්ඩාගාරයේ ගිණුම කෝටි 62,000ක බැංකු අයිරාවකින් දුවන තැනකට රට පත්වෙලා තිබෙනවා. මේක තරමයි රටේ ආර්ථිකය. ඉදිරි මාස 04ක කාලය ඇතුළත ණය පියවීමට ඩොලර් බිලියන 1.3ක් අපි ගෙවිය යුතුව තිබෙනවා. ආසන්න වශයෙන් ඩොලර් බිලියන 03ක් අපට ඕනෑ භාණ්ඩ ආනයනයට. ඒ ණය ගෙවීම සහ භාණ්ඩ ගෙන්වීම සඳහා යන කරුණු දෙකට පමණක් ඩොලර් බිලියන 4.3ක අවශ්‍යතාවයක් තිබෙනවා. මා දැනගන්න කැමතියි, මේ මුදල කොහෙන්ද හොයා ගන්නේ කියලා. වෙළෙඳපොළේ විශාල ඩොලර් හිඟයක් මතුවී තිබෙනවා. සාමාන්‍යයෙන් නිල බැංකුවල ඩොලර් හුවමාරු අගය රුපියල් 202ක් වුණත්, අද කළු කඩේ ඩොලර් එක රුපියල් 234-240 දක්වා වර්ධනය වී තිබෙනවා. මේ දත්ත ඔක්කොම ඇතුළේ පෙන්නුම් කරමින් තිබෙන්නේ අපි විශාල ණය උගුලක හිරවෙමින්, ණය ගෙවාගැනීමේ අර්බුදයකට ලක් වෙමින් තිබෙන රාජ්‍යයක් වී බවයි. තමුන්නාන්සේලා නැවත නැවතත් කරන්නේ ආනයන සීමා කරන එකයි. හැබැයි, ආනයන සීමාකිරීම නැවත අපේ ආර්ථිකයට බලපෑමක් ඇති කරමින් තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත් 2020 මුල් මාස 04 ඇතුළත වාහන ආනයනය මගින් උපයා ගන්නා ලද ආදායම රුපියල් බිලියන 33යි. හැබැයි, මේ අවුරුද්දේ රුපියල් බිලියන 07යි. ඒ නිසා මේවා එකට ගැට ගැසුනු දේවල්. වෙළෙඳ ශේෂයේ හිඟය, ණය අර්බුදය, නිෂ්පාදනය කඩා වැටීම, රාජ්‍ය ආදායම අහිමිවීම කියන මේ කරුණු හතර එකර එක වෙළෙමින්, වේගවත් චණ්ඩ මාරුතයක් හැටියට රටේ ආර්ථිකයේ බලකණු සුණු විසුණු කරමින් ගමන් කරමින් තිබෙනවා. මුදල් අමාත්‍යවරයා මෙවැනි තත්වයක් තිබෙනවාය කියලා කල්පනා කරමින් රටක් පාලනය කරන බව පෙන්වන්නේ නැහැ.

## රාජ්‍ය ආයතන පාඩුව

රටේ රාජ්‍ය ආයතන 19ක පාඩුව මම කියන්නම්. රාජ්‍ය ආයතන දහනවයේ මුල් මාස හතරේ පාඩුව රුපියල් බිලියන 82යි. ඒ කියන්නෙ, රුපියල් කෝටි 8,200යි. තමුන්නාන්සේලා කියනවා, ගුරුවරුන්ට පඩි වැඩි කරන්න රුපියල් බිලියන 56ක් අවශ්‍ය වෙනවා කියලා. හැබැයි රාජ්‍ය ආයතන 19ක පළමුවැනි මාස හතරෙත් පාඩුව රුපියල් බිලියන 82ක් බවට පත්වී තිබෙනවා. ඒ කියන්නේ, මේ වසර අවසන් වෙනකොට ආසන්න වශයෙන් ගත්තොත් ඒ පාඩුව රුපියල් බිලියන 240 ඉක්මවනවා. දැන් රාජ්‍ය ආයතන මහා බරක් බවට පත් වෙච්ච ආයතන බවට පත් වී තිබෙනවා. මේ ආයතනවල බරත් මේ ආර්ථිකයට මහා හෙණයක් හැටියට පහත්වෙමින් තිබෙනවා.

මා කියන්නේ පළමුකොටම මේ පිළිබඳව සැබෑ තත්වය

10 වැනි පිටුවට

> පසුගිය අප්‍රේල් මාසය වෙනකොට මාස 16ක් ඇතුළත රුපියල් ට්‍රිලියනයක මුදල් අච්චු ගහලා තිබෙනවා. රුපියල් කෝටි ලක්ෂයක මුදල් අච්චු ගහලා තිබෙනවා. තමුන්නාන්සේලා වඳින්න ඕනෑ කොතැනටද? බියගම මුදල් අච්චු ගහ ෆැක්ටරි එකට. ඒ විතරක් නෙවෙයි, පසුගියදා එක් දිනක් ඇතුළත රුපියල් බිලියන 221ක් ඒ කියන්නේ රුපියල් කෝටි 22,100ක මුදල් අච්චු ගහලා තිබෙනවා.

## ජනතාවට අහිමි කෙරුණු...

05 පිටුවෙන්...

තුළ ව්‍යාප්තිය ආරම්භ වී ඇති බවත් ජනතාව ප්‍රවේශම් කරගත යුතු බවත් 2021 අප්‍රේල් ආරම්භ වන විටත් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් නිවේදනය කර තිබියදීත් ඒ වෙනුවෙන් සාධනීය මැදිහත්වීමක් නොවූ පසුබිමක, ජනතාව ආරක්ෂා වන්නට නොදන්නේ යැයි පවසමින් මහජනතාවට ආඩපාලි කීමෙන් මෙම වෛරස වසංගත තත්වය පාලනය සඳහා කිසිම ආකාරයක සහයක් අපේක්ෂා කළ නොහැක. සාතිශය බහුතරයක් ජනතාව රෝගය බෝකර ගැනීමේ කිසිදු උත්සාහයක් නොදරන බව සහතිකය. නමුත් එදිනෙදා ජීවිතය පවත්වා ගැනීමේ ක්‍රියාවලියේදී අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම, අත්‍යවශ්‍ය සේවා පවත්වා ගැනීම, දෛනිකව ආදායම් ලබන වෘත්තීය කටයුතුවල යෙදීම ආදී කාර්යයන් සඳහා මහජනතාවට සමූහනය වීමට සිදුවී තිබේ. රජය විසින් රාජ්‍ය සේවකයන් සියලු දෙනාම සේවා සඳහා කැඳවීමෙන්, ව්‍යාපාර සියල්ලම සෑම දිනකම විවෘතව තබා ගැනීමට ඉඩ දීමෙන්, ඇඟළුම් කර්මාන්තශාලා ඇතුළු සියලු කර්මාන්තශාලා දෛනිකව විවෘතව තැබීමට සහ සියලුම සේවකයන් පෙර පරිදිම යොදවා ගැනීමට අවකාශ ලබා දීමෙන් මෙන්ම පොහොර, ගෑස්, කිරිපිටි, භූමිතෙල්, පරිප්පු, ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩයන්හි ඇතිවූ හිඟය මත එකී මහජනතාවට සමූහනය වීමට බලකෙරෙන අවස්ථාවක් නිර්මාණය වී තිබේ. එමෙන්ම කොතලාවල විශ්වවිද්‍යාල පනත, පොහොර ආනයනය නැවැත්වීමේ තීරණය, රාජ්‍ය දේපළ හා එහි කළමනාකාරීත්වයන් පෞද්ගලික අංශයට පැවරීම වැනි විවාදයට තුඩු දෙන අණ පනත් සහ ක්‍රියාමාර්ග සම්මත කිරීම සඳහා ආණ්ඩුව දරණ උත්සාහයද මහජන ඒකරාශීවීම් උත්සන්න කිරීමට උත්තේජන සපයා තිබේ. අනෙක් අතට ජනතාවට නායකත්වය දෙන ආණ්ඩුවේම පුද්ගලයන්ගේ ආදර්ශමත් නොවන හැසිරීම් මගින් තමන් විසින් පනවන නීති තමන් විසින්ම විහිළුවට ලක්කිරීමත්, මේ හේතුන් මත නිවසෙන් පිටතට එන ජනතාවට අපහාස කිරීමත්, තර්ජනය කිරීමත්, අත්අඩංගුවට ගැනීම සඳහා කටයුතු කිරීමත් මහජන විශ්වාසය බිඳවැටීමට හේතුවී තිබේ. සැබෑ තොරතුරු දත්ත වෙනුවට අඩු සංඛ්‍යා දත්ත ලැබීම හේතුවෙන් මහජනතාව තුළ රෝගය පිළිබඳව තිබිය යුතු සැබෑ අවධානය පහව ගොස් තිබීමත්, මෙම රෝගය මර්දනය කිරීමට උත්සාහ නොකර ඔහේ පාවෙන්නට හැර තිබෙන බවට සමාජය තුළ වන විශ්වාසයත් යන සියල්ලම මහජන සමූහනය වීම් වැළැක්වීම අපහසු ඉලක්කයක් බවට පත්කර තිබේ.

### කොවිඩ්වල ලාභය

මහජන සෞඛ්‍ය සහ සමාජ ක්‍රියාකාරකම්හි සියලුම පියවරයන් සුළු පිරිසකගේ ආර්ථික ලාභය උදෙසා වෙන් කර තිබීම සැලකිල්ලට භාජනය කළ යුතුය. මේ වන විට මාස්ක් වෙළඳාම මුළුවනින්ම පෞද්ගලික අංශය සතු ව්‍යාපාරයකි. රෝගකාරක ව්‍යාප්තිය වැළැක්වීම සඳහා අත්‍යාවශ්‍ය එන්-95 වර්ගයේ මාස්ක් එකක් රුපියල් 30 සිට 180 දක්වා මිල ගණන්වලට අලෙවි කෙරේ. අත් පිරිසිදු කිරීමේ දියර ලීටරයක සාමාන්‍ය වෙළඳපොල මිල රුපියල් 1000 සිට 1500 ක් පමණ වේ. පීසීආර් පරීක්ෂණයන් සඳහා රුපියල් 8500 ක් පමණ අයකරන අතර රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණයක් සඳහා රුපියල් 2000 ක් 3000 ක් අතර මුදලක් අයකරනු ලැබේ. නිරෝධායනය සඳහා හෝටල් වෙන්කරගෙන ඇති අතර ඒවායේ මිල ගණන් විවිධය. රෝගීන් ඇතුලත් කර ගන්නා පෞද්ගලික රෝහල් තම පැකේජය රුපියල් 150,000 සිට 300,000 දක්වා මිල ගනන්වලට විකුණමින් සිටී. ඔවුහු අසාධ්‍ය වන රෝගීන් රජයේ රෝහල් කරා යොමුකරන නමුත් තම අයකිරීම් වෙනස් නොකරති. පරීක්ෂණ සිදුකරන ආකාරය අදාළ නියමයන්ට අනුගතව නොව තවත් වටයක් රෝගියා ගෙන්වා ගැනීම වෙනුවෙන් වෙනස් කරගෙන තිබේ. රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණ කට්ටලයක ඩොලර් 1 කට හෝ ඊටත් වඩා අඩු මුදලකට ලබා ගත හැකිව තිබියදී පීපීඊ ඇඳුමක් පවා ඩොලර් 01 කට ගතහැකිව තිබියදී විශාල මුදලක් අය කිරීම මගින් මෙම විනාශකාරී උවදුරින් තමන්ගේ ලාභය මහජනතාවගේ මිනී මතින් ලබාගැනීමට පාලකයෝ ඔහුන්ගේ චෞර වලල්ලට ඉඩදී තිබේ.

### කොවිඩ් නැති ජීවිතයක් සඳහා මඟ

අප හට නිසි මඟක් තවමත් තිබේ. මෙය ලෝක පරිමාණයේ වසංගතයක් වුවද ශ්‍රී ලංකාව තුළ මහා ජන සංහාරයක් වීම වළක්වා ගැනීමට තවමත් අවකාශ තිබේ. අවශ්‍ය එන්නත් සම්පූර්ණ ප්‍රමාණයම හැකි ඉක්මනින් ගෙන්වා ගෙන එන්නත්කරණය කෙටි කාලයක් තුළ සම්පූර්ණ කිරීමත්, නිසි සුදුසුකම් සහිත මෙන්ම නායකත්වයක් සැපයීමට හැකියාව ඇති පිරිසකට මෙම වසංගතයේ මෙහෙයුම් කටයුතු භාර දීමත්, මහජනතාව තුළ ධෛර්යය වඩවන ආකාරයට කටයුතු කිරීමත්, වසංගතය ව්‍යාපාරික වුවමනාවන්ගෙන් ඈත්කර තැබීමත්, නිශ්චිත ඉලක්කගත විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ගැනීමත්, දේශපාලන වාසි වෙනුවෙන් වසංගතය භාවිතා නොකිරීමත්, මගින් මෙම ඉලක්කය සම්පූර්ණ කරගත හැකිවනු ඇත. නමුත් සත්‍ය තත්වය නම් මේ වර්ගයේ පාලනයකින් සහ පාලකයන්ගෙන් ජන ජීවිතයේ වටිනාකම රැකෙනු ඇතැයි සිතිය නොහැකිවීමයි. ලාභය සහ බලය පවත්වා ගැනීම පමණක්ම තම ඉලක්කය කරගත් මෙවැනි පාලන ක්‍රමයකට මිනිස් ජීවිතද මිලක් නියමවූ භාණ්ඩයක් පමණි. කොරෝනා පාලනය සම්බන්ධව ආණ්ඩුවේ දැක්මෙත් වැඩපිළිවෙළෙහිත් දිශාගත ඉලක්කය වී ඇත්තේ ඉහත යථාර්ථයයි.

## ලංකාව ගිල දමන...

07 පිටුවෙන්...

බවය. එදා කිලෝවකට රු. 50ක් ගෙවිය යුතු වූ බද්ද ශත 25ක් ගෙවා වාසි ගත් සීනි ජාවාරම්කරුවන් දැන් ඒ සීනි තොගවලින්ම කිලෝවකට රු. 150කටත් වඩා වැඩි ලාභයක් ලබා ගනිද්දී ආණ්ඩුව ඒ ජාවාරම්කරුවන් රකිමින් සිටී; ජනතාව සීනි වෙනුවෙන් ගෙවමින් සිටී.

ගෝඨාභය බලයට එනවිට රු. 70ක්ව පැවති හාල් කිලෝවක් අද වනවිට අඩුම මිල රු. 120කි. එදා රු. 300ට පැවති පොල්තෙල් ලීටරය අද රු. 600කි. රු. රු. 400ට පැවති මුං ඇට කිලෝවක් රු. 1200ක් දක්වා තුන් ගුණයකින් ඉහළ නැග ඇත. රු. 60ට පැවති පොල් ගෙඩියක් රු. 90කි. රු. 120ට පැවති පරිප්පු කිලෝවක් දැන් රු. 230කි. රු. 135ට පැවති සැමන් ටින් එකක් දැන් රු. 380කි. සාමාන්‍යයෙන් එළවළු පැවතියේ කිලෝවක් රු. 150ක මිලටය. දැන් ඒ මිලට ගත හැක්කේ ග්‍රෑම් 500ක් හෝ ඊට අඩු ප්‍රමාණයකි. කහ ගෙන්වීම නතර කළේ දේශීය කහ වගාව සඳහාය. දැන් කහ ගෙන්වීම නතර කර දේශීය කහ වගාව පටන් ගත් කාලය සමග කහ කුඩු දේශීයව නිපදවා වෙළඳපොළට එන්නට හොඳටම කල්ය. නමුත් අදටත් කහ කුඩු ග්‍රෑම් 100ක් රු. 1140කි. මේ සියල්ලම ගෙවිය යුත්තේ වෙන වෙනම ජනතාවක් නොව එකම ජනතාවකි. ඒ අද කොවිඩ් මාරයාගෙන් ගැලවීමට, දිවි බේරා ගැනීමට එළියට බැසීම තහනමට ලක්ව ඇති ජනතාවය. ඔවුන්, දැන් මඟ සිටියොත් කොවිඩ්වලින් නසී. ගෙදර ගියොත් බඩගින්නේ නසී මට්මට පත්ව ඇත. ආණ්ඩුව ක්‍රියා කරන්නේ, 'රටේ ජනතාව මළත් 'ආර්ථිකය' පවතින්නේ නම් අපට ඇතිය' යන මානසිකත්වයෙනි.

ආණ්ඩුවේ ප්‍රශ්නය මේ වසංගතයේ පිහිටෙන්වත් තමන් මුහුණ දෙන ආර්ථික අර්බුදයට ණය අර්බුදයට පිළියමක් සොයා ගැනීමය. ජනතාවගේ අර්බුදය, කොවිඩ් වසංගතයෙන් බේරී වැඩි වන ජීවන වියදමට අවශ්‍ය එදිනෙදා ආදායම සොයා ගැනීමය. මේ අවශ්‍යතා දෙක එකට පෑහෙන්නේ නැත. ආණ්ඩුව කියන්නේ කට වහගෙන වැඩට එන ලෙසටය. සෞඛ්‍ය අංශ විශේෂඥයන් කියන්නේ කට වහගෙන ගෙදර ඉන්න කියාය. ජනතාවට ජීවිතය බේරා ගැනීමට අවශ්‍ය නම් සෞඛ්‍ය නීති පිළිපැදිය යුතුමය. නමුත් වැඩිවන ජීවන බරට එයින් උත්තර නැත. ආණ්ඩුවට සෞඛ්‍ය නීති ක්‍රියාත්මක කළහොත් ණය ගෙවා ගත නොහැකිය. එපමණක් නොව වසංගතය පැවතීම ආණ්ඩුවට අර්බුද ගොඩකට උත්තර ලබා දෙයි. බඩුමිල වැඩිවන්නේ කොරෝනා නිසාය. ඒ නිසා වැඩිවන ජීවන වියදම ගැන ජනතාව කතා නොකර සිටිය යුතුය. ඩොලර් හිඟය රුපියල කඩා වැටීම, තෙල් මිල ඉහළ යාම, බෙහෙත් මිල 60% කින් පමණ ඉහළ යන්නේ කොරෝනා නිසාය. කොරෝනා බෝ කරන්නේ ගුරුවරුය. ඒ නිසා වැටුප් විෂමතාවයද විසඳිය නොහැකිය. ඒ ආණ්ඩුව වසංගතය වාසි කරගන්නා ආකාරයයි.

ගෝඨාභය රාජපක්ෂ පාලනයට දැන් ඇත්තේ ණය, ණය ගෙවීමට ණය, සහ තවත් ණය ගැනීම පමණි. වෙනත් ආර්ථික උපායමාර්ගයක් නැත. සෞභාග්‍යයේ සිහිනයේ ජනතාව ගැට ගසා ඡන්දය මංකොල්ලකෑවද වසංගතයටවත්, ජීවන බරටවත් ජනතාව වෙනුවෙන් පිළිතුරු නැති බව පැහැදිලිය. කොරෝනා වසංගතයද ධනවාදී යාන්ත්‍රණයේම සාමන්‍ය කොටසක් බවට පත්කර එය වෙළඳපොළේ තවත් භාණ්ඩ විකිණීමේ මාදිලියක් බවට යොදා ගනු ඇත. ඒ නිසා, ජනතාව මේ වසංගතය මෙන්ම වෙළඳ භාණ්ඩයක් කර ජනතාව මර්දනය කරන පාලන ක්‍රමයද පරාජය කළ යුත්තේ එක බලයක් ලෙසටය.

## රට ආර්ථික උගුලෙන්...

09 පිටුවෙන්...

තමුන්නාන්සේලා මේ රටට ඉදිරිපත් කරන්න. ඒක තමයි, අංක එක. අංක දෙක විධියට මේ සඳහා ගත යුතු ක්‍රියාමර්ග ගණනාවක් තිබෙනවා. පළමුකොටම රාජ්‍යය කාර්යක්ෂම කිරීම සහ මුදල් නාස්තියට, වංචාවට, දූෂණයට තිත තැබීම සඳහා වේගවත් සැලැස්මක් හදන්න ඕනෑ. රාජ්‍ය ආදායම මෙපමණ අඩුවෙමින් තිබියෙදී තමයි, කිලෝග්‍රෑම් එකකට රුපියල් 50ක්ව තිබුණු සීනි බද්ද ශත 25 දක්වා අඩු කළේ කවුරු වෙනුවෙන්ද?මේ රටේ සීනි බරිභෝජනය කරන ජනතාව වෙනුවෙන් නොවෙයි. සීනි සඳහා රුපියල් 50ක බද්දක් තිබුණා. ඒක ශත 25 දක්වා අඩු කළා විල්මාර් ආයතනය වෙනුවෙන් පමණක් . ඒ අනුව භාණ්ඩාගාරය ලැබිය යුතු ධනය රුපියල් කෝටි 1,500ක් එක සමාගමක් වෙත ගලාගෙන යන්න ඉඩ සැලස්වූවා.

ඒ විතරක් නෙවෙයි, මේ වෙනකොට රජය මහා පරිමාණ ඉදිකිරීම්වලට යමින් තිබෙනවා. මේ රටේ කොන්ක්‍රීට් වනාන්තරයක් ගොඩනැගුවා කියලා ජනතාවගේ කුසගින්නට උත්තරයක් ලැබෙන්නේ නැහැ. මේ මහා පරිමාණ කොන්ක්‍රීට් වනාන්තර අද අපේ රටට බරක් වෙලා තිබෙනවා. ඒවා ණය ගෙවා ගැනමට බැරි ප්‍රතිලාභයක් නැති ආයතන බවට පත්වී තිබෙනවා. මේ අර්බුදයෙන් මිදෙන්න තමුන්නාන්සේලා තෝරාගෙන තිබෙන්නේ මාර්ග තුනයි. එකක්. ණය ගැනීම. දෙවැනි එක, විකිණීම. තුන්වැනි එක මුදල් අච්චු ගැසීම. දැන් අපේ රටේ ආයතන විකුණන්න හදනවා. ඇඟට ඇඟිල්ලකින් ඇන්නත් දේශප්‍රේමීත්වය එළියට පනින පාලකයෝ. හැබැයි, දැන් තමුන්නාන්සේලා කෙරවලපිටිය බලාගාරයෙන් සියයට 40ක් ඇමරිකානු සමාගමකට පවරා දුන්නා. කෙරවලපිටිය බලාගාරයට එලන ගෑස් නළ පද්ධතියක්, ඒවා ගබඩා කිරීමේ ගබඩා සංකීර්ණයක් හදන්න විදුලිබල අමාත්‍යවරයා ටෙන්ඩර් කැඳවා තිබුණා. එසේ තිබියදී ඒ වැඩේ ඇමරිකානු සමාගමකට පවරා දුන්නා. කෙරවලපිටිය බලාගාරයේ සියයට 40කොටස් අයිතිය ගන්නේ මේ ඉදිකිරීම දුන්නොත් විතරයි කියලා ඇමරිකානු සමාගම කිවුවා. ඒ වාගේම, අපේ රටේ ඛනිජ තල් නීතිගත සංස්ථාවේ ඒකාධිකාරිත්වයක් තිබුණා. මේ වෙනකොට උදය ගම්මන්පිල අමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා, එම පනත සංශෝධනය කරලා රාජ්‍ය තෙල් ඒකාධිකාරිත්වය බිඳින්න.

ඊළඟට සෙලෙන්දිවා ආයතනය ගොඩනගා කොළඹ මහ තැපැල් කාර්යාලය පිහිටි බිල්ඩිම, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, යෝර්ක් ගොඩනැගිල්ල, විදේශ කටයුතු අමාත්‍යාංශය පිහිටි ගොඩනැගිල්ල, හිල්ටන් හෝටලය ආදී ජාතික සහ පෞරාණික උරුම විකුණන්න සැලසුම් කර තිබෙනවා. කොම්පඤ්ඤවීදියේ ගුවන් හමුදා කඳවුර පිහිට භූමිය විකුණන්නත් අද සැලසුම් කරමින් තිබෙනවා. ඒ වාගේම බේරේ වැව අසල තිබෙන ඉඩම් විකුණන්නත් අද සැලසුම් කරමින් තිබෙනවා. එම නිසා තමුන්නාන්සේලාගේ පිළිවෙත වෙලා තිබෙන්නේ රාජ්‍ය දේපළ විකිණීමත්. ණය ගැනීමත් නැවත මුදල් අච්චු ගැසීමත්.

අපේ රටේ මහ පොළොව. පස වස විසවලින් පිරිලා තිබීම පිළිබඳව අපට විවේචනයක් තිබෙනවා. ඒක නැවත සංරක්ෂණය කර ගැනීමේ ඕනෑකමත් අපට තිබෙනවා. හැබැයි රසායනික යෙදවුම් නතර කිරීමට ආණ්ඩුව කඩිමුඩියේ ගත් තීන්දුව අපේ රටේ මුළු නිෂ්පාදනයටම බලපෑමක් ඇතිකරමින් තිබෙනවා. ඒ වාගේම මේ සඳහා නිසි යෙදවුම් ලබාදෙන්න සමත් වුණේ නැත්නම් අපේ රටේ ගොවීන් ගොවිතැන අත්හැර දමනවා. නිෂ්පාදනය කඩා වැටීම නිසා බොහෝ දේ සිදුවිය හැකියි. අනිවාර්යෙයෙන්ම ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මේ තීන්දුව ආපසු අකුළනවා පරණ විධියටම. එහෙම නැත්නම් අපේ රටේ ආහාර හිඟයක් ඇති වෙනවා.

නිසි දැක්මක්, සැලැස්මක් නැතිව අද අපේ රටේ ජාතික නිෂ්පාදනය කඩා වට්ටන සැලැස්මක් ඇවිල්ලා තිබෙනවා. මා අවසන් වශයෙන් කියන්නේ මේකයි. අද විශාල ඩොලර් හිඟයක් තිබෙනවා. ඒ නිසා මේක 'අඩ්ඩඩ්ඩාවෙන්' දුවන්නේ. කොයි වෙලාවේ, කොතන මේ තත්වය පුපුරයිද කියන සැකය මතුවී තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවක් හැටියට නිසි ආදර්ශයක් ලබා දෙමින්, මේ ඇතිවී තිබෙන තත්වය පිළිබඳව රටට පැහැදිලි කරමින්, රාජ්‍යයත්, පෞද්ගලික අංශයත්, පොදු ජනතාවත් ඒකාබද්ධ කැප කිරීමක් හා මැදිහත්වීමක් සහිත වැඩපිළිවෙළක් හැදුවේ නැත්නම්, අපේ රටට විශාල ආර්ථික උගුලක හිර වීමේ අනතුරකට මුහුණ පාන්නට සිදු විය හැකියි.

## ආණ්ඩුව මාෆියාව සතුටු කරනු වෙනුවට...

01 පිටුවෙන්...

ජනතාවට දිය යුතුයි. නමුත් ඒ සහන මල්ලත් අගෝස්තු 24දා ඉඳලා කප්පාදු කළා. අඩු ආදායම්ලාභී පවුල්වලට පමණක් වියළි ආහාර මල්ල ලබාදෙන්න කැබිනට් මණ්ඩලය තීරණය කළ බව කියා තිබෙනවා. මේ වියළි ආහාර ද්‍රව්‍ය මල්ල ලබාදෙන්නේ සෞඛ්‍යමය හේතුන් මතයි. ආසාදිතයන් නිවාසවලින් පිටතට එන්න වළක්වන්නයි. හැබැයි දැන් අඩු ආදායම්ලාභී නොවන අය ආසාදිතයන් වුණත් වෙළඳපොළට යන්න වෙනවා. පවුල් පිටින් නිරෝධායනය වන විශාල පිරිසකගේ සෞඛ්‍යමය හේතුන් නොතකා ආණ්ඩුව ආර්ථිකය ගැන පමණක් බලා තියෙනවා.

අනෙක් පැත්තෙන් රු. 2,000 දීමනාව ලබාදෙන්නේ ජීවනෝපාය අහිමි පවුල්වලට. මෙයට රාජ්‍ය සේවකයින්, විශ්‍රාමිකයින්, සමෘද්ධි ප්‍රතිලාභීන්, වැඩිහිටි සහ ආබාධිත වැනි රජයේ මාසික දීමනාලාභීන් මේ සඳහා සුදුසුකම් නොලබන අය හැටියට නම්කර තිබෙනවා. මේ අනුව ආණ්ඩුවෙන් මොනයම්ම හෝ දීමනාවක් ලබන කෙනෙකුට රු. 2,000 දීමනාව ලැබෙන්නේ නැහැ. හැම පැත්තෙන්ම භාණ්ඩ මිල වැඩිවී තියෙන අවස්ථාවක සහනාධාර ලබන පිරිස විශාල වශයෙන් කප්පාදු කර තිබෙනවා. 2,000 දීමනාව දිය යුතු අයව තෝරා ගන්න බැරිව නිලධාරීන් අසරණ වී තිබෙනවා. කෘෂි රක්ෂණයට දායක වුණු අය පවා මේ දීමනාවෙන් අයින් කර කිසිවක් ලබා නොදෙන පදනමකට ආණ්ඩුව ක්‍රියා කරනවා. මේ නිසා අපි ආණ්ඩුවට බලකරන්නේ මේ සොච්චම් මුදල පවා කප්පාදු කරනවා වෙනුවට අවශ්‍ය සහනාධාර දෙන්න කියලයි.

නමුත් ආණ්ඩුව මේ සහනාධාර කප්පාදු කරමින් පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රයේ ඇවිදින මං තීරු හදනවා. ඒ වගේම කැබිනට් තීරණවලින් ඩොලර් ලක්ෂ 18කට වැඩිය වියදම් කරලා කැබ්රථ ගන්න යනවා. ඒ වගේම ආයෝජන මණ්ඩලයේ කාර්යාල ප්‍රතිසංස්කරණය කරන්න ලක්ෂ හත්සිය ගාණක් වියදම් කරනවා. අත්තනෝමතික වුවමනාවන්ට බඳවා ගත් 29 දෙනෙකුට වැටුප් ගෙවන්න ලක්ෂ 161ක් මාසිකව දරනවා. නාමල් රාජපක්ෂ ඇමතිවරයා පාර්ලිමේන්තුව ළඟ සඳුන් උයනක් විවෘත කරන්න ලක්ෂ ගණනක් වියදම් කළා. මේවා රටේ ජනතාවට ප්‍රමුඛ අවශතාද? නිරෝධායනයට ලක්කර සිටින පවුල්වලට ලබාදෙන වියළි ආහාර කප්පාදුව නතර කරන්න ඕනෑ. ප්‍රමාණවත් නොවුණත් රු. 2,000 ප්‍රතිලාභය සියලු දෙනාටම ලබාදෙන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ අපි ආණ්ඩුවට බල කරන්නේ රටේ ජනතාව තවත් අසරණ නොකර වහාම සහන දීමේ වැඩපිළිවෙළක් හදන්න කියලා.”

## ජනතාව ජීවත් කරවන...

අවසන් පිටුවෙන්..

ඒක කොරෝනා නිසා ආපු අර්බුදයක් නෙවෙයි. අවුරුදු 73ක් තුළ රටේ පාලනය ජනතාවට අත්කර දී තිබෙන්නේ මොනවාද? අපේ ආර්ථික දේහය තුළ තිබෙන කශේරුව වැනි බලශක්තිය කළමනාකරණය කිරීමේ වැඩපිළිවෙළක් ආණ්ඩුවට නැති බව ගෑස් අර්බුදයෙන් ඔප්පු වී තිබෙනවා. වෙනත් රටවල් නළ මගින් තමන්ගේ ජනතාවට ගෑස් ලබාදුන්නේ මීට අවුරුදු 100කට කලින්. උදාහරණයක් හැටියට 1950 වෙද්දී සෝවියට් දේශයේ සියලුම නාගරික නිවාසවලට නළ මාර්ගයෙන් ගෑස් ලබාදුන්නා. නමුත් රොකට් යවනවා යැයි කියන ආණ්ඩුවට ගෘහණියන්ගේ ලිපට ගෑස් ලබාදෙන්න බැරිවුණා.

ඒ වගේම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල වැඩිකිරීමෙන් හෙට දවසේ උද්ගත වන තත්වය මීට වඩා භයානකයි. රටට අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වන්න ඩොලර් හිඟයක් තියෙනවා. මේ නිසා කළු කඩයේ ඩොලර් එකකට රුපියල් 250ක් විතර ගෙවන ව්‍යාපාරයක් තියනේනෙ. මේ නිසාම හිතුමතේ බඩුමිල ඉහළ දාන්න හැකි වෙනවා. ඒ වගේම 2020 දී කෘෂිකර්මාන්තයෙන් ජාතික ආදායමට ලැබුණු දායකත්වය රු. කෝටි 84,000යි. මේ ජාතික ආදායම ගොවියාගේ පොහොර ප්‍රශ්නයත් එක්ක කඩා වැටෙනවා. මේ නිසා ජනතාවගේ ආහාර ලබාගැනීම හැකියාව කඩා වැටෙනවා. ගොවියට පොහොර ටික නැතිවී කන්න බත් නැතිවෙනවා.”

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




අභිනව මහා නායක හිමි බැහැදැක...



රාගම රෝහලට මෙට්ට පරිත්‍යාග කර...



ජාතික රෝහලට මෙට්ට පරිත්‍යාග කර...



නාවලපිටිය රෝහලට උපකරණ ලබාදී...




ඕස්ට්‍රේලියාවේ පිදෙල් සමරුවට එක්වී...



බදුල්ල දිරිය දියණියකට අත්වැලක් වී...

# ජනතාවට පාලකයින්ගේ කුමන්ත්‍රණ හඳුනාගැනීමේ හැකියාව තිබිය යුතුයි



**ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්**
**ටිල්වින් සිල්වා සහෝදරයා**

ධනපති පාලකයින් බලය සහ වරප්‍රසාද වෙනුවෙන් ඕනෑම කුමන්ත්‍රණයක් කළ හැකි බව ඉතිහාසය විසින් ඔප්පු කර තිබෙන බවත් ජාතික සමගියත් ආගමික සමගියත් ආරක්ෂා කර ගනිමින් පාලකයින්ගේ කුමන්ත්‍රණ හඳුනාගැනීමේ හැකියාව ජනතාව විසින් අත්පත් කර ගත යුතු බවත් පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ජනතාවගේ ලේ සහ ජීවිත මතින් බලයට පත් වී ජනතාව රවටමින්, පීඩාවට පත්කරමින් බලය පවත්වාගෙන යාමට කරන උත්සාහයන් පරාජය කළ යුතු බව අවධාරණය කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා විසින් මේ බව පැවසුවේ, පාස්කු ප්‍රහාරයට මාස 28ක් සම්පූර්ණ වීමත් සමග රට තුළ වර්ධනය වෙමින් පවතින දේශපාලන තත්වය පිළිබඳව පසුගිය 20වැනි දින ජාතික ජන බලවේගය විසින් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද ඔන්ලයින් මාධ්‍ය හමුවකට එක්වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"හරියට පරීක්ෂණ පවත්වන්නේ නැත්තේ මේ කෙළවරේ සිටින අය සහ ආණ්ඩුව අතර සම්බන්ධයක් තිබෙනවාද කියන සැකය ජනතාවට තිබෙනවා. එහෙම නැත්නම් මේ ආණ්ඩුව බලයට පත්වීම අරමුණු කරගෙන සිදුකළ කුමන්ත්‍රණයක්ද කියන සැකය ජනතාවට තිබෙනවා. කුමන්ත්‍රණකරුවන් කවුද කියලා අපෙන් අහන්න එපා. ආණ්ඩුවට තිබෙන බුද්ධි අංශ යොදවා එය හොයා ගැනීමේ වගකීම ඔවුන්ට තිබෙනවා. හරියටම පරීක්ෂණවල ප්‍රතිඵල රටට හෙළි නොකිරීමෙන් සැකයේ හස්තය ආණ්ඩුවට එල්ලවීම වළක්වන්න බැහැ.

කලින් සිටි ආණ්ඩුව ප්‍රහාරය වළක්වන්න අසමත්වීමේ වගකීම බාර ගන්න ඕනෑ. ඒ වගේම ප්‍රහාරය පිළිබඳව නිසි පරීක්ෂණ නොකිරීමේ වගකීම මේ ආණ්ඩුව බාරගන්න ඕනෑ. මේක සෙල්ලමක් නෙවෙයි. මිනිස් ජීවිත 300ක් පමණ අහිමිවීම, මානසික භීතියක් ඇතිවීම වගේම වර්තමාන ආණ්ඩුව මේ සිද්ධිය දේශපාලනයට යොදා ගෙන තිබෙනවා. ආණ්ඩුව වටේ ඉන්න අන්තවාදී කණ්ඩායම් ඒ දිනවල යොදාගත්තා. මේ නිසයි දඩයම කරේ තියාගෙන යන කෙනා දැක්කාම තුවක්කුව බැඳපු කෙනා හඳුනාගන්න පුළුවන් කියලා කතාවක් ඇතිවුණේ. දැන් වෙලා තියෙන්නේ ආණ්ඩුව මේ සැකය තව තවත් තහවුරු කිරීමයි.

මේ සැකය යොමුවීමට ආණ්ඩුව අකමැති නම් කළ යුත්තේ ඇත්ත වගකිවයුත්තා හේතු සහිතව ඉදිරිපත් කර ඔහුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමයි. නමුත් දැන් සිදුවී තිබෙන්නේ කල් මැරීම විතරයි. අවසානයේ වෙන්න පුළුවන් මිනිස් ඝාතන සිදු කළත් ඝාතකයෙක් නැති වීමයි. ඒ නිසා අපි ජනතාවට කියන්නේ මේ තුළින් පාඩම් ඉගෙනගන්න කියලා. මේ මැරුණේ රටේ පුරවැසියෝ. ශ්‍රී ලාංකික පුරවැසියන් රැසක් මරා දැමීම සම්බන්ධයෙන් ආණ්ඩුව මුනිවත රකිනවා නම් ඒකට කිසිම සමාවක් දෙන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි ආණ්ඩුවට බල කරන්නේ, ඉතා ඉක්මනින් නිසි පරීක්ෂණයක් කර වගකිවයුත්තන් හෙළි නොකරන්නේ නම් ආණ්ඩුව මේ වගකීම බාර ගත යුතුයි කියලා.

# විද්‍යාත්මක වැඩපිළිවෙළක් යටතේ වසංගතයට මුහුණදීමට රට සූදානම් කළ යුතුයි



**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික**
**වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**

ආණ්ඩුවට ජනතාවගේ ජීවිත වැදගත් නැති බවත් ඔවුන්ට වැදගත් ජීවිත ඇත්තේ ඇමරිකාවේ බවත් ඔවුන්ගේ ජීවිත ඇමරිකාවේ තබාගෙන ජනතාවගේ සහ ජනතාවගේ දරුවන්ගේ ජීවිත වෙනුවෙන් ඔවුන් තීරණ නොගන්නා බවත් ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, උද්දච්චකම් පසෙකට දමා සෞඛ්‍ය විශේෂඥයන්ගේ ඉල්ලීම් අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයට ප්‍රමුඛතාවය දෙමින් විද්‍යාත්මක වැඩපිළිවෙළක් යටතේ කොවිඩ් වසංගතයට මුහුණ දීම සඳහා රට සූදානම් කළ යුතු බවට ආණ්ඩුවට බල කර සිටියේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 19වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති ඔන්ලයින් මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ නලින්ද සහෝදරයා, මෙසේද ප්‍රකාශ කළේය.

"මේ රටේ ජනතාවගේ බදු මුදලින් නිදහස් අධ්‍යාපනය ලබා ඉහළට පැමිණි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, වසංගත රෝග ප්‍රධානී සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා යන තිදෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ ඉගෙන ගත්ත දේට ගරුත්වයක් දෙන්න කියලා. ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපෘතියට බොරු මතවාද පළ කරන යන්ත්‍ර බවට ඔබ පත්වෙන්න එපා. ඔවුන්ගේ කිළිටි වහන පිරුවට බවට පත්වෙන්න එපා. ඔබට ජනතාව වෙනුවෙන් වගකීමක් තියෙනවා. ඔබ අතට ලැබෙන නිවැරදි තොරතුරු ඔබ ජනතාවට කියන්න. ජනාධිපති ඉදිරියේ හෝ ජනාධිපති කාර්ය සාධක බලකාය ඉදිරියේ ඔබ නිහඬව ඉන්න බව අපි දන්නවා. ඒ නිහඬ වීමෙන් ජනතාවගේ ජීවිත එකිනෙක අහිමි වෙනවා. ඒ නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළම බලධාරීන් තිදෙනා ජනතාව ඉදිරියේ ඇත්ත කියන ලෙස ඉල්ලා සිටිනවා. ඔබ කොන්ද කෙලින් තියාගෙන ඇත්ත කීවොත් ජනතාවගේ ජීවිත බේරුවාය කියන තෘප්තිය ඔබට ඉතිරි වේවි.

ආණ්ඩුව මොනවා කළත් තමන්ගේ යුතුකම ඉටුකරමින් ඉන්න සියලුම සෞඛ්‍ය කාර්ය මණ්ඩලයෙන් අපි ඉල්ලා සිටින්නේ ජනතාවට ඇත්ත කියන ලෙසයි. ඔබ සඳහන් කරන ඇත්ත වෙනුවෙන් මාධ්‍ය ඕනෑ තරම් විවෘත වේවි. එතැනදී ආයතන සංග්‍රහයට හෝ වෙනත් නීතිවලට වඩා ජනතාවගේ ජීවිත බලගතුයි. ඇත්ත තොරතුරු එළියට දැමීමෙන් ජනතාව ස්වයංව සංවරණ සීමාවකට යනවා. ඒ වගේම බලධාරීන්ට ඇත්ත තොරතුරු මත මීට වඩා බල කරන්න පුළුවන්. ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින්නේ ඔබගේ දරු මුණුබුරන් මේ ලෝකයේ කොහේ ජීවත් වුණත් මේ රටේ ජනතාව වෙනුවෙන් ඔබට තිබෙන වගකීම ඉටුකරන ලෙසයි."

# ජනතාව ජීවත් කරවන අලුත් ජීවන දර්ශනයක් අවශ්‍යයි



**අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම්**
**සමන්මලී ගුණසිංහ සහෝදරිය**

පවතින නව ලිබරල් ආර්ථිකය තුළ අපේ රටේ සම්පත් විදේශ සමාගම්වලට දීමේ ප්‍රතිඵල ජනතාව විසින් අත්විඳිමින් සිටින බවත් මේ වන විට ආණ්ඩුවේ අසමත්භාවය කුස්සියෙනුත් පෙනෙමින් ඇති බවත් ළමුන්ට අධ්‍යාපනය අහිමිවී ඇති බවත් ගෘහනියට ලිප පත්තු කිරීමට ගෑස් නොමැතිවී ඇති බවත් කියා සිටි අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ ලේකම් සමන්මලී ගුණසිංහ සහෝදරිය, කාන්තාවන්ට පාරට බැස ගෑස් ඉල්ලීමට සිදුව තිබීමෙන් වත්මන් ආණ්ඩුව මුළුමනින්ම අසමත් බව පෙනී යන බැවින් ජනතාව ජීවත් කරවන අලුත් ජීවිත මොඩලයක්, ජීවන දර්ශනයක් රටට අවශ්‍ය වී තිබෙන බව පෙන්වා දුන්නාය.

සමන්මලී ගුණසිංහ සහෝදරිය මේ බව ප්‍රකාශ කළේ පසුගිය 11වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද ඔන්ලයින් මාධ්‍ය හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් පළ කළ ඇය මෙසේද කියා සිටියාය.

"අත්‍යවශ්‍ය භාණ්ඩ ඇතුළු එදිනෙදා ජීවිතයට අවශ්‍ය සියලුම භාණ්ඩවල මිල වේගයෙන් ඉහළ ගිහින් තිබෙනවා. කොරෝනා වසංගතයෙන් මරණ වරෙන්තුව අතේ තියාගෙන ඉන්න මොහොතේදී පවා අම්මලා කල්පනා කරන්නේ තමන්ගේ දරුවන්ට බතක් උයලා දෙන්නේ කොහොමද කියලා. මේ වෙලාවේදී ආණ්ඩුව අවශ්‍ය ගෑස් පවා ලබාදීමට අසමත් වෙලා. මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ ගෑස් සමාගම්වලට නෙවෙයි. ඇත්තටම දැන් තිබෙන්නේ ආණ්ඩුව සහ ගෑස් සමාගම් එකතුවෙන් නිර්මාණය කරගත් අර්බුදයක්.

**10 වැනි පිටුවට**

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.